රළ සමග

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 අගෝස්තු
23 වෙළුම 05 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"අවසාන විග්‍රහයේදී දේශපාලන නිදහස සහ පංති අරගලය පිළිබඳ මහා ප්‍රශ්න විසඳෙන්නේ බලය අනුවම පමණි. මෙම බලය සූදානම් කිරීම හා සංවිධානය කිරීමත්, ආරක්ෂාව සඳහා පමණක් නොව ප්‍රහාරය සඳහාද, එය ක්‍රියාශීලී ලෙස උපයෝගී කර ගැනීමත් අප සතු කාර්යය වන්නේය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**03වැනි වෙළුම,**
**28වැනි පිටුව**

## ජනපති පොරොන්දුව පුස්සක්

# විරෝධය නොසලකා වරාය බදු දෙයි

හම්බන්තොට වරාය නැව් තෙල් අංශය චීන සමාගමක් වෙත පැවරීමට එරෙහි ඛනිජ තෙල් සේවකින්ගේ වැඩවර්ජනය අවස්ථාවේ ජනාධිපතිවරයා සහ ඛනිජතෙල් වෘත්තීය සමිති නියෝජතයින් අතර පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයාගේ පාර්ශවයෙන් වරාය ගිවිසුම පසුගිය ජූලි 29 සෙනසුරාදා දින අත්සන් නොතබනු ඇති බවට දෙන ලද පොරොන්දුව කඩකරමින් එම ගිවිසුම අත්සන් තබා තිබේ.

හම්බන්තොට වරාය නැව් තෙල් අංශය සංස්ථාවට පැවරීම, චීන වරාය තෙල් ටැංකි සංස්ථාවට පැවරීම සහ සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම යන ඉල්ලීම් මුල්කරගනිමින් ඛනිජතෙල් වෘත්තීය සමිති විසින් වැඩවර්ජනයක් ආරම්භ කරන ලද්දේ පසුගිය 24වැනි දිනයේය. පසුගිය 26වැනි දින ජනාධිපතිවරයා සමග පැවති සාකච්ඡාවේදී අදාළ ගිවිසුම සංශෝධනය කිරීමට නියමිත බැවින් යොදාගත් දිනට අත්සන් නොතැබෙනු ඇති බව ප්‍රකාශ වී තිබිණි.

ජනතා විමුක්ති පෙරමුණ හම්බන්තොට වරාය පැවරීමට එරෙහිව සංවිධානය කරන ලද විරෝධතා උද්ඝෝෂණයක් පසුගිය 28වැනි දින අම්බන්තොටදී පැවැත්විණි. මෙම ගිවිසුම අත්සන් තැබීම, 1987දී කුප්‍රකට ඉන්දු - ලංකා රට පාවා දීමේ ගිවිසුම අත්සන් තැබුණු ජූලි 29වැනි දිනයේදීම සිදුවීම ඉතිහාසයේ සරදමකි.

ආණ්ඩුව පත්වී ඇති අර්ථික අර්බුදය හමුවේ දෛනික පැවැත්ම වෙනුවෙන් මුදල් සෙවීමට ආණ්ඩුවට සිදුව ඇති තත්වයක් යටතේ ජනතාව මත බර පැටවීමත් ජනතා විරෝධය නොසලකා **02 වැනි පිටුවට**




**05 ආණ්ඩුව, ආණ්ඩු විරෝධී**



දැන් ආණ්ඩුවට ජනතාවගේ හඬට ඇහුම්කන් දිය නොහැක. මන්ද දැනටමත් ආණ්ඩුව බහුජාතික...

**07 සමාජවාදය තුළ මානව හිමිකම්...**



මානව හිමිකම් කඩ කරන්නනේ යයි සමාජවාදයට චෝදනා කරන එක්සත් ජනපදය තුළ කළු සුදු භේදය....

**11 ඔබ සිතන්නේ හදවතින්ද?**



තමන්ට වාසනාව උදාකරගැනීමට අසමත් දිළින්දා අන් අයට වාසනාව විකිණීම තුළ වන ප්‍රතිවිරෝධය..

**12 ඩෙංගු: මරණය වෙනුවට...**



වසරේ ඇතැම් කාලවලදී ස්වාභාවික හේතු මත ඩෙංගු රෝග ව්‍යාප්තිය අඩුවේ. ඉන්පසු එම කාලවලදී...


සංවාදය.......................... 03
තරුණ............................ 04
ආවර්ජනා........................ 06
ජාත්‍යන්තර...................... 08
ආර්ථික.......................... 09
විශේෂ........................... 10
වේදිකාව......................... 13
විශේෂාංග........................ 14


*යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!*

# මැන්පවර් වහල් ක්‍රමය අහෝසි කිරීමට සේවක මධ්‍යස්ථානයක්




අන්තර් සමාගම් සේවක සංගමයේ විසින් මැන්වපර් වහල් ක්‍රමය අහෝසි කිරීමේ අරගලය සඳහා තීරණාත්මකව සටන් කිරීමට පිහිටුවා ගන්නා ලද 'මැන්පවර් වහල් ක්‍රමයට එරෙහි සේවක මධ්‍යස්ථානය' විසින් සිය ප්‍රථම මාධ්‍ය සාකච්ඡාව පසුගියදා කොළඹ සමාජ හා සාමයික කේන්ද්‍රයේදී පවත්වන ලදී.

අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් හා මැන්පවර් වහල් ක්‍රමයට එරෙහි සේවක මධ්‍යස්ථානයේ කැඳවුම්කරු නීතිඥ ජානක අධිකාරි සහෝදරයා එහිදී ප්‍රකාශ කොට සිටියේ, ලංකාවේ ඉහළම සිටින ප්‍රමුඛ සමාගම් සියය (100) සලකා බැලුවහොත් එයින් බහුතරයක්ම අද වන විට 'මැන්පවර්' සමාගම් මගින් තම ආයතනවල වැඩකටයුතු කිරීම දක්නට හැකි බවත්, සැබෑ හාම්පුතාගේ සේවකයෙකු ලෙස සේවය කරමින් රුපියල් ලක්ෂයක (100,000/=) වැටුපක් ලබා ගන්නේ නම් එම සේවයම මැන්පවර් මගින් බඳවා ගන්නා සේවකයෙකු ගෙන් රුපියල් තිස්දහසකට (30,000/=) පමණ ලබාගන්නා බවත්ය.

එමෙන්ම සේවකයන්ට වෘත්තීය සමිති ආඥා පනත මගින් හිමි වී ඇති සංවිධානය වීමේ අයිතිය මෙම මැන්පවර් ක්‍රමය මගින් සම්පූර්ණයෙන් ඵලරහිත බවට පත්කර ඇති බවද, රටේ සමාගම් පනත හා සෙසු කාර්මික ක්ෂෙත්‍රයේ අණපනත්වල පවතින දුර්වලතා හේතුවෙන් මෙවැනි ක්‍රම අනුගමනය කිරීමේ හැකියාව ලැබී තිබෙන බවද, පසුගිය ආණ්ඩුවේ කම්කරු ඇමති ගාමිණී ලොකුගේ යටතේද, වර්තමාන කම්කරු ඇමති ජෝන් සෙනෙවිරත්න යටතේද දිගින් දිගටම මෙම ක්‍රමය ක්‍රියාත්මක බවද ජානක සහෝදරයා විසින් අවධාරණය කරන ලදී.

# අධ්‍යාපනය විකිණීමට එරෙහි සටනට NTUC සමග FUTA ඒකාබද්ධ අරගලයකට

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජිතයින් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනයේ නියෝජිතයින් අතර ජුලි 23 විවෘත විශ්වවිද්‍යාලයේදී සාකච්ඡාවක් පැවති අතර එහිදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ මතුව ඇති බරපතළ ගැටලු ගණනාවක් හා සයිටම් අර්බුදය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබේ.

රජය පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් ගුරුවරු 5000ක් උපාධිධාරීන් ලෙස බඳවා ගැනීම, කොළඹ හා පේරාදෙණිය විශ්වවිද්‍යාල රජයේ පාලනයෙන් නිදහස් කිරීම, පාසල් පිරිවැය මධ්‍යස්ථාන ලෙස පරිවර්තනය කිරීම වැනි කරුණු මෙහිදී සාකච්ඡා කර ඇති අතර නිදහස් අධ්‍යාපනය කප්පාදුවට එරෙහි අරගලය ඉතා ශක්තිමත්ව ඉදිරියට ගෙන යාමටත් දෙපාර්ශවයම ඒකාබද්ධව සටන් කිරීමටත් එකඟව සාකච්ඡාව සාර්ථකව අවසන් වී තිබේ.


# ගුරුකම වෙනුවට වෙනත් රාජකාරී නිසා ඉගැන්වීමට බාධා - ගුරුවරුන්ගෙන් විරෝධය

ගුරුවරුන්ගේ ප්‍රධාන රාජකාරිය දරුවන්ට අධ්‍යාපනය ලබාදීම වුවද, එම සේවාවට අදාල නැති වෙනත් රාජකාරි ඔවුන්ගේ කර මත පැටවීමෙන් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පාසල තුළ හා පංති කාමරය තුළ කළ යුතු කාර්යභාරය ඉටු කිරීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බව ලංකා ගුරුසේවා සංගමයේ ආරංචි මාර්ග දක්වයි. සිසුන්ට බෙහෙත් දීම, වෙනත් විවිධ දෑ බෙදා දීම, විවිධ ව්‍යාපෘති සැකසීම හා වාර්තා පිළියෙල කිරීම, එකම තොරතුරු කිහිප වතාවක්ම අධ්‍යාපන බලධාරීන්ට ලබාදීමට සිදුවීම ආදී අදාළ නැති කාර්යයන් පැවරීම නිසා ගුරුවරයාට තම රාජකාරියට අදාළ ඉගැන්වීමේ කටයුතුවලට කාලය සොයා ගැනීමට නොහැකි තත්වයක් උදා වී තිබේ.

මෙය අධ්‍යාපන ඇමතිට හෝ බලධාරීන්ට තේරුම් ගැනීමට නොහැකි වීම ගැන කණගාටු වන බව පවසන ලංකා ගුරුසේවා සංගමය, ගුරුවරයාට අදාළ නැති මෙම විවිධ කාර්යයන් සඳහා අවශ්‍ය අමතර සේවකයින් බඳවා ගෙන ගුරුවරයා උගැන්වීමේ කටයුතුවලට නිදහස් කළ යුතු බවත්, සිසු දරුවාගේ අනාගතය නිර්මාණය කිරීමට ගුරුවරුන්ට ඉඩදිය යුතු බවත්, එසේ නොමැති වීම නිසා ගුරුවරුන් හා සිසුන් අතර සබඳතාවය බිඳ වැටී සිසුන්ගේ විනය පිරිහී යාම සමාජ ගැටලු රාශියකට මුහුන පෑමට සිදුවන බවත්ය.

එබැවින් මෙම තත්වය වෙනස් කර ගුරුවරුන්ට අදාළ සේවා වගකීම ඉටුකර ගැනීමට අවශ්‍ය පරිසරය සකස් කර ගැනීමේ නිදහස ගුරුවරුන්ට ලබාදීමේ අරමුණින් ගුරු-විදුහල්පතිවරුන් සමග අලුත් සටනක් ආරම්භ කිරීමට ලංකා ගුරුසේවා සංගමය තීරණය කර තිබේ.

# ලංගම ආරක්ෂාවත් පුද්ගලික අංශයට



ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පුද්ගලීකරණය කිරීම සඳහා පිඹුරුපත් සකස්කරමින් සිටින මුදල් අමාත්‍යාංශයේ උපදේශකයෙකු වන පාස්කරලිංගම් නැමැත්තා ඇතුළු කණ්ඩායමේ වුවමනාවට අනුව ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංගම ආරක්ෂක අංශයේ සේවකයන්වද ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා තිබේ. ආරක්ෂක අංශයේ සේවකයන් අලුතින් බඳවා ගැනීමට අවශ්‍යතාවය තිබියදී සේවකයන් විශ්‍රාම ගැන්වීම සඳහා අවශ්‍ය ඉඩකඩ සලසා ඇත්තේ ශ්‍රී ලංගම විනාශ කිරීමට බවට සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය චෝදනා කරයි.

ශ්‍රී ලංගම සේවය කරන සේවකයන් බලහත්කාරයෙන් ස්වෙච්ඡා විශ්‍රාම ගැන්වීමට සලස්වා එම පුරප්පාඩු වෙනුවට කොන්ත්‍රාත් පදනම යටතේ හෝ මැන් පවර් ක්‍රමවේදය යටතේ හෝ පුද්ගලික ආරක්ෂක සේවාවලින් සේවකයන් බඳවා ගැනීම තුළ ශ්‍රී ලංගමය පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය වෙනත් මුහුණවරකින් ක්‍රියාත්මක කිරීමට උත්සහ කරන බවද ඊට තම සංගමය දැඩි ලෙස විරෝධතාවය ප්‍රකාශ කරන බවද සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම් සේපාල ලියනගේ සහෝදරයා ප්‍රකාශ කර සිටී.

# එතෙරින්...

## ජ.වි.පෙ. හොංකොං ශාඛාව අරඹයි

ජනතා විමුක්ති පෙරමුණ පළමු වතාවට චීනයේ ස්වාධීන පාලන රාජ්‍යයක් වන හොංකොංහි තම දේශපාලන කටයුතු ආරම්භ කරමින් පසුගිය ජූලි මස 01වැනි දින හොංකොං වෙස්ටර්න් වීදියේ ප්‍රජා මධ්‍යස්ථාන ශාලාවේදී රැස්වීමක් පවත්වන ලදී. හොංකොංහි ජීවත්වන ශ්‍රී ලාංකිකයින්, මාධ්‍යවේදීන් මෙම රැස්වීමට සහභාගිවී සිටි අතර ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ප්‍රධාන දේශනය පැවැත්වීය. ඉදිරි දේශපාලන කටයුතු මෙහෙයවීම සඳහා සංවිධාන කමිටුවක්ද එහිදී පිහිටුවා ගනු ලැබීය.




## වසන්ත සමරසිංහ ජපානයේ ජ.වි.පෙ. රැස්වීමක

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වසන්ත සමරසිංහ සහෝදරයා පසුගියදා ජපානයේ නයෝගා සහ ටෝකියෝ නගරවල ජපානයේ ජ.වි.පෙ. කමිටුව සංවිධානය කළ රැස්වීම්වලට සහභාගි වූ අතර ටෝකියෝහිදී 'සයිටම්' විරෝධී උද්ඝෝෂණයකටද සහභාගි විය.




## එක්සත් රාජධානියේ සාර්ථක 'එතෙර අපි' සමුළුවක්

එතෙර අපි සංවිධානයේ එක්සත් රාජධානියේ විශේෂ මහා සමුළුව පසුගියදා ලන්ඩන්හි හීත්රෝ නොවාලේට් හෝටලයේදී 'එතෙර අපි' සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එයට ලන්ඩන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් විශාල ප්‍රමාණයක් සහභාගිවී සිටි අතර එංගලන්තයේ සිට ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ පුද්ගලයින් 6 දෙනෙකුට විශේෂ උපහාර දැක්වීමක්ද මෙහිදී සිදු කරන ලදී. එසේ උපහාර දැක්වීමට ලක්වූවන් අතර ප්‍රේමා ගනේගොඩ, පෝල් සත්‍යනේෂන්, වෛද්‍ය අක්රම් මහමුද්, මාධ්‍යවේදී දයා ආනන්ද රණසිංහ, සරත් අබේසුන්දර, ව්‍යාපාරික රන්ජන් අලහකෝන් ආදී විවිධ ක්ෂේත්‍රවලින් ලන්ඩනයේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට සේවයක් කළ පිරිස් වූහ.



මෙම අවස්ථාව එක්සත් රාජධානියේ හාරෝව්හි උප නගරාධිපතිනිය වන කරිමා මරික්කාර් මහත්මියද සහභාගි වූ අතර ඇයද ලංකාවේ ජාතික සමගිය වෙනුවෙන් 'එතෙර අපි' සංවිධානය සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් සිදු කරන මෙහෙවර අගය කරමින් කථාවක් පවත්වන ලදී.

## 'එතෙර අපි' කලා - ක්‍රීඩා වැඩසටහන් රැසක

'එතෙර අපි' සංවිධානය රටවල් රැසක තම ශාඛා සංවිධාන මගින් විදේශගත ශ්‍රී ලාංකිකයින් සඳහා කලා - සංස්කෘතික හා ක්‍රීඩා වැඩ සටහන් රැසක් සංවිධානය කර ඇත. ඉතාලියේ නාපොලි සංවිධානය විසින් වොලිබෝල් තරගාවලියක් සංවිධානය කළ අතර කැනඩාවේ 'එතෙර අපි' සංවිධානය ක්‍රිකට් කණ්ඩායමක් සකස් කර ඇත. එම ක්‍රිකට් කණ්ඩායම කැනඩාවේ ඇති අනිකුත් සංවිධාන සමග පසුගියදා සුහද ක්‍රිකට් තරඟයක්ද පවත්වා තිබේ. මීට අමතරව ඉතාලියේ රෝම ශාඛාව 2017 වසර සඳහා මහා සභා රැස්වීම පවත්වා ඇත්තේ එරට ශ්‍රී ලාංකිකයින්ගේ ගීත රසවින්දනය සඳහා ශ්‍රී ලාංකිය ගී රසවින්දන වැඩසටහනක්ද සමගය.




## ජනපති පොරොන්දු... මුල් පිටුවෙන්

ජාතික සම්පත් විකිණීමත් හැර වෙනත් විසඳුමක් පෙර පැවති සියලු ධනේශ්වර ආණ්ඩුවලට මෙන්ම වත්මන් ආණ්ඩුවටද නොමැත.

ඒ තත්වය තුළ ආණ්ඩුවට එරෙහි ජනතා විරෝධතා සමහන් කර ගැනීම වෙනුවෙන් ජනාධිපතිවරයා විසින් විවිධ පොරොන්දු ලබාදීම ඔහු විසින්ම තමන්ගේ ධුරය හෑල්ලු කර ගැනීමක් වන බව පවසන දේශපාලන විශ්ලේශකයින් විසින් පෙන්වා දෙන්නේ, මෙම තීරණ ආණ්ඩුවේ ප්‍රතිපත්ති සමග බැඳී ඇති බැවින් වත්මන් ආණ්ඩුවත් එය විසින් අනුගමනය කරන කොල්ලකාරී ආර්ථික රටාවත් පරාජය කිරීමෙන් තොරව මෙම ජනතා විරෝධී ක්‍රියාමාර්ග මුළුමනින්ම නතර කළ නොහැකි වනු ඇති බවය.

## නව දේශීය ආදායම් පනත... 16 පිටුවෙන්

ඔවුන් වගකිව යුත්තේ අපේ රටේ ජනතාවටයි. ඒ නිසා මේ පනත පරාජයට පත් කළ යුතු පනතක්. ඒ නිසා මේ පනත පරාජයට පත් කරන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම්. මේ බදු පනත අයවැය ලේඛනය ඉක්මවා යන පනතක්. ඒ නිසා මේ පිළිබඳව රටේ සංවාදයක් හදලා මේ පනත සම්මත නොකර අහෝසි කිරීමට අපි සියලු ක්‍රියාමාර්ග ගන්නවා."

මෙම අවස්ථාවට ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජිකයින් වන පළාත් සභා මන්ත්‍රී වසන්ත සමරසිංහ සහ පළාත් සභා මන්ත්‍රී නීතිඥ සුනිල් වටගල යන සහෝදරවරුද සහභාගි වූහ.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# මර්දනය විසඳුමක්ද?

වත්මන් මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුවේ ජනතා විරෝධී හා රටට හානිකර ආර්ථික හා දේශපාලන ක්‍රියාමාර්ගවලට එරෙහිව මේ වනවිට විවිධ ජන කණ්ඩායම්, රජයේ සේවකයින් හා විශ්වවිද්‍යාල සිසුන් විරෝධතා ක්‍රියාමාර්ග රැසක් දියත්කර තිබේ. එම විරෝධතාවලට හා උද්ඝෝෂණවලට පදනම්ව ඇත්තේ, හුදු පෞද්ගලික කාරණා නොව රටටත් ජනතාවටත් බලපාන පොදු කාරණාය. ඒ නිසාම එම සටන් ඉතාම සාධාරණ සටන්ය.

ඉතාම සාධාරණ එම ජනතා සටන්වලට ඇහුම්කන්දී ඒවා විසඳීමට පියවර ගන්නවා වෙනුවට වත්මන් බංකොලොත් හා දුර්වල හවුල් ආණ්ඩුව කටයුතු කරමින් සිටින්නේ, සටන් කරන බලවේග වෙත මර්දනය කැඳවා ඔවුන් බියට පත්කර සටන් දුර්වල කිරීමටය. උසාවි නියෝග ගැනීම, කඳුළු ගෑස් හා බැටන් ප්‍රහාරවල සිට හමුදාව හා පොලිසිය යොදවා සටන් මර්දනය කිරීමටත් අත්අඩංගුවට ගැනීම් සිදුකිරීමත් මේ වනවිට ආණ්ඩුව කටයුතු කර තිබේ. මෙය ඉතා බරපතළ තත්වයකි.

ලංකාවේ අතීතයේ පැවැති සෑම බංකොලොත් ධනපති ආණ්ඩුවක්ම තම පාලනය අවසන් කරගනු ලැබුවේ ජනතා සටන් මර්දනය ඇරඹීම තුළිනි. ලංකාවේ මෙතෙක් බිහිවූ දුර්වලම ආණ්ඩුව වන මෙම ආණ්ඩුවද මර්දනයේ 'විසඳුම' අනුගමනය කිරීම ආණ්ඩුවේ ආයුෂ වැඩි ඈතක නොවන බව පෙන්වීමකි.

පසුගිය කාලයේ නිදහස් අධ්‍යාපනයේ අයිතිය වෙනුවෙන් 'සයිටම්' වසා දමන ලෙස බලකරමින් විශ්වවිද්‍යාල සිසුන් හා ඔවුන්ගේ දෙමාපියන් පැවැත්වූ විරෝධතා පාගමන් කිහිපයකටම ආණ්ඩුව පොලිසිය යොදා අමානුෂික ලෙස පහරදුන් අතර පොදු දේපළවලට හානි කළේයැයි පවසා ශිෂ්‍ය නායකයන් රැසක්ද අත්අඩංගුවට ගත්තේය. ලංකාවේ මහජන දේපළ කෝටි ගණනින් විනාශ කළ හා හොරකම් කළ හොරුන් එළියේ නිදහසේ සිටියදී සාධාරණ අයිතීන් වෙනුවෙන් සටන් කරන අය පොදු දේපළ පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇප ලබානොදී රඳවා තැබීම හාස්‍යජනකය.

එලෙස උද්ඝෝෂණවලට පහර දෙමින් අත්අඩංගුවට ගනිමින් ආ ආණ්ඩුවේ මර්දන ක්‍රියාවලිය පසුගියදා පැවති තෙල් සේවක වැඩවර්ජනයත් සමග තවත් ඉදිරියට ගොස් හමුදා මැදිහත්වීමක් දක්වා වර්ධනය විය. ආණ්ඩුව අත්‍යාවශ්‍ය සේවා නීතිය ගැසට් කොට තෙල් බෙදාහැරීම අත්‍යාවශ්‍ය සේවාවක් කර සේවයට වාර්තා නොකරන සේවකයින් සේවය හැරගියාසේ සලකන බව පවසා හමුදාව හා පොලීසිය තෙල් බෙදාහැරීමේ මධ්‍යස්ථානවලට යොදවා සේවකයින්ට මැර ප්‍රහාරද එල්ල කොට ඔවුන් අත්අඩංගුවටද ගත්තේය.

ඉතිහාසයේ 1980 ජූලි වර්ජනය මර්දනය කිරීමට ජේ. ආර්. ජයවර්ධනත් චන්ද්‍රිකා පාලන සමය තුළ විදුලි වර්ජනය මර්දනය කිරීමට චන්ද්‍රිකා කුමාරතුංගත් මෙම නීතිය පාවිච්චි කළේය. ඒ අනුව දැන් යළිත් අගමැති රනිල් තම මාමාගේ අඩිපාරෙත් ජනාධිපති මෛත්‍රී තම හිටපු නායිකා චන්ද්‍රිකාගේ පාරේත් යාමට පටන්ගෙන තිබෙන බව පෙනේ.

පසුගිය මහින්ද රාජපක්ෂ පාලන සමය තුළ තම අයිතිවාසිකම් වෙනුවෙන් උද්ඝෝෂණය කළ කටුනායක වෙළඳකලාපයේ රෝෂාන් චානකත්, හලාවත ධීවරයෙක් වූ ඇන්තනීත්, රතුපස්වල වතුර ඉල්ලා උද්ඝෝෂණය කළ තිදෙනෙකුත් වෙඩිතබා මරා දැම්ණි. එවැනි මර්දනයන් නතරකරන බවටත් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන බවටත් පොරොන්දු දී බලයට පත් ඊනියා යහපාලනයද බැරි මරගාතේ වුවද ජනතාවට එරෙහි මර්දනයේ හස්තය එසවීම මගින් පෙන්නුම් කරන්නේ කුමක්ද? ඒ, අන්කිසිවක් නොව ආණ්ඩුව කුමක් වුවත් එය ධනපති ආණ්ඩුවක් නම් අර්බුදය හමුවේ ඊට ඇති එකම විසඳුම ජනතාව මර්දනය කිරීම පමණක් බවය.

උසාවි නියෝගවලින්, ජල ප්‍රහාරවලින් පටන් ගත් මර්දනය දැන් මැර ප්‍රහාර හා හමුදා මැදිහත් කිරීම් දක්වාත් වර්ධනය වී තිබේ නම් එය වහාම නතරකිරීම සඳහා මැදිහත්වීම ප්‍රජාතන්ත්‍රවාදය අගයන සැමගේ වගකීම වී තිබේ. ආණ්ඩුව ජනවරමට මෙන්ම ජන මතයටද ගරු කළ යුතු අතර උද්ඝෝෂණ කරන ජනතා බලවේග වෙත මර්දනය මුදාහැරීම වහාම නතර කළ යුතුය. මර්දනය නවතා ජනතා ගැටලුවලට අවධානය යොමුකර ඒවාට සාධාරණ විසඳුම් ලබාදෙන ලෙසත් වරාය තෙල් ටැංකි ඇතුළු රටේ වටිනාම සම්පත් විකිණීම නතරකරන ලෙසත් සයිටම් වසාදමන ලෙසත් ආණ්ඩුවට බල කළ යුතුය. ආණ්ඩුව ඊට ඇහුම්කන් නොදෙන්නේ නම් සියලු ධනපති ආණ්ඩුවල පොදු ක්‍රියාමාර්ගය ජනතා මර්දනය බව තේරුම් ගනිමින් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ධනපති පාලනය නිමා කිරීමේ සටන සඳහා සියලු බලවේග පෙළගැස්විය යුතුය. ඒ, රාජපක්ෂවරුන්ගේ මර්දන උපයෝගි කරගෙන මෛත්‍රී - රනිල් බලයට පත්වීමත් යළි වත්මන් පාලනයේ මර්දනයට එරෙහි බව පවසා නැවත අනෙක් ධනපති කල්ලිය බලයට ඒමට කැස කැවීමත් වැනි විගඩම්වලට නැවත ඉඩ නොදිය යුතු නිසාය.

# දූෂිතයන්ට දඬුවම් ලබාදිය හැක්කේ වීර්යසම්පන්න පාලනයකට පමණයි



## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා

***නියමුවා:-*** *පසුගියද දිනවල පැවති නව ව්‍යවස්ථාව පිළිබඳ සාකච්ඡා යටපත් කරමින් නව ව්‍යවස්ථාවක් අනවශ්‍ය බවට මතයක් පළවුණා. 78 ව්‍යවස්ථාවට ආරම්භයේ සිටම විරුද්ධත්වය පළ කළ ජ.වි.පෙ. මේ පිළිබඳව දරන අදහස කුමක්ද?*

*අනුර දිසානායක සහෝදරයා:-* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කවර හෝ රටක පවතින, අනුගමනය කරන සමාජ ආර්ථික ක්‍රමවේදයට ලබාදෙන නීතිමය රැකවරණයයි. ඒ නිසා තමයි ලෝකයේ බොහෝ රටවල එක් සමාජ ක්‍රමයක සිට තවත් සමාජ ක්‍රමයක් දක්වා පරිවර්තනය වීමේදී ඊට අවශ්‍යවන නීතිමය රැකවරණය ලෙස ව්‍යවස්ථාවක් සකස් කරනවා. රුසියානු විප්ලවය 1917 සිදුවූවාට පසුව 1918 රුසියාවට නව ව්‍යවස්ථාවක් ගෙනඑනවා. 1949 චීන විප්ලවයෙන් පසුව 1950 දී චීනයට නව ව්‍යවස්ථාවක් ගෙනඑනවා. මේ විදියටම කියුබානු විප්ලවයෙන් වසරකට පසුව කියුබාවට නව ව්‍යවස්ථාවක් ගෙන එනවා. ඒ අනුව ලංකාවේ පවතින්නේ, ධනපති ආණ්ඩු ක්‍රමයක්. එනිසා ඒ ගොඩනැගෙන ව්‍යවස්ථාව ධනපති ව්‍යවස්ථාවක්. 1972 ව්‍යවස්ථාව වේවා, 1978 ව්‍යවස්ථාව වේවා සාකච්ඡා වෙමින් තිබෙන නව ව්‍යවස්ථාව වේවා මේ සෑම ව්‍යවස්ථාවක්ම සකස් වෙන්නේ, ලංකාවේ පවතින ධනපති සමාජ ක්‍රමයේ ආරක්ෂක ලියවිල්ල ලෙසයි.

දැනට අපේ රටේ භාවිතයට නඟමින් තිබෙන 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා දහනම වතාවක් සංශෝධනය වෙලා තියෙනවා. මේ දහනම වතාවෙන් අවස්ථා 02ක් හැරුණු කොට අනික් සියලු අවස්ථා බලයේ පවතින පක්ෂයේ බලය ආරක්ෂා කරගැනීම වෙනුවෙන්, බලය ශක්තිමත් කරගැනීම වෙනුවෙන් තමයි එම ව්‍යවස්ථා සංශෝධනය කර තිබෙන්නේ. එනිසා මෙම ව්‍යවස්ථාව 1978 සිට දහනම වතාවක් සංශෝධනය වෙලා, විකෘතිභාවයට පත්වෙලා තිබෙනවා. ඒ නිසා අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට පිළිගන්නවා. මෙම ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් ලැබිය යුතු බව. නමුත් එය මේ පවතින සමාජ ආර්ථිකයේ ධනපති ක්‍රමයක් නම් ඒ ධනපති ක්‍රමයේ ආරක්ෂාව ලෙස තමයි ඒ ව්‍යවස්ථාව ගොඩනැගෙන්නේ. නමුත් අපි ධනේශ්වර ප්‍රතිසංස්කරණ බැහැර කරන දේශපාලන ව්‍යාපාරයක් නොවේ. ඒ නිසා මේ ගොඩනැගෙන ව්‍යවස්ථාව ඇතුළේ ධනේශ්වර ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ ඇතුළත් කරගන්න පුළුවන්නම්, ඒ සඳහා අපි උත්සාහයක් දරනවා. එනිසා මූලික ලෙසම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස්විය යුතුය කියන ස්ථාවරයේ අපි සිටිනවා.

මේ සාකච්ඡා වෙමින් තිබෙන නව ව්‍යවස්ථාව ප්‍රධාන කරුණු 03ක් කේන්ද්‍රගත වෙනවා. පළමුකොටම ඡන්ද ක්‍රමය, විධායක ජනාධිපති ක්‍රමය හා බලය බෙදීම පිළිබඳ සාකච්ඡාවකට බඳුන්වෙමින් තිබෙනවා. මෙහිදී ඉතා වැදගත් ක්ෂේත්‍ර බවට පත් වෙන්නේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, ඡන්ද ක්‍රමයේ යම් වෙනසක් කිරීම හා බලය බෙදීමයි. මෙතෙක් සෑම ව්‍යවස්ථාවකටම වඩා මෙම ව්‍යවස්ථාව සම්මත කරගැනීමේදී විශේෂ අවස්ථාවක් තිබෙනවා. මීට පෙර තිබුණු සෑම ව්‍යවස්ථාවක්ම සම්මත කර ගැනීම සඳහා අවස්ථාව ලැබුණේ, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් එම තුනෙන් දෙකේ බලය තිබුණු පාර්ලිමේන්තුවටයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් හයෙන් පහක බලයක් තිබූ පාර්ලිමේන්තුවටයි. නමුත් මෙම ව්‍යවස්ථාව පැහැදිලි ලෙසම ජනතාවගේ ජනමත විචාරණයකින් තොරව සම්මත කර ගැනීමේ හැකියාවක් නැහැ. ඒ නිසා මෙම ව්‍යවස්ථාව පිළිබඳ කවර හෝ සාකච්ඡාවක් එම ජනමත විචාරණයේදී ජනතාවත් සමඟ කළ හැකිය යන විශ්වාසයෙන් අපි සිටිනවා.

***නියමුවා:- වත්මන් ආණ්ඩුව බලයට පත්වීමේදී ජාතිවාදයට එරෙහි ජනමතයක් ප්‍රකාශයට පත්වී තිබියෙදී ආණ්ඩුව තුළින්මත් ඊට පිටතිනුත් ජාතිවාදය නැවතත් හිස ඔසවමින් තිබෙනවා. මෙම තත්වයට හේතුව?***

*අනුර දිසානායක සහෝදරයා:-* විශේෂයෙන් මේ පවතින පාලනයන් සහ පාලකයන් තමන්ගේ බලය ආරක්ෂා කර ගැනීම සඳහා සකස් කොට තිබෙන ක්‍රමවේදය තමා ජනතාව එකිනෙකාට එරෙහිව භේදභින්න කිරීම. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අපේ රට පාලනය කිරීමේදී ඔවුන්ගේ ක්‍රියාමාර්ගය බවට පත්වුණේත් මේ බෙදා වෙන්කිරීමේ උපක්‍රමයයි. 1948 පසු අපේ රටේ ගොඩනැගුණු පාලනයන් පවා උත්සාහ කරමින් තිබෙන්නේ සිංහල, දෙමළ, මුස්ලිම්

> "මේ ඇතිවෙමින් තිබෙන දේශපාලන රික්තකය පිරවීම සඳහා ජාතිවාදී කඳවුරක් නිර්මාණය කරන්න ඔවුන් උත්සාහ කරමින් සිටිනවා. එය අතිශය බිහිසුණු සහ අපරාධකාරී කඳවුරක්. ඒ නිසා මේ ඇතිවී තිබෙන දේශපාලන හිදැස, කිසිසේත්ම ජාතිවාදී කඳවුරකට පිරවීමට ඉඩනොදී යහපත් දේශපාලනයක් සඳහා වූ කඳවුරකින් පිරවිය යුතුව තිබෙනවා."

ජාතිකයන් අතර ජාතික සමගිය ගොඩනගමින්, එක් ලාංකේය ජාතියක් ගොඩනගිමින්, පාලනය ගෙනයන දිසාවකට නෙමෙයි. ඒ නිසා ඔවුන් හැමවිටම සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව බෙදා වෙන්කිරීම, ඔවුනොවුන් අතර සැකය ඇතිකිරීම, ඔවුනොවුන් අතර ගැටුම් නිර්මාණය කිරීම, අවසානයේ දැවැන්ත යුද්ධයක් නිර්මාණය කිරීම දක්වා මේ පාලකයන් කටයුතු කර තිබෙනවා. එනිසා සෑමවිටම මේ පාලකයන්ට කුමන හෝ ජාතිවාදයක සරණයාම හෝ කවර හෝ ජාතිවාදයක් පෝෂණය කිරීම අත්‍යාවශ්‍ය වී තිබෙනවා. එනිසා කිසිසේත්ම මේ පාලකයන් ජාතිවාදයට එරෙහිව ජාතික සමගිය ගොඩනගන්න උත්සාහ කරන්නේ නැහැ.

පැවති රාජපක්ෂ පාලනයත් තමන්ගේ පැවැත්මේ මූලික සාධකය බවට පත්කර ගත්තේ, මේ ජාතිවාදයයි. වර්තමාන පාලනයත් ඉතාමත් අවබෝධයෙන් යුතුව මේ විවිධ වර්ගයේ ජාතිවාදී ප්‍රවණතාවයන් වර්ධනය වන්නට ඉඩහැර තිබෙනවා. මෙම පාලකයන්ට ඔවුන් අනුගමනය කරමින් තිබෙන සමාජ ආර්ථික ප්‍රතිපත්තියට එරෙහිව ජනතාව පෙළගැසෙනවා වෙනුවට සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා එකිනෙකාට සැකයෙන්, අවිශ්වාසයෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් බලන සමාජයක් ඔවුන්ට අවශ්‍යවී තිබෙනවා. ඒ නිසා තමයි බලය ගැනීමේදී ජාතිවාදයට එරෙහිව මතයක් ගොඩනගා තිබුණත් බලය පවත්වාගෙන යාමේදී ඔවුන්ට ජාතික සමගිය වෙනුවට ජාතිවාදය අවශ්‍යවී තිබෙනවා. එය තමයි මේ මොහොත වනවිට විවිධ ස්ථානවල මේ ඇතිවී තිබෙන ජාතිවාදී ප්‍රවණතාවයන් මගින් සහ ඒවා වර්ධනය කිරීමට ආණ්ඩුව රැකවරණය සහ ආරක්ෂාව ලබාදීමේ තත්වයක් මගින් පෙන්නුම් කරමින් තිබෙන්නේ.

***නියමුවා:- ආණ්ඩුව චෝදනා එල්ල කරමින් දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය අහෝසි***

**15 වැනි පිටුවට**



# YES WE CAN

## මතුවෙමින් ඇති ජාතිවාදී අඳුරු සෙවනැලි මකා දමමු!

තවත් එක් ජූලි මාසයක් ගෙවීගොස් අවසන්ය. ගෙවීගිය ජූලි මාසයේදීද ජාතිවාදී අදහස් නැවත වටයකින් හිස ඔසවා ජාතිවාදයේ අඳුරු සෙවනැලි පැතිරෙමින් තිබෙනු දැකිය හැකිවිය. ඉතිහාසයේ ඒ අඳුරු ''කළු ජූලිය'' සිදුව දැනට වසර 34 ක් ඉක්ම ගොස්ය. එවකට පැවති එ.ජා.ප. ආණ්ඩුව තම දේශපාලන පැවැත්ම වෙනුවෙන් එම ''කළු ජූලිය'' නිර්මාණය නිර්මාණය කළේය. එහි ගොදුරු බවට පත්ව සිංහල, දෙමළ ලාංකේය ජනයා දහස් ගණනින් සිය ජීවිත වලින් වන්දි ගෙවුහ. 1983 දී ඇති කළ එම ඛේදනීය සිදුවීමේ මතකය අදටද ලාංකේය සමාජය මතින් මුළුමනින්ම පහව ගොස් නැත. අප රටේ කලක පටන් සිංහල, දෙමළ ජාතිකත්වයන් අතර පැවති සංහිඳියාව ජාතිවාදී යුද්ධයක් දක්වා වර්ධනය කළේ ඉහත සිදුවීම යන්න කවුරුත් දන්නා කරුණකි. එය අවසන් වූයේ, සමස්ත සමාජය පුරා භීතිය වපුරමින්, මිනිස් බෝම්බ රටපුරා පුපුරායන යුගයක් නිර්මාණය කරමින්ය. එබැවින් එවන් වටපිටාවක් යළි කෙදිනකවත් ලාංකේය සමාජය බලාපොරොත්තු වන්නේ නැත.


අද දවසේ ධනපති ක්‍රමය වඩාත් අර්බුදයට ගොස් රට තුළ වැඩකරන ජනතාවගේ මෙන්ම ශිෂ්‍ය, තරුණ ප්‍රජාවන්ගේ ප්‍රශ්නවලට විසඳුම් දීමට පවතින ආණ්ඩුව අසමත්ව ඇත. එම නිසාම මෑත කාලීනව විවිධ නම් වලින් මතුවෙමින් ඇති සිංහල ජාතිවාදී ප්‍රවණතාවයන් පිටුපසද මුස්ලිම් මෙන්ම උතුරේ දෙමළ ජාතිවාදී ප්‍රවණතාවයන් පිටුපසද ධනපති දේශපාලනඥයින් සිටගැනීම මෙකී දේශපාලනයට අනුව අනිවාර්යයකි. ඉතිහාසයේ පටන් විවිධ ජාතිවාදී ගිනි ඇවිළවීම් පිටුපස ධනපති දේශපාලනඥයින් සිටියද, ඒවාට ගොදුරුව පීඩාවට ලක්වූයේ රටේ සාමාන්‍ය ජනතාවයි. මෙකී තත්වය තේරුම් ගැනීමට ප්‍රමාදවීම අද දවසේ අප මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුවය. තවද කුමන ජාතිකත්වයක වුවද තරුණ ප්‍රජාව මෙකී ජාතිවාදී ප්‍රවණතාවන්ගේ ගොදුරු බවට පත්වන වග ඉතිහාසය විසින් අපට පෙන්වාදී ඇත. වර්තමානයේදීද තත්වය එයම බව ජනමාධ්‍ය වාර්තා අපට පෙන්වාදෙයි.

දැනටද අප රටේ බොහෝ තැන්වල සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා එක්ව සහයෝගයෙන් ජීවත්වෙයි. ජීවත්වීමේදී එක හා සමාන දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් ඇති නිසාම, තමන්ට මුහුණදීමට සිදුව ඇති පොදු දුෂ්කරතාවන්හිදී එක්ව කටයුතු කරයි. එක්ව අරගල කරයි. එමගින් ගොඩනැගෙන අන්‍යෝන්‍ය සුහදතාවය හැම දෙනාටම එකලෙස වාසි අත්කර දෙයි. සමාජයේ බහුතර පිරිසකගේ අත්දැකීම මෙයයි. නමුදු රටතුළ විටින් විට පැනනගින ජාතිවාදී බොරු ප්‍රචාරයන්ට නතුවන ඇතැම් කොටස් ඉහත තමන් අත්දකින යථාර්ථය අමතක කොට සහෝදර ජනයා සමග ජාතිවාදී ගැටුමකට එළැඹෙණි. වර්තමානයේ අප අත්දකින ජාතිවාදී අඳුරු සෙවනැලිවල යථාර්ථය මෙයයි. එබැවින් තරුණ ප්‍රජාවක් ලෙස අප සමාජය අත්දකින මෙම ඛේදනීය තත්වයෙන් වහා මිදිය යුතු වන්නෙමු. ඒ සඳහා සමාජය වඩ වඩාත් දැනුවත් කිරීමත් සංවිධානය කිරීමත් කළ යුතු වන්නෙමු. එතකින් පමණක් ජාතිවාදී අඳුරු සෙවනැළි මකාදැමිය හැකිවනු ඇත.

## සහෝදරත්වයේ මෙහෙයුම


සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කරන සහෝදරත්වයේ දිනය මෙවර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දී ජූලි 21 හා 23 දිනයන් හි පැවැත්විණි. ඒ ජූලි 21 හා 22 එම දිස්ත්‍රික්කයේ ගල්කඩවල, අව්වේ නගර්, මූතූර් නැගනහිර, විලාන් කුලම් යන ගම්මානවල දීය. මෙහිදී වෛද්‍ය සායන, ඩෙංගු මර්දන වැඩසටහන්, චිත්‍ර වැඩමුළු, පාසල් හා පෙර පාසල් සිසු සිසුවියන්ට උපකරණ ලබාදීම, සංස්කෘතික වැඩසටහන් හා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විණි. ජූලි 23 දින ත්‍රිකුණාමලය නගරයේ සහෝදරත්වයේ පාගමනක් සංවිධානය කරන ලද අතර ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස, පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරවරු හා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ඇතුළු සමාජවාදී තරුණ සංගමයේ සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගී වූහ.



*ඔබ සැබෑ මිනිසෙකුනම් තවත් මිනිසෙකුගේ කම්මුලට අතුල් පහරක් වදිනු දකින ඔබටද ඒ අතුල් පහරේ කම්පනය දැනිය යුතුය*

*ජොසේ මාටි*



## තරුණ

## උස්ව ගොඩනැගෙන ජන පවුර

මුදලට වෛද්‍ය උපාධිය විකුණන මාලබේ සයිටම් ආයතනයට එරෙහිව රට පුරා විශාල ජන පවුරක් ගොඩනැගී ඇත්තේය. මෑත ඉතිහාසයේ අන් කවරදාකත් සිදු නොවූවිරූ අයුරින් වෛද්‍යවරු, ශිෂ්‍යයින්, ගුරුවරුන්, කලාකරුවන්, විද්වතුන් හා වෘත්තිකයින් මෙන්ම සුවහසක් වූ තරුණ තරුණියන් ඇතුළු සාතිශය බහුතරයක් වූ පොදු මහජනයා විසින් එකී පවුර ශක්තිමත්ව බැඳ ඇත. ඉදින් මෙතැන් පටන් ඔවුන් එකාවන්ව එක් අරගලයක්, එක් සටනක් වෙනුවෙන් එකට වෙහෙසෙනු ඇත්තේය. සටන ඇත්තේ නිදහස් අධ්‍යාපන අයිතිය සුරැකීම වෙනුවෙනි. එසේම එය මෙරට නිදහස් සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය වෙනුවෙනි.

ඇත්තෙන්ම සියල්ල අවසන ඒ සටන දියත් කෙරෙනු ඇත්තේ, අප සියලු දෙනා නියෝජනය කරන පොදු සමාජය වෙනුවෙනි. ඒ නිසාවෙන්ම තවදුරටත් වෙන් වෙන්ව කළ හැකි සටනක් අප ඉදිරියේ නොමැත. එහෙයින් දැන් අපට වෙනදාටත් වඩා ශක්තිමත්ව හා වඩාත් වැඩි විශ්වාසයකින් යුක්තව සටන් කිරීමේ හැකියාවක් ඇත්තේය.

පාලකයින්ගේ අණට ක්‍රියාත්මක වන තුවක්කු බට, බැටන් පොලු හා ජල ප්‍රහාර එකී අරගලය හමුවේ මෙරට නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රාර්ථනාවක් හෝ සහිත සියලු ඔළුගෙඩි වෙත එල්ල වීමට ඕනෑම අයුරකින් ඉඩකඩ පවතී. එහෙත් අප සියලු දෙනා එක් වී ගොඩනැගූ මේ ශක්තිමත් පවුර බිඳ දමා අධ්‍යාපනය බිල්ලට ගැනීමට ඒ එකදු මූනිස්සමක් හෝ සමත් නොවනු ඇත.

ඉදින් ආණ්ඩුවේ උන්මත්තකවාදී හැසිරීම් පිළිබඳව අප අමුතුවෙන් පුදුම විය යුතු නැත. කිසිදු මහජන පීඩාවකින් තොරව ඉතා සාමකාමී ලෙස ලිප්ටන් වටරවුමේ සත්‍යග්‍රහයක යෙදී සිටි වෛද්‍ය සිසුන් වෙත ආණ්ඩුව ප්‍රහාර එල්ල කර මර්දනය දියත් කළේ ඒ අනුවය. රටේ සාධාරණ අරගල ඉදිරියේ තුවක්කු මානමින් මහා පරිමාණ වංචනිකයින් හා දූෂිතයින් රැකුමට පාලකයින් කටයුතු කරන්නේ තමන්ව ඡන්දයෙන් පත් කළ ජනතාවට ටොකු ඇන ගැනීමට සලස්වමිනි.

කෙසේ වුවද සයිටම් විරෝධී අරගලය එසේ මෙල්ල කළ නොහැකි බව ආණ්ඩුව තේරුම් ගත යුතුය. එය තවදුරටත් හුදෙකලා සටනක් නොව, පොදු මහජනයාගේ හදගැස්ම හා බැඳුණු, පුළුල් බලවේගයන් එකට ඒකරාශී කළ ජනතා සටනක් වී හමාරය. එහෙයින් හෙට දවසේ අපේ රටේ සුවහසක් වූ දුවාදරුවන්ගේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන් හා කොන්දේසි විරහිතව සයිටම් හොර උපාධි කඩය අහෝසි කරවීම වෙනුවෙන් අරගල කරන සයිටම් විරෝධී ජන පවුර හෙටත් තව තවත් උස්ව නැගී සිටිනු ඇත.

# ආණ්ඩු විරෝධී අරගල හා ජනතාව




වත්මන් මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුවට එරෙහිව මේ වන විට විරෝධතා අරගල රැල්ලක් මතුව තිබේ. එක් පසෙක නිදහස් අධ්‍යාපනය අහෝසිකිරීමට එරෙහිව මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වසාදමන ලෙස ඉල්ලා කරන සයිටම් විරෝධි අරගලයය. අනෙක් පස වගා වන්දි ඉල්ලා, කිරි මිලදී ගන්නා ලෙස ඉල්ලා, තම අස්වැන්නට සාධාරණ මිලක් ඉල්ලා කරන ගොවි සටන්ය. තවත් පසෙක ත්‍රිමලේ තෙල් ටැංකි විකිණීමට, හම්බන්තොට වරාය හා තෙල් ටැංකි විකිණීමට එරෙහිව සිදුකරන තෙල් සංස්ථා සේවක සටන් හා වරාය සේවකයින්ගේ සටන්ය. තවත් පසෙක උමාඔය බහු විනාශකාරි ව්‍යාපෘතියට එරෙහිව කෙරෙන ජනතා සටනය. එසේම ඌව වෙල්ලස්සේ ඉඩම් අක්කර 62,000ක් පමණ විදේශ සමාගමකට උක්වගාව සඳහා ලබාදීමට එරෙහි සටනය. මෙලෙස ගත් විට රට පුරා ආණ්ඩුවට එරෙහිව සටන් රැල්ලක් නිර්මාණය වී තිබේ.

මෙම සටන් දිගින් දිගට පවතින්නේ ඇයි? මීට පෙර පැවති සන්ධාන ආණ්ඩුව මෙන්ම වත්මන් හවුල් ආණ්ඩුවද ජනතා ප්‍රශ්න, ගැටලු විසඳීමට අසමත්ය. මෙම සටන්වලට පාදකවී තිබෙන ගැටලු විසඳීමට ආණ්ඩුව සූදානම් නැත. ඒ, එම ගැටලු ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය හා බැඳී තිබෙන නිසාය. වර්තමාන ලංකාව විශාල මූල්‍ය අර්බුදයකට මුහුණදී සිටී. ලංකාව ඉන් මුදාගැනීම සඳහා සැබෑ විද්‍යාත්මක වැඩපිළිවෙළක් වත්මන් ආණ්ඩුව සතුව නැත. වත්මන් ආණ්ඩුවට පමණක් නොව කිසිදු ධනපති ආණ්ඩුවකට ධනවාදයේ අර්බුදයට සැබෑ විසඳුම් නැත. නව ලිබරල්වාදී චින්තනයට අනුව සිතන ආණ්ඩුවට මේ සඳහා ඇති විසඳුම් වන්නේ, හැකි තරම් විදේශ ණය ගැනීම, ජනතාවගේ සහන හා සේවා කප්පාදු කිරීම, ජනතාව මත බදුබර පැටවීම හා රටේ සම්පත් විකුණාගෙන කෑමය. ඉහත ආණ්ඩු විරෝධී සටන් සියල්ලම පදනම්ව ඇත්තේ, මෙම ක්‍රියාමාර්ගවලට එරෙහිවය. දැන් ආණ්ඩුවට ජනතාවගේ හඬට ඇහුම්කන් දිය නොහැක. මන්ද දැනටමත් ආණ්ඩුව බහුජාතික සමාගම්වල හඬටත් ජාවාරම්කාරයින්ගේ හඬටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හඬටත් ඇහුම්කන්දී ඒ අනුව වැඩකරන නිසාය. එබැවින් ආණ්ඩුවට එරෙහිව සටන්කරන බලවේග දැන් සටන් කරමින් සිටින්නේ සරල කරුණු සඳහා නොව ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා බැඳුණු ක්‍රියාමාර්ගවලට එරෙහිවය. එවිට සටනද දුෂ්කරය. මන්ද තම ප්‍රතිපත්ති අතහැර දැමීමට ආණ්ඩුව ලෙහෙසියෙන් තීරණය නොකරන නිසාය.

ආණ්ඩු විරෝධී සටන් රැසක් ඇවිලී තිබෙන වේලාවක ආණ්ඩුව තවත් සටනකට හේතුවන තීරණයක් ගෙන තිබේ. ඒ, නව බදු පනතක් පාර්ලිමේන්තුවට ගෙන ඒම මගිනි. එම බදු පනත ඉතාමත් හානිදායක එකකි. එය පොදු ජනයාගේ බොටුව මිරිකා බදු එකතු කිරීමටත් ජාවාරම්කරුවන්ට බදු සමාදීමටත් හැකි ලෙස ආදායම් බදු කොමසාරිස්ට බලය පවරන එකකි. එසේම එය පුණ්‍ය ආයතනවලට පවා බදු පනවන එකකි. එවැනි බදු පනතක් කඩිමුඩියේ ගෙන ආවේ ඇයි? එකක් ආණ්ඩුවට සල්ලි නැත. ආදායම් මාර්ගද නැත. ඒ නිසා බදු වැඩිකර ගැනීම හැර අන් විකල්පයක් නැත. ප්‍රධානම කරුණ ඊට වඩා බරපතළය. ලංකාවේ ආණ්ඩු දැන් දශක කීපයක් තිස්සේ ජීවත් වන්නේ, විදේශීය ණය මගිනි. රාජපක්ෂ පාලනය විදේශීය බැංකුවලින් හා රටවලින් විශාල ණය කන්දරාවක් ගත් අතර ඒවා ගෙවාගැනීම පවා නොහැකිව සිටී. මේ නිසා තවදුරටත් වාණිජ බැංකුවලින් ණය ගැනීම අසීරුවී තිබේ. එහි ප්‍රතිඵලය වන්නේ, ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත හිඟමනේ යාමය. පසුගිය දිනවල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවට ලබාදීමට පොරොන්දු වූ ණය මුදලේ දෙවන වාරිකය ලෙස ඇ.ඩො. මිලියන 167.2ක මුදල මුදා හැරියේය. එහෙත් ඒ කොන්දේසියක් සහිතවය. එම කොන්දේසිය වූයේ ලංකාවේ බදු ප්‍රතිපත්තිය වෙනස් කිරීමය. අලුත් බදු පනත යනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටුකිරීමක් බව පැහැදිලිය.

මෙයින් පෙනෙන්නේ, ලංකාවේ ආණ්ඩුවට ණය ගැනීමත් ඊට අනුව තෙල් ටැංකි, වරාය, ඉඩම් ඇතුළු රටේ සම්පත් විකුණා ගැනීමත් අධ්‍යාපනය, සෞඛ්‍ය, රජයේ සේවක විශ්‍රාම වැටුප්, ගොවි සහන ආදිය කප්පාදු කිරීමත් ජනතාව මත බර පැටවීමත් හැර අන් ක්‍රියාමාර්ගයක් නොමැති බවය. ආණ්ඩු විරෝධී සියලු සටන්වල උල්පත වී ඇත්තේ, ආණ්ඩුවේ එම ජනතා විරෝධී විනාශකාරී ප්‍රතිපත්තිවලට එරෙහි ජනතා විරෝධයන්ය.

දැන් පවතින ආණ්ඩු විරෝධී සටන් රැල්ලේ විශේෂතා රැසක් තිබේ. මේවා බොහොමයක් කෘත්‍රිම සටන් නොව සැබෑ ලෙසම ජනතා සටන්ය. එක්තරා වකවානුවක සටන් සඳහා තත්වයන් මෝරා නැතිවිට, සටනේ, අවශ්‍යතාවය ජනතාවට හොඳින්ම නොදැනී පවතින විට සටන් කිරීමට සිදුවුණේ සංවිධානවලටය; දේශපාලන පක්ෂවලටය. එහෙත් දැන් තත්වය වෙනස්වී ඇත. දැන් සටනට අවතීර්ණ වී ඇත්තේ ජනතාවය. දැන් සිදුවන සටන් බොහොමයක් ඒ ඒ ප්‍රශ්නයට අදාළ ජනතා බලවේගයන්ගේ සටන්ය. උමාඔය සටන මුළුමනින්ම ජනතා සටනක් වී ඇත. සයිටම් සටන ඊට අදාළ සියලු බලවේගයන්ගේ සටනකි. ගොවි සටන්ද එසේය. විකිණීමට එරෙහි සටන්ද එසේය. මෙම සටන් මර්දනය මගින් දුර්වල කිරීමට ආණ්ඩුවට අපහසුවී ඇත්තේ ඒ නිසාය.

එසේම මේ සටන් දිනෙන් දින නව බලවේග එකතුකර ගනිමින් වර්ධනය වෙමින් තිබේ. විවිධ සටන් ක්‍රම නිර්මාණය වෙමින් තිබේ. මෙම සටන්වල දැඩි බලපෑම නිසා ධනපති ආණ්ඩුවට "පියවරක් ඉදිරියට දෙපියවරක් ආපස්සට" තත්වයට පත්වීමටද සිදුව තිබේ. පොදුවේ ගත්විට මෙම සටන් රැල්ල හමුවේ ආණ්ඩුවට දණ ගැසීමට සිදුවන බව පැහැදිලි අතර එය කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් වී තිබේ.

> දැන් ආණ්ඩුවට ජනතාවගේ හඬට ඇහුම්කන් දිය නොහැක. මන්ද දැනටමත් ආණ්ඩුව බහුජාතික සමාගම්වල හඬටත් ජාවාරම්කාරයින්ගේ හඬටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හඬටත් ඇහුම්කන්දී ඒ අනුව වැඩකරන නිසාය. එබැවින් ආණ්ඩුවට එරෙහිව සටන්කරන බලවේග දැන් සටන් කරමින් සිටින්නේ සරල කරුණු සඳහා නොව ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා බැඳුණු ක්‍රියාමාර්ගවලට එරෙහිවය.

මෙම සටන්වල තවත් විශේෂයක් වී ඇත්තේ, ජනතාව සටන තුළින් තම නායකයන් හඳුනා ගැනීම හා සටන් තුළින්ම සැබෑ නායකයන් බිහිවීමය. උමාඔය විනාශකාරී ව්‍යාපෘතියට එරෙහි සටන තුළදී මෙන්ම ගොවි ජනතාවගේ සටන්වලදීද ඌව වෙල්ලස්සේ ඉඩම් කොල්ලයට එරෙහි සටනේදීද ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය යටතේ ජනතාව පෙළගැසෙන අයුරු දැකිය හැකිවිය. සටන් කරන බලවේගයන් තමන් කුමන පක්ෂයකට අයත් වුවත් සටනේදී ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය පිළිගැනීමට සූදානම් බව පෙන්වා තිබේ. එය සටන් බිමේ විශේෂ තත්වයකි. තම පක්ෂයට නායකත්වය දෙනවාට අමතරව පොදුජන සටන්වලදී පොදු ජනතාවගේ නායකයා ලෙස කටයුතු කිරීමට හැකිවීම ජ.වි.පෙ. පැත්තෙන් බලනවිට පක්ෂය ලැබූ ජයග්‍රහණයක්ද වේ. එසේම තම සටන්වලට ජ.වි.පෙ නායකත්වය ලබා ගැනීම ජනතාව ලැබූ ජයග්‍රහණයක්ද වේ. මෙය දැන් සයිටම් සටන තුළද දැකිය හැක. සයිටම් සටනේ නායකත්ව කාර්යභාරයක් ජ.වි.පෙ. බාරගත යුතුයයි පවසන ලද්දේ සටන්කරන බලවේගයන්ට අයත් ජනතාව විසිනි. මින් පෙන්නුම් කරන්නේ, අන් කිසිවක් නොව සැබෑ නායකයන් බිහිකරන්නේ සටන තුළින්ය යන්නය. ජනතාව තම නායකත්වය හඳුනා ගන්නේද සටන තුළින්මය.

අනෙක් අතට මෙම සටන් තුළ ජනතාව විසින් හඳුනා ගතයුතු ගැටලුවක්ද තිබේ. ඒ, සටන තුළට පටු අරමුණු සහිත අය රිංගා ගැනීමට දරන උත්සාහයන්ය. දැනට පවතින සටන් ජනතා අපේක්ෂාවන් ඉටුකරමින් ජය ගැනීම සඳහා ජ.වි.පෙ. කටයුතු කරද්දී තවත් විවිධ අය විවිධ අරමුණු වෙනුවෙන් ඒවා තුළ ක්‍රියාත්මක වන බව පැහැදිලිය. එම වංචනික පුද්ගලයන් හා සංවිධාන භාවිතය තුළින්ම හඳුනා ගැනීම සටන් කරන බලවේගයන්ගේ වගකීමකි. උමාඔය සටනේදී එකී සටනේ ගෞරවය ජ.වි.පෙ.ට යාම වැළක්වීමට

15 වැනි පිටුවට



"සෑම වැඩ වර්ජනයකම සමාජ විප්ලවයේ 'හයිඩ්රාවක්' සැඟවී තිබෙන බව විවාද රහිතය. එහෙත් හැම වැඩ වර්ජනයකින්ම එකවර විප්ලවයක් දක්වා ගමන් කළ හැකි යයි සිතීම අමූලික විකාරයකි."

**ලෙනින්**
**විප්ලවවාදී වාග් පාඨ,**
**63 වැනි පිටුව**

# දූෂණයට වංචාවට ඉඩදීමට විරෝධය

2015 ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති බවට පත් වීම පිටුපස ප්‍රධාන හේතු සාධකය වී තිබුණේ රාජපක්ෂ විරෝධයයි. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහෝසි වීම සහ මහා පරිමාණ වංචා දූෂණ එම පාලනය තුළ තිබූ මූලික ලක්ෂණයයි. ජනතාව බඩ ගැන සිතනවාට වඩා රට ගැන සිතා ඡන්දය භාවිතා කළ අවස්ථාවක් ලෙසද එය ඇතැමුන් විසින් අර්ථ දක්වා තිබුණි. කෙසේ නමුදු එම වසරේ අගෝස්තු 17 පැවති මහ මැතිවරණයෙන් පසු ගොඩ නැගුණු රනිල් - මෛත්‍රී හවුල් පාලනයේද ප්‍රධාන පාඨයක් වී තිබුණේ වංචාවට හා දූෂණයට තිත තබමින් පසු ගිය පාලන සමයේ ඒවා සිදු කළ වූවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන බවය.

ඒ අනුව දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර වංචා දූෂණ සම්බන්ධ පරීක්ෂණ ආරම්භ කිරීමත් සමග මහා පරිමාණ වංචා දූෂණයන් පිළිබඳ තොරතුරු හෙළිකර ගැනීමට හා සිදුවීම් කිහිපයක්ට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද හැකි විය. නමුත් ක්‍රියාවලිය මන්දගාමීව වුවද ඉදිරියට ගමන් කරමින් සිටියදී වත්මන් යහපාලන ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේද දූෂණ වංචා හෙළි වීමත් සමග දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය ආණ්ඩුව විසින් අහෝසි කර දමන ලදී.

රාජපක්ෂ පාලනයේ දූෂණයට එරෙහිව මෙන්ම වත්මන් යහපාලනයේ දූෂණයට එරෙහිවද ප්‍රබල හඬක් නැගුවේ ජ.වි.පෙ.ය. මෙම ලේකම් කාර්යාලය වසා දැමීම යනු වංචාව හා දූෂණයට තවදුරටත් ඉඩ සලසා දීමක් බව ජ.වි.පෙ. අදහස විය. මෙම තත්වය අභිමුවේ මෙය වසා දැමීමට එරෙහිව ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික වසන්ත සමරසිංහ සහෝදරයා කැඳවුම්කරු ලෙස කටයුතු කරන 'දූෂණ විරෝධී හඬ' සංවිධානයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. "FCIDය වසා දැමීම සහ හොරකමේ හෙට දවස" යන මැයෙන් පසුගිය ජූලි 12වැනිදා කොළඹ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවති මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශකයා වූයේ කෝප් කමිටුවේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාය. තවද මෙම අවස්ථාව සඳහා 'දූෂණ විරෝධී හඬ' සංවිධානයේ ජාතික කමිටු සාමාජිකයින් වන නීතිඥ නාමල් රාජපක්ෂ, තුෂාර ගුණරත්න, ගාමිණී රත්නසිරි යන මහත්වරුද සහභාගි වූහ.






# ඩෙංගු පරදවන රතුතරුව මෙහෙයුම

පසුගිය මාස කිහිපය ඇතුළත එක් ලක්ෂ පනස් දහසකට අධික ප්‍රමාණයකට ඩෙංගු රෝගය වැළදී ඇති බවත් මරණ 300ක් පමණ සිදුවී ඇති බවත් මාධ්‍ය හරහා වාර්තා වී තිබුණි. ආණ්ඩුවක් ලෙස මේ වන විට ඩෙංගු තුරන් කිරීම සඳහා යොදා ගෙන තිබෙන ප්‍රධානතම ක්‍රියා මාර්ගය වී ඇත්තේ ජනතාවට දඩ ගැසීම පමණි. රෝහල්වල ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව පවසා රෝගීන් ආපසු හරවා යැවීමට වෙනුවට ඩෙංගු මර්දනය කරලීමේ අවම වැඩපිළිවෙලක් හෝ ක්‍රියාත්මක කිරීමට යහපාලන ආණ්ඩුව අපොහොසත් වී ඇත.

ආණ්ඩුවේ මේ නොහැකියාවට ප්‍රායෝගික විවේචනයක් එල්ල කරමින් ජ.වි.පෙ. 'රතුතරුව' සහන සේවා බලකාය විසින් ඩෙංගු තුරන් කිරීම ඉලක්ක කර ගනිමින් උතුරු නැගෙනහිර ඇතුළු සියලු දිස්ත්‍රික්ක ආවරණය වන සේ පසුගිය ජූලි 08,09 යන දිනයන්හි පාසැල් විශාල ප්‍රමාණයක සහ පොදු ස්ථාන රැසක ශ්‍රමදාන ව්‍යාපාර ක්‍රියාත්මක කරන ලදී. රතුතරුව විසින් ක්‍රියාත්මක කළ මේ ශ්‍රමදාන ව්‍යාපාර සඳහා ජනතාවගෙන් විශාල සහයෝගයක් ලැබුණු අතර ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළු ජ.වි.පෙ. සමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් මේ සඳහා සහභාගි වූහ.

# උමාඔය අත්දැකීම් බෙදාගනිමින්



උමාඔය ව්‍යපෘතිය හේතුවෙන් මේ වන විට බණ්ඩාරවෙල ජනතාව දැඩි අර්බුදයකට පත්ව ඇති අතර භූගර්භය තුළ සිදුව ඇති විනාශය හේතුවෙන් ඉදිරියේදී කුමන අන්දමේ අනතුරකට ඔවුන් ලක් වේදැයි කිව නොහැකි තත්වයකට පත්ව තිබේ. වත්මන් යහපාලන ආණ්ඩුවෙන්ද ජනතාවට යහපත් ප්‍රතිචාරයක් නොමැති තත්වයක් තුළ උමාඔය බහු විනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණ තම සටන් ක්‍රියා මාර්ග තව දුරටත් තීව්‍ර කරමින් සිටී.

මේ තත්වය තුළ දිවයිනේ සෙසු පළාත්වලින්ද උමාඔය ව්‍යපෘතියේ සැබෑ තතු හෙළිකර ගැනීම සඳහා සමන්ත විද්‍යාරත්න සහෝදරයාට ආරාධනා ලැබෙමින් තිබේ. ඒ අනුව පසුගිය ජූලි 24 වෙනිදා කොළඹ දිස්ත්‍රික් ජාතික විද්වත් සංවිධානය විසින් කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී සූදානම් කරන ලද "උමා ඔය ව්‍යපෘතිය සහ අනාගත ඉරණම" යන සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වීමේ අවස්ථාවද සමන්ත විද්‍යාරත්න සහෝදරයාට හිමි විය. මේ සියලු සටන් එකාබද්ධ කොට වෙනස් සමාජ සැකැස්මක් ඇති කර ගැනීම සඳහා අරගල කිරීම මිස හුදෙකලාව සටන් කිරීම ප්‍රතිඵල දායක නොවන බව ඔහු එහිදී අවධාරණය කර සිටියේය.

මෙම අවස්ථාවට මහාචාර්ය ජිනදාස කටුපොත, මහාචාර්ය පී. ලියනආරච්චි යන මහත්වරුන්ද දේශකයින් ලෙස සහභාගි වූ අතර පරිසරවේදී සජීව චාමිකර, උමාඔය බහුවිනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණේ ලේකම් පරිසරවේදී අතුල ප්‍රියන්ත, භූ විද්‍යාඥ ඇන්ටන් ජයකොඩි ජාතික විද්වත් සංවිධානයේ කොළඹ දිස්ත්‍රික් සභාපති ගණකාධිකාරි සුනිල් කුමාර ගමගේ යන මහත්වරු ඇතුළු විදවත්හු විශාල පිරිසක් මෙයට සහභාගි වී සිටියහ.

# SAITM අරගලය නව මාවතකට



SAITM අරගලය මෙතෙක් ගොනුවී තිබුණේ විශේෂයෙන් ශිෂ්‍යයින් සහ වෛද්‍යවරුන් අතරය. එහෙත් එම සටන ජයග්‍රහණය කිරීම සඳහා එය පොදු සටනක් බවට පත්වීම අත්‍යාවශ්‍ය කටයුත්තක් වී තිබිණි. රටේ සාමාන්‍ය ජනතාවට එය එතරම්ම තමන්ට අදාළ කරුණක් නොවුණු අතර SAITM ආයතනය වසා දැමීමට එරෙහිව සිදුකරන වැඩ වර්ජන, පා ගමන් සහ උද්ඝෝෂණ දෙස ඔවුන් බැලුවේ පිටස්තර ඇසකිනි.

කෙසේ වුවද ශිෂ්‍යයන්ට සහ වෛද්‍යවරුන්ට අමතරව දේශපාලන පක්ෂ, වෘත්තිය සමිති, කලාකරුවන් සහ විද්වතුන් මේ අරගලය හා බද්ධ කර ගැනීමට ජ.වි.පෙ. ප්‍රබල දායකත්වයක් දැක්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස "සයිටම් විරෝධී ජන පවුර" නමින් පොදු මධ්‍යස්ථානයක් බිහිවී තිබේ. පසුගිය ජූලි 25 වෙනිදා මෙම සංවිධානයේ ජාතික මහ සමුළුව කොළඹ විහාර මහා දේවී එළිමහන් රංග පීඨයේදී විශාල ජනතාවක් ඉදිරියේ පැවැත්විණි. එහිදී එළඹෙන අගෝස්තු 02 වෙනිදා හර්තාල් දිනයක් බවට නම් කරන ලද අතර SAITM ආයතනය වසා දමන තුරු අඛණ්ඩව අරගල කිරීමට ඔවුහු එහිදී ප්‍රතිඥා දුන්හ.

මේ අවස්ථාව සඳහා අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය ආදී සංවිධාන මෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විපක්ෂයේ දේශපාලන පක්ෂ නියෝජිතයෝද සහභාගි වී සිටියහ.

# සමාජවාදය තුළ මානව හිමිකම්



සමාජවාදය යනු මානව හිමිකම්වලට විරුද්ධ අර්ථය දෙන පදයක් ලෙස ජනතාව අතර තහවුරු කිරීමට ධනපති පංතිය උත්සාහ දරයි. අධිරාජවාදීන් විසින් මානව හිමිකම් උල්ලංඝනය කරන්නේ යයි චෝදනා නොකරන ලද සමාජවාදී රාජ්‍යයක් නොමැති තරම්ය. ආසන්නතම අත්දැකීම වන්නේ එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මෑතකදී කියුබාවට එරෙහිව කරන ලද ප්‍රකාශයයි. කියුබාව මානව හිමිකම් කඩ කරන බැවින් එරටට එරෙහිව පනවා ඇති සම්බාධක දිගටම පවත්වා ගෙන යන්නේයැයි එහිදී ඔහු ප්‍රකාශ කර තිබුණි.

### මානව හිමිකම් යනු මොනවාද?

ජාත්‍යන්තර වර්ගීකරණයට අනුව මානව හිමිකම් ප්‍රධාන කාණ්ඩ 03කට වර්ග කර ඇත. පළමු පරම්පරාවේ මානව හිමිකම්, දෙවන පරම්පරාවේ මානව හිමිකම්, සහ තෙවන පරම්පරාවේ මානව හිමිකම් වශයෙනි.

පළමු පරම්පරාවේ මානව හිමිකම් කාණ්ඩයට මූලික වශයෙන් අයත් වන්නේ දේශපාලන හා සිවිල් අයිතිවාසිකම්ය. එනම් කතා කිරීමේ, රැස්වීමේ, කැමති ආගමක් ඇදහීමේ නිදහස ආදියයි. මේවා මූලික වශයෙන් පැන නගින්නේ ධනවාදයේ උපතත් සමගය. මෙම මානව හිමිකම් පදනම් වී ඇත්තේ ජෝන් ලොක්ගේ දාර්ශනික පැහැදිලි කිරීම්, මැග්නා කාර්ටා ගිවිසුම, මිනිස් අයිතීන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය, අයිතීන් පිළිබඳ එක්සත් ජනපද පනත ආදිය මතය.

දෙවන පරම්පරාවේ මානව හිමිකම් කාණ්ඩයට අයත් වන්නේ, මිනිසාගේ සමාජ ආර්ථික අයිතීන්ය. අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාස, සමාජ ආරක්ෂණ ආදී අයිතීන්ය. මෙම අයිතීන් මූලික මිනිස් අයිතීන් හැටියට තහවුරුව ලබන්නේ සමාජවාදී චින්තකයන්ගේ සහ මාක්ස්වාදීන්ගේ බලපෑමෙනි.

සුළු ජන කොටස්වල අයිතීන්, ජනවාර්ගික අයිතීන්, කාන්තා අයිතීන්, පාරිසරික අයිතීන් වැනි දේ තෙවන පරම්පරාවේ මානව හිමිකම් කාණ්ඩයට අයත් වේ.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සැකසෙන්නේ, ඉහත පරම්පරා තුනෙහිම මානව හිමිකම් සැලකිල්ලට ලක් කිරීමෙනි. දේශපාලන හා ආර්ථික අයිතීන් යන දෙකම ඇතුළත් වන සේ සකසා ඇති මෙම ප්‍රකාශනය මූලධර්ම 30කින් යුක්තය.

සාමාන්‍ය මානව සමාජය මානව හිමිකම් ලෙස දකින්නේ, මෙකී දේශපාලනික හා ආර්ථික අයිතීන් යන දෙකොටසටම අයත් අයිතීන්ය. එහෙත් අධිරාජ්‍යවාදීන් හා ධනේශ්වර මත සකසන්නන් මානව හිමිකම් ලෙස දකින්නේ හුදෙක් දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් පමණි. ජාත්‍යන්තර දේශපාලන විද්‍යා සංගමයේ 11වැනි සමුළුව 1979දී මොස්කව් නුවරදී පැවැත්වුණි. එහිදී අදහස් දැක්වූ එක්සත් ජනපද නීතිවේදී හැරොල්ඩ් බර්මාන් සඳහන් කළේ බටහිර සංකල්පය අනුව වඩා වැදගත් වන්නේ දේශපාලන අයිතීන්, පුද්ගල අයිතීන් හා නිදහස බවය. මාක්ස්වාදීන් සමාජ ආර්ථික අයිතීන් වඩා වැදගත් සේ සැලකීම වැරදි බවය. ඊට පිළිතුරු දෙමින් සෝවියට් විශේෂඥයන් පැවසුවේ, දේශපාලන, සමාජ ආර්ථික ඇතුළු සියලු අයිතීන් එකසේ වැදගත් වන බවය. එසේම සමාජ ආර්ථික අයිතීන් තහවුරු නොවන්නේ නම් එවිට දේශපාලන හා සිවිල් අයිතීන් ද ආරක්ෂා නොවන බවය.

අධිරාජ්‍යවාදීන් හා ධනේශ්වර මත සකසන්නෝ ප්‍රකාශනයේදී සමාජ ආර්ථික අයිතීන්ද මානව හිමිකම් ලෙස පිළිගත්තද භාවිතයේදී ඒවා මානව හිමිකම් ලෙස නොසලකති. ඔවුහු සමාජවාදී රටවල කතා කිරීමේ, රැස්වීමේ නිදහස නැතැයි චෝදනා කළද සැමට අධ්‍යාපන අයිතිය ලබාදී නැතැයි හෝ සැමට සෞඛ්‍ය, නිවාස අයිතීන් ලබාදී නැතැයි චෝදනා නොකරති. කෙසේ වුවද භාවිතයේදී ඔවුන්ට සමාජ ආර්ථික අයිතීන් මානව අයිතීන් නොවේ. ඒවා කඩවීම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් නොවේ.

අනෙක් අතට කිසියම් රටක් මානව හිමිකම් උල්ලංඝනය කරන්නේ යයි චෝදනා කිරීමට යොදා ගනු ලබන, පොදු පිළිගැනීමකට ලක් වී ඇති නිර්ණායකයක්ද ඔවුන්ට නොමැත. මානව හිමිකම් පිළිබඳව කාගේත් පොදු පිළිග ැනීමට ලක් වූ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඔවුහු නිර්ණායකයන් ලෙස භාවිතා නොකරති. මානව හිමිකම් පිළිබඳ ඔවුන්ගේ නිර්ණායකය වන්නේ කිසියම් රටක් අධිරාජ්‍යවාදයේ න්‍යාය පත්‍රයට කෙතරම් බාධාකාරීද යන්න පමණකි.

සමාජවාදයේදී මානව හිමිකම් උල්ලංඝනය වේද යන්න අධිරාජ්‍යවාදී ආයතනවල සහ ධනේශ්වර මත සකසන්නන්ගේ ප්‍රකාශ මත, වාර්තා මත තීරණය කිරීම වැරදි සහගත වන්නේ එබැවිනි.

අයිතීන්ද ධනවාදයට වඩා හොඳින් ආරක්ෂා වේ. සමාජවාදය තුළදී දේශපාලන හා සිවිල් අයිතීන් ආරක්ෂා වන අයුරු මීට ඉහත ලිපියකදී අපි සාකච්ඡා කළෙමු. සමාජවාදය තුළ මැතිවරණ පැවැත්වේද ඒවායේ ස්වභාවය කුමක්ද යන්න ඒ අනුව අපි දැනටමත් සාකච්ඡා කර ඇත්තෙමු.

සමාජවාදය තුළදී මිනිසාගේ මූලික මානව හිමිකම් වන අධ්‍යාපනය, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය පහසුකම් ලැබීමට ඇති අයිතිය තහවුරු කෙරේ. සමාජවාදී රටවල ළදරු පාසලේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලයේ අධ්‍යාපනය ලබා දෙයි. රටේ සැම ප්‍රදේශයකම දරුවන්ට සමාන ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දේ. සමාජවාදය ධනේශ්වර රටවලදී මෙන් තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීම දෙමාපියන්ගේ වගකීමක් පමණක් බවට පත් කරන්නේ නැත. අධ්‍යාපනය ලබා දීමේ වගකීමෙන් දෙමාපියන් නිදහස් කරන සමාජවාදී රජය එය තමන් වෙත පවරා ගනී.

සමාජවාදය තුළදී ජනතාවට සෞඛ්‍ය පහසුකම් ලබාදීමද රජයේ වගකීමක් ලෙස සලකයි.

> මානව හිමිකම් කඩ කරන්නනේ යයි සමාජවාදයට චෝදනා කරන එක්සත් ජනපදය තුළ කළු සුදු භේදය බරපතළ ගැටලුවක් ලෙස පවතී. එරට අප්‍රිකානු ඇමරිකානුවන්ට සුදු ජාතිකයන්ට හිමි අයිතීන් සමාන ලෙස නොලැබේ. ඔවුහු නිරන්තරයෙන් සුදු ජාතික පොලිස් නිලධරයන්ගේ ප්‍රහාරයට ලක් වෙති; ඝාතනය වෙති. එක්සත් ජනපදය තුළ අප්‍රිකානු ඇමරිකානුවෙකු වීම මරණ වරෙන්තුවක් අත තබා ගෙන සිටීම වැනිය.

### සමාජවාදය තුළදී මානව හිමිකම්


සමාජවාදය යනු ඉහත කී පරම්පරා තුනේම මානව හිමිකම් ආරක්ෂා කෙරෙන සමාජයකි. එහිදී දේශපාලන හා සිවිල් අයිතීන්ද සමාජ හා ආර්ථික අයිතීන්ද පාරිසරික අයිතීන් ඇතුළු අනෙකුත් ඒ අනුව සමාජයේ සැම අයෙකුටම නොමිලේ සෞඛ්‍ය පහසුකම් ලැබීමේ අයිතිය තහවුරු කෙරේ. සමාජවාදී සෝවියට් දේශය තුළ සෞඛ්‍ය පහසුකම් 100%ක්ම නොමිලයේ ලබා දුන්නේය. සමාජවාදී කියුබාවේදී සියලුම ජනතාවට සෞඛ්‍ය පහසුකම් ලබා දෙනු ලබන්නේ නොමිලයේය. චීනයේ සැම පුද්ගලයෙකුටම සෞඛ්‍ය රක්ෂණයක් සමාජවාදී රජය මැදිහත් වී ලබා දේ. ඊට දායකත්වය සපයන්නේ සමාජවාදී රජයත් එක් එක් පුද්ගලයා ජීවත් වන ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයන්ය. එහෙත් මානව හිමිකම් කඩ කරන්නේ යයි සමාජවාදී රටවලට චෝදනා කරන ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ රජය හඳුන්වා දීමට සැරසෙන නව සෞඛ්‍ය පනත මගින් එරට ජනතාවගෙන් මිලියන 23කට සෞඛ්‍ය රක්ෂණ ආවරණ අහිමිවනු ඇත. එහිදී මානව හිමිකම් කඩවේ යැයි ප්‍රකාශ කිරීමට ධනේශ්වර මානව හිමිකම් ආයතන ඉදිරිපත් වන්නේ නැත.

මේ ආකාරයටම සමාජවාදී සමාජය තුළදී සැම පුද්ගලයෙකුටම රැකියාවක් ලබාදීම, නිවාසයක් ලබා දීම ආදී මූලික සමාජ ආර්ථික අයිතීන් ලබාදීම සමාජවාදී රජයේ වගකීමක් කර ගනී. සමාජවාදී සෝවියට් දේශය රැකියා ප්‍රශ්නය විසඳූ ලොව ප්‍රථම රට බවට පත් වූයේ 1930දීය. එතැන් සිට 1991දී සමාජවාදී සෝවියට් දේශය බිඳවැටෙන තුරුම එරට රැකියා විරහිතයෙක් නොසිටියේය. සැම සමාජවාදී රාජ්‍යයකම අරමුණ වන්නේ, මිනිසාගේ මූලික මානව හිමිකම් වන අධ්‍යාපන, සෞඛ්‍ය, ආහාර, නිවාස, සමාජ රක්ෂණ වැනි අයිතීන් සැම අයෙකුටම කිසිදු භේදයකින් තොරව ලබා දීමය. එහෙත් මානව හිමිකම් කඩ කරන්නේ යැයි සමාජවාදයට චෝදනා කරන කිසිදු ධනවාදී රටක් තම රටේ ජනතාවගේ සමාජ ආර්ථික අයිතීන් සමසේ තහවුරු කිරීමට මෙතෙක් සමත් වී නැත.

සුළු ජන කොටස්වල අයිතීන්, ජනවාර්ගික අයිතීන්, පාරිසරික අයිතීන් වැනි තෙවන පරම්පරාවේ මානව හිමිකම් උපරිමයෙන් ආරක්ෂා කර ඇත්තේ සමාජවාදයේදීය. බොහෝ ධනවාදී රටවල ජාතික ප්‍රශ්නය නොවිසඳුණු ගැටලුවක් ලෙස පවතී. ඒ සැම රටකම සුළු ජන කොටස්වලට වෙනස්ව සලකනු ලැබේ.

මානව හිමිකම් කඩ කරන්නනේ යයි සමාජවාදයට චෝදනා කරන එක්සත් ජනපදය තුළ කළු සුදු භේදය බරපතළ ගැටලුවක් ලෙස පවතී. එරට අප්‍රිකානු ඇමරිකානුවන්ට සුදු ජාතිකයන්ට හිමි අයිතීන් සමාන ලෙස නොලැබේ. ඔවුන් නිරන්තරයෙන් සුදු ජාතික පොලිස් නිලධරයන්ගේ ප්‍රහාරයට ලක් වේ; ඝාතනය වේ. එක්සත් ජනපදය තුළ අප්‍රිකානු ඇමරිකානුවෙකු වීම මරණ වරෙන්තුවක් අත තබා ගෙන සිටීම වැනිය. මීට අමතරව බොහෝ ධනවාදී රටවල මුස්ලිම් සංක්‍රමණිකයන්ට වෙනස්ව සැලකේ.

සුළු ජන කොටස්වල ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අයිතිවාසිකම් සියල්ල තහවුරු කර ඇත්තේ සමාජවාදය තුළදී පමණි. සැම සමාජවාදී රටකම ජාතික ගැටලුව විසඳා ඇත. සියලු ජන කොටස්වලට 15වැනි පිටුවට



"අලුතින් වැඩක් ආරම්භ කරන විට මුලින්ම එන බාධකය නොසැලකිල්ලයි. ඊළඟට විරුද්ධවාදීන්ගේ උපහාසයට මුහුණ දෙන්නට සිදුවේ. එයින් එම කටයුත්ත අධෛර්යමත් කළ නොහැකි නම් දෙවනුව එයට අපහාසාත්මකව කථා කරයි. එයත් අසාර්ථක වූ කල්හි එය විනාශ කිරීමට බලයි. එයත් කළ නොහැකි කල්හි එම වැඩය අගය කරයි. එයට ගෞරව කරයි."

**මහත්මා ගාන්ධි**

# වෙනිසියුලාව: මදුරෝ පාලනය පෙරළීමේ බළල් අත් මෙහෙයුමක්




ජනාධිපති හ්‍යුගෝ චාවේස් බලයට පත් වීමෙන් පසු, එනම් 1999න් පසු වෙනිසියුලාව මුහුණ දී ඇති වඩාත් ම අර්බුදකාරී වටපිටාව උදා වී ඇත්තේ දැන්ය. අධිරාජ්‍යවාදී මාධ්‍ය නොනැවතී ඒ පිළිබඳ ව තොරතුරු මුදා හරින්නට පටන් ගෙන තිබේ. වෙනිසියුලාව තුළ ප්‍රගතිශීලි සමාජ සුභසාධනයන් සිදු කෙරෙද්දී ඒවා ඔවුන්ට ප්‍රවෘත්ති වූයේ නැත.

මේ මොහොතේදී වෙනිසියුලාව දරුණු ආහාර ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයකට මුහුණ දී සිටියි. දුප්පත්කම ඉහවහා ගොසින්ය. දිනපතා ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ දියත් වේ. ඇතැම් උද්ඝෝෂණ ප්‍රචණ්ඩකාරී ඒවාය. ඒවායේ දී නවීනතම ආරක්ෂිත හිස් වැසුම් පළඳගත් විරෝධතාකරුවෝ ආරක්ෂක අංශ හා ගැටෙති; පුද්ගලයන්ට පහර දී මරා දමති; පොදු දේපළ කඩා බිඳ දමති; ඒවාට ගිනි තබති. මේ සියල්ලටම වගකිව යුත්තේ ජනාධිපති නිකොලොස් මදුරෝගේ චාවේස්වාදී පාලනය යැයි ඔවුහු පවසති.

අධිරාජ්‍යවාදී මාධ්‍ය විසින් මවන රූපය එබඳුය.

මේ වන විට වෙනිසියුලාව තුළ දරුණු ආහාර හිඟයක්, අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයක් පවතින සැබෑය. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පැවැත්වෙන බවද ඇතැම් ඒවා ප්‍රචණ්ඩකාරී බවද සත්‍යයය. මෙම උද්ඝෝෂණවලදී සහ වෙනත් අවස්ථාවලදී ඝාතනයන් සිදු වී ඇති බවද සත්‍යයය. එහෙත් මේ සියල්ල පිටුපස ඇති කථාන්තරය එකී මාධ්‍ය මගින් කියා පෑමට උත්සාහ කරන දේට වඩා වෙනස්ය.

ලෝක ආර්ථික අර්බුදයෙන් පසු ලෝකය පුරා අමුද්‍රව්‍යවලත්, ඛනිජ තෙල්වලත් මිල බරපතළ ලෙස කඩා වැටුණි. ලෝකයේ විශාලතම තෙල් සංචිත හිමි, තෙල් අපනයනය සිය ප්‍රධානතම ආදායම් මාර්ගය කරගත් වෙනිසියුලාවට එය ඉතා දරුණු ලෙස බලපෑවේය. මේ නිසා ආදායම් අඩු වූ අතර රට බරපතළ ආර්ථික අර්බුදයක් වෙත ගමන් ගත්තේය. එහෙත් රට ඉහත කී තත්වයට පත් වූයේ හුදෙක් වර්ධනය වූ ආර්ථික අර්බුදය නිසාවෙන්ම නොවේ.

එක්සත් ජනපදයත්, එක්සත් ජනපදයේ අතකොලු ලෙස හැසිරෙන වෙනිසුවෙලානු විපක්ෂයත් එරට ඇති වූ ආර්ථික අර්බුදය සිය වාසියට හරවා ගනිමින් නිකොලොස් මදුරෝගේ පාලනය පෙරලා දැමීමට කුමන්ත්‍රණකාරී ලෙස මැදිහත් වීම විසින් පෙර කී තත්වයට රට ගෙනවුත් තිබේ. **එක්සත් ජනපදයෙන් වෙනිසුවෙලාවේ මදුරෝ පාලනය පෙරලා දැමීම සඳහා විපක්ෂ කණ්ඩායම්වලට දෙනු ලබන රාජ්‍යතාන්ත්‍රික හා ආර්ථික සහය නොවන්නට රට තුළ මෙතරම් කලබලකාරි, ගැටුම් සහගත තත්ත්වයක් පැන නගින්නට ඉඩ නොතිබුණි.**

ඔබාමා පාලනය "ප්‍රජාතාන්ත්‍රවාදය ප්‍රවර්ධනය" සඳහා වෙනිසියුලානු නිලධාරීන්ට සම්බාධක පැන වූයේ 2014දීය. ඉන් අවුරුද්දකට පසු වෙනිසියුලාව එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබීය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කලාපය තුළ සිය බලපෑම යථා තත්වයට පත් කර ගැනීමට ප්‍රබල බාධකයක් ලෙස සලකන්නේ, වෙනිසියුලාවයි. එහිදී වෙනිසියුලාව දුර්වල කර ගැනීමේ සිය න්‍යාය පත්‍රය මෙහෙයවා ගැනීමට බළල් අතක් ලෙස ඔවුන් භාවිත කරන්නේ අමෙරිකානු රාජ්‍යයන්ගේ සංවිධානයයි (OAS). රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් කොංග්‍රස් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ඉදිරි වර්ෂය (2018) සඳහා අයවැය යෝජනා සඳහන් වාර්තාවේ 180 වන පිටුවේ මෙසේ ලියා තිබේ.

"අමෙරිකානු රාජ්‍යයන්ගේ සංවිධානය (OAS) වෙනිසියුලාව වැනි එක්සත් ජනපද විරෝධී රාජ්‍යයන්ගේ බලපෑම අඩු කරමින්, නිදහස් හා සාධාරණ මැතිවරණ ප්‍රවර්ධනය කරමින්, කොලොම්බියාවේ සාම ගිවිසුම හා හයිටිය යළි ගොඩනැගීම උදෙසා ජාත්‍යන්තර සහාය දිනා ගනිමින් බටහිර අර්ධගෝලය තුළ එක්සත් ජනපද දේශපාලන හා ආර්ථික වුවමනාවන් ප්‍රවර්ධනය සඳහා කටයුතු කරයි."

ඒ අනුව ඉදිරි වසර තුළදී කොංග්‍රස් මණ්ඩලය වෙනිසියුලාව තුළ "ප්‍රජාතාන්ත්‍රවාදය ප්‍රවර්ධනය" සඳහා ඩොලර් බිලියන 9.5ක් යෙදවීමට තීරණය කර තිබේ. මීට අමතරව විපක්ෂයේ ආණ්ඩු විරෝධී කටයුතු සඳහා ආධාර එකතු කරන සහ විවිධ ආකාරයේ සහන ලබා දෙන අන්තර්ජාලය හා සම්බන්ධ ක්‍රියාවලියක්ද ඇති කර තිබේ. Go Fund Me සහ Generosity වැනි වෙබ් පිටු ඊට උදාහරණය. මේවා ආරම්භ වී ඇත්තේද වත්මන් ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ල ආරම්භ වීමත් සමගය. මේ අතර ගාඩියන් නම් බ්‍රිතාන්‍ය පුවත්පත වෙනිසුවෙලාවේ මානව හිමිකම් උද්ඝෝෂණවලට සහය පළ කළ හැකි විධි 09ක් සිය පාඨකයන්ට ඉදිරිපත් කර තිබුණි.

එක්සත් ජනපදය එක් පැත්තකින් වෙනිසුවෙලානු ආර්ථිකයට සම්බාධක පනවන අතර අනෙක් පැත්තෙන් එරට විරුද්ධ පක්ෂයට මතවාදී, ආර්ථික හා ද්‍රව්‍යමය ආධාර තොග වශයෙන් සපයමින් සිටියි.

වෙනිසුවෙලානු ආර්ථිකයට පහර දීමේ සහ ප්‍රචණ්ඩ වීදි සටන්වල නවතම රැල්ල ආරම්භ වූයේ, පසුගිය අප්‍රේල් 01 වනදා සිටය. එතැන් සිට මාස 03ක් ඇතුළත මරණ 87ක් වාර්තා විය. වෙනිසුවෙලානු ආරක්ෂක හමුදා අතින් මියගොස් ඇත්තේ ඉන් 06කි. ඉතිරි පිරිස් විරුද්ධ පක්ෂ කණ්ඩායම් විසින් සිදු කරනු ලැබූ ඒවාය. ඒ අතරින් සමහරු චාවේස්වාදීන්ය. මේ වන විට වීදි සටන්වල දී භාවිත කරනු ලබන නවීනතම ආරක්ෂක හිස් වැසුම්, වායු ආරක්ෂක මුහුණු ආවරණ, පණිවුඩ හුවමාරු යන්ත්‍ර ආදිය රට තුළට රහසින් ගෙනැවිත් තිබේ. ඔවුහු දේශීයව නිෂ්පාදනය කරනු ලැබූ පෙට්‍රල් බෝම්බ හා වෙනත් ආයුද භාවිත කරති. පසුගියදා වෙනිසුවෙලානු රජය කොලොම්බියාවේ සිට රහසිගතව පැමිණි සන්නද්ධ කැරලිකරුවන් 06 දෙනෙකු ටච්රා ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත්තේය.

එසේම විරුද්ධ පක්ෂ කණ්ඩායම් රජයේ ගොඩනැගිලි හා දේපළද විනාශ කරමින් සිටිති. පසුගිය මැයි 22වැනි දා මෙම කැරලි කණ්ඩායම් ට්‍රාන්ස් බොලිවාර් බස් රථ 54ක් ගිනි තබා විනාශ කළහ; හ්‍යුගෝ චාවේස් ළමා හා මාතෘ රෝහලට පහර දුන්නෝය. රට පුරාම ව්‍යාපාරික ස්ථාන 115ක් කොල්ලකනු ලැබ තිබේ.

මතු වී ඇති අර්බුදයට විසඳුම් ලෙස මදුරෝ පාලනය විසින් 2017 දෙසැම්බර් 10 දිනට ව්‍යවස්ථාදායක සභා මැතිවරණයක් යෝජනා කර තිබේ. මීට අමතරව මදුරෝ පාලනය මතු වී ඇති තත්වය සමනය කර ගැනීම සඳහා පාප් වහන්සේගේ මැදිහත් වීමෙන් සාකච්ඡා ආරම්භ කිරීමට විපක්ෂයට යෝජනා කර තිබේ. එහෙත් විපක්ෂය එකී සියලු යෝජනා ප්‍රතික්ෂේප කර ඇත. පසුගියදා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ද යෝජිත ව්‍යවස්ථාදායක සභා මැතිවරණය පැවැත්වීමට ඉඩ නොදෙන බවද ප්‍රකාශ කර තිබුණි. මේ අනුව පෙනී යන්නේ, එක්සත් ජනපදයේත් එහි බළල් අතක් වන වෙනිසියුලාව විපක්ෂයේත් උත්සාහය හැකි ඉක්මනින් මදුරෝ පාලනය පෙරළා දැමීම බවය.

## තුර්කිය: රුසියානු නල මාර්ගයන්ට පහසුකම් සලසා



තුර්කියේ රාජ්‍ය සමාගමක් වන තුර්කි පෙට්‍රෝලියම් පයිප් ලයින් සමාගම සහ රුසියාවේ ගෑස් ප්‍රොම් සමාගම ටර්ක් ස්ට්‍රීම් ස්වභාවික වායු නල පද්ධතිය සඳහා මූල්‍යනය කිරීමට ගිවිසුමක් අත්සන් කළ බව ජූලි 11 වන දා නිවේදනය කළේ ය.

මෙම නල පද්ධතිය කි. මී. 100ක දිගකින් යුක්ත වන අතර ඉන් කි.මී. 900ක්ම ගමන් ගන්නේ කළු මුහුදු පත්ල හරහාය. ඉන් බලාපොරොත්තු වන්නේ රුසියාවේ ස්වභාවික වායු නල මාර්ග ඔස්සේ තුර්කිය වෙත බෙදා හැරීමය. මීට අමතරව ඒ ඔස්සේ යුරෝපීය රටවලටද රුසියානු ස්වභාවික වායු ප්‍රවාහනයට අවස්ථාව සැලසේ. මෙම නල පද්ධතියේ ධාරිතාව වසරකට ඝන මීටර් බිලියන 63ක් වන අතර ඉන් ඝන මීටර් බිලියන 47ක් ග්‍රීක තුර්කි මායිම ඔස්සේ යුරෝපයට යැවීමටත් ඉතිරි ඝන මීටර් බිලියන 16 තුර්කියේ පාවිච්චිය සඳහා යැවීමටත් බලාපොරොත්තු වේ.

යුක්රේන අර්බුදයෙන් පසු එතෙක් භාවිත කළ නල මාර්ග මගින් රුසියානු ස්වභාවික වායුව යුරෝපයට සැපයීම අර්බුදයට ගියේය. මේ නිසා යුරෝපයට වැඩි මිලට ස්වභාවික වායුව මිල දී ගෙන මුහුදු මාර්ගයෙන් ප්‍රවාහනය කිරීමට සිදු විය. එසේ ම යුරෝපය තුළ ස්වභාවික වායු වෙළෙඳපළ හැකිලී ගියේය.

## IS: පරාජයන්ගෙන් බැටකමින්



ඉස්ලාමීය රාජ්‍යයක් සඳහා සටන් වදින IS ත්‍රස්තවාදීන්ට පසුගිය මාසය තුළ දී බරපතළ පරාජයන්ට මුහුණ දීමට සිදුවිය.

පසුගිය ජූලි 11 වන දින ඔවුන් සිය නායකයා වූ අබු බකර් බග්දාදි මිය ගිය බව පිළිගත්තේය. ජූනි මස 16 වන දා රුසියානු මාධ්‍ය ප්‍රකාශ කළේ මැයි 28 වන දා සිරියාවේ රක්කා නගරය ආසන්නයේදී රුසියානු ගුවන් ප්‍රහාරයක් මගින් ඔහු මරා දැමුණු බවය.

මේ අතර ඉරාක හමුදා පසුගිය ජූලි 10 වන දා මොසුල් නගරය IS ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගත්තේ ය. IS ත්‍රස්තවාදීන් අතට මොසුල් නගරය පත් වූයේ මීට අවුරුදු 03කට පෙරදීය. මේ අනුව දැනට IS ත්‍රස්තවාදීන් අත පවතින්නේ සිරියවේ රක්කා නගරය පමණි. එයද නුදුරේදීම බිඳවැටීමට නියමිතය.

## රුසියාව: ලොව වේගත්ම පරිගණකය නිපදවා



ඇසි පිය හෙළන සැණින් ගණනය කිරීම් ට්‍රිලියන ගණනක් සිදු කළ හැකි පරිගණකයක් රුසියාව විසින් නිපදවා තිබේ. මෙය නිපදවා ඇත්තේ රුසියානු විද්‍යා ඇකඩමියේ ඈත පෙරදිග බාණ්ඩය විසිනි. මෙම පරිගණකයට තත්ත්පරයකදී ගණනය කිරීම් ට්‍රිලියන 55ක් දක්වා සිදු කළ හැකි යයි ඔවුහු පවසති. මෙය දැනට රුසියානු විද්‍යා ඇකඩමියේ ඈත පෙරදිග බාණ්ඩයේ දත්ත මධ්‍යස්ථානය තුළ තබා ඇත.

මේ අනුව දැනට ලොව වේගවත්ම පරිගණකය බවට මෙය පත් වී ඇත.

## නිකරගුවාව: විප්ලවයට 38 වසරක් සම්පූර්ණ වී



නිකරගුවානු සැන්ඩිනිස්ටා විප්ලවය සිදු වී පසුගිය ජූලි 19 වන දාට වසර 38ක් සම්පූර්ණ විය. එහි සමරු උත්සවය එදින නිකරගුවාවේ මැනගුවා නුවරදී පැවැත්වුණ අතර ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූයේ නිකරගුවානු කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල සහිත ඩයස් කැනල්ය.

1979 ජූලි 19 වන දා සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති ව්‍යාපාරයේ නායකත්වයෙන් නිකරගුවානු විප්ලවය ජයග්‍රහණය කළේය. පසුව 1990 පැවති මැතිවරණයේ දී ජාතික විරුද්ධ පක්ෂ සංගමය ජයග්‍රහණය කළ අතර සැන්ඩිනිස්ටා වරුන්ට බලය අත් හැරීමට සිදු විය. කෙසේ වුවද 2007 මැතිවරණ ජයග්‍රහණයේ සිට නැවත නිකරගුවාවේ බලය හොබවන්නේ සැන්ඩිනිස්ටාවරුය.

# ආර්ථිකය උඩුයටිකුරු කරන IMF ආදායම් පනත

තමන්ට බදු ගෙවීමේ ගැටලු ඇති නිසා වහාම ලංකාවේ බදු අයකරන ක්‍රමය වෙනස් කරන ලෙස ආණ්ඩුවට බල කරමින් කිසිවෙකු හෝ ආණ්ඩුවට එරෙහිව උද්ඝෝෂණයක් කරනු අප දැක නැත. ලංකාවේ ආදායම් පනතේ අඩුපාඩු ඇතත් ජනතාවට පීඩාකාරී යැයි මහජන ඉල්ලීමක් නැත. ආණ්ඩුවට - පාලකයින්ට එරෙහිව උද්ඝෝෂණ ඇත්තේ උමා ඔය ගැනය. වරාය විකිණීමට එරෙහිවය. සයිටම් විරෝධීවය. වගා වන්දි ගෙවන ලෙසටය. ජල හිඟයට පිළියම් දෙන ලෙස ගොවි ජනතාවගේ උද්ඝෝෂණය. ජනතාව පාරට බැස ඇති එවැනි සංවේදී කරුණු ගැන බීරි අලින්ටත් වඩා බිහිරි ලෙස කටයුතු කරන ආණ්ඩුව (යහපාලනය) පසුගියදා හදිසියේම පාර්ලිමේන්තුවට නව ආදායම් පනතක් ඉදිරිපත් කළේය. මෙම නව දේශීය ආදායම් පනතේ අරමුණවී ඇත්තේ 2017 අප්‍රේල් මස 01වැනි දින සිට බලපැවැත්වෙන පරිදි තක්සේරු කරන වර්ෂ සඳහා දේශීය ආදායම් බදු අය කිරීමේ ක්‍රමවේදයන් විධිවිධානයන් සංශෝධනය කිරීමය.

## මූල්‍ය අරමුදලේ වුවමනාව

මේ මොහොත වන විට ලංකාවේ දුබල ධනපති ආණ්ඩුව ඉතිහාසයේ අන් කිසිදු ආණ්ඩුවක් මුහුණ නොදුන් තරමේ දැවැන්ත ණය අර්බුදයකට හා ඒ නිසාම එදිනෙදා තම පැවැත්ම වෙනුවෙන් මුදල් සම්පාදනය කර ගැනීමේ නොහැකියාවකට මුහුණදී සිටී. එම අර්බුදයෙන් ගැලවීම වෙනුවෙන් තාවකාලික පිළියම් ලෙස හම්බන්තොට වරාය ගෙඩිය පිටින්ම චීනයට විකිණීම එක් පියවරකි. එවිට එය දැනෙන ඊට එරෙහි බලවේග විරෝධතා දැක්වීම ස්වාභාවිකය. එසේම විරෝධතා ඇති නොවන පරිදි, ජනතාවට නොදැනෙන පරිදි, (හම්බන්තොට වරාය විකිණීම වැනිම ක්‍රියාමාර්ගයක් ලෙස) මූල්‍ය ප්‍රතිපත්තියේ කරන වෙනස්කමක් ලෙස ආණ්ඩුව සිදු කරන අපරාධය මෙම දේශීය ආදායම් පනත නීතිගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමය. මෙම පනත මූල්‍ය අරමුදලේ අවශ්‍යතාවයට සකස් කරන ලද්දක් බව මහ බැංකුවේ අධිපතිවරයාගේ ජූලි 08වැනිදා නිකුත් කළ මාධ්‍ය නිවේදනය සාක්ෂි දරයිඃ එහි දැක්වෙන්නේ, "දෙවන සමාලෝචනය පිළිබඳව විධායක කමිටු සාකච්ඡාවෙන් අනතුරුව දැඩි කාලගුණික තත්වයන් හා ගෝලීය වෙළඳපොළ අස්ථාවරත්වයන් මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාවේ පවතින ස්ථාවර සාර්ව ආර්ථික හා මූල්‍ය තත්වය ජාතික මූල්‍ය අරමුදලේ පැසසුමට ලක්වේ. විශේෂයෙන්ම නව දේශීය ආදායම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වැනි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇගැයීමට ලක්වී ඇත." යනුවෙනි. කාරණය ඉතා පැහැදිලිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වාරිකය පසුගියදා ලංකාව වෙනුවෙන් නිදහස් කළ බවටද මාධ්‍ය වාර්තා පළවිය. මූල්‍ය අරමුදල මෙම ණය වාරික නිදහස් කිරීමට තරම් ප්‍රීති ප්‍රමෝදයට පත්ව ඇත්තේ, මෙම දේශීය ආදායම් පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආණ්ඩුව සමත් වූ නිසාය.

## අයවැය ඉක්මවන සංශෝධන

සාමාන්‍යයෙන් මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රබල සංශෝධන ආණ්ඩුව ඉදිරිපත් කරනු ලබන්නේ, වාර්ෂික අයවැය යෝජනා මගිනි. නමුත් මෙම ආදායම් පනත මගින් අයවැය යෝජනා ඉක්මවන සංශෝධන රැසක් ආණ්ඩුව ඉදිරිපත් කර ඇත්තේ, ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ ඒ පිළිබඳව ප්‍රවීණත්වය ඇති කිසිදු නිලධාරියකුගේ විද්වතුන්ගේ යෝජනා සාකච්ඡාවට ලක් කිරීමකින් තොරවය. දැනට වාර්තා වී ඇති කරුණු අනුව ලංකාවට ඉදිරිපත් කළ මෙම පනත, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සානා රට වෙනුවෙන් සකස්කළ සංශෝධන ආදායම් පනතේ ඡායා පිටපතකි.

## බදු සහන කැපීම

මෙම ආදායම පනත මගින් නව සංශෝධන රැසක් සිදුකර රජයට ලබා ගන්නා බදු ආදායම ඉහළ දමන අතරම, මෙතෙක් ක්‍රියාත්මක බදු සහන රැසක් කප්පාදුවට ලක් කිරීමට යෝජනා කර ඇත. කලින් (2006 අංක 10 පනතින්) වේදිකා නාට්‍යකරුවන්ට තමන් නිෂ්පාදනය කරන නාට්‍ය පළමු වසර සඳහා 50%ක් ආදායම බදු නිදහසක් හිමි වූ අතර නව පනතින් එය ඉවත් කර ඇත. එසේම ලේඛකයින්, පොත් ප්‍රකාශකයින් හා සංගීත නිර්මාණකරුවන්ටද එවැනිම ප්‍රකාශන අලෙවියෙන් 50%ක් ආදායම බදු නිදහසක් පැවැති අතර නව පනතින් ඒ සියල්ල අහෝසි කර ඇත. එසේම යම් පුද්ගලයකුගේ නවෝත්පාදන පර්යේෂණ හෝ නිෂ්පාදන මත ලැබෙන ත්‍යාග ආදායම බද්දෙන් නිදහස් කොට තිබුණද මෙම නව පනතින් ඒ සහනයද ඉවත් කර ඇත.

## විදේශ ශ්‍රමික සහන කැපීම

විදේශිකයකු ලංකාවේ සේවය කර ලබන ආදායම බද්දෙන් නිදහස් කරන ආණ්ඩුව මෙම නව පනතින් "රට විරුවන්" ලෙස සලකා විදේශගත ශ්‍රමිකයින්ට පැවැති විදේශ විනිමය ඉපයීම මත සහන රැසක් කප්පාදුවට ලක් කර ඇත. කලින් පනතේ 13වැනි වගන්තිය මගින් ශ්‍රී ලංකාවෙන් බැහැර සේවා සපයා ලංකාවට එවන විදේශ විනිමය ආදායම් බද්දෙන් නිදහස් වූ අතර නව පනතින් එම නිදහස අහෝසි කර ඇත. එසේම ඒ ආකාරයට විදේශයන්හි ඉදිකිරීම් කොන්ත්‍රාත් කරන අයටද විදේශ රැකියා ඒජන්සි වෙතද තිබූ සහන ඉවත් කර ඇත. මෙම ඉවත් කිරීම් සියල්ල ඉදිරියට ආණ්ඩුවට නව ආදායම් මාර්ග වනු ඇත.

ආණ්ඩුව මුහුණ දී ඇති ආර්ථික අර්බුදයේ තරම මෙම බදු සහන කප්පාදුව හොඳින් අධ්‍යයනය කරන ඕනෑම අයකුට තේරුම් ගත හැකිය. විශ්වවිද්‍යාල සිසුන්ට ලැබෙන ශිෂ්‍යාධාර හා සමාන පරිත්‍යාග, ජනාධිපතිවරයා ලබා දෙන ප්‍රදානයන් හා පරිත්‍යාග, ලලිත කලා හා සාහිත්‍ය ක්‍රීඩා තරගවලින් විශිෂ්ටයින්ට අදාළ ඇමතිවරයාගේ අනුමැතිය මත ලබාදෙන ප්‍රදානයක් රු. 100,000ක් දක්වාද ආදායම් බද්දෙන් මෙතෙක් භුක්ති විඳි නිදහස මෙම නව ආදායම් පනතින් ඉවත් කර ඇත.

එසේම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා මහා බැංකුවේ බලපත්‍රය මත විදෙස් මුදලින් මැණික් හා ස්වර්ණාභරණ විකිණීමේ ආදායම හා මැණික් හා ස්වර්ණාභරණ අපනයනයේදී ලැබෙන ආදායම මෙතෙක් පැවැති පනතින් ආදායම් බද්දෙන් නිදහස් වූ අතර එම සහනයද නව පනතින් අහෝසි කරනු ලැබ ඇත.

වයස අවු.60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවිත රක්ෂණ ඔප්පුවක් කල් පිරීමේදී ලැබෙන ප්‍රතිෂ්ඨාව ආපසු ගෙවීමේදී එය ආදායම් බද්දෙන් නිදහස් වූ අතර නව මූල්‍ය අරමුදලේ පනතින් එම සහනයද ඉවත් කර ඇත. එසේම, පුණ්‍යායතන කෙරෙහිද පැවැති බොහෝ බදු සහන නව පනතින් ඉවත් කරනු ලැබ ඇත.

## වෘත්තිකයින්ට කප්පාදුව

මින් පෙර අයවැය මගින් වෘත්තිකයින්ට තම ඉපැයීම් මත බදුවලට අදාළ කිරීමේ සීමාව ලක්ෂ 12ක් වුවත්, එය නව පනතින් රු. ලක්ෂ 5ක් ඉක්මවන ආදායම ඇති සියල්ලන්ම ආදායම බදු සඳහා අදාළ කරයි. එම බදු අනුපාතයන්ද මීට කලින් පිළිවෙළින් 4%, 8%, 12% හා 16%

15 වැනි පිටුවට



| IMF නව දේශීය ආදායම් පනතේ කප්පාදුවේ සාරංශයක් | |
|---|---|
| 1 | වෘත්තිකයින්නට ආදායම් බදු පැනවීම රු.24 ලක්ෂයේ සීමාව රු. ලක්ෂ 6 දක්වා අඩු කිරීම හා 24%ක උපරිම බදු අනුපාතයක්ද හඳුන්වා දීම (කලින් උපරිමය 16%කි) |
| 2 | වෘත්තීය ආයතනවලට පැවැති බදු නිදහස ඉවත් කිරීම |
| 3 | විදේශ විනිමය ලංකාවට එවන වෘත්තිකයින්ට, ඉදිකිරීම් ආයතනවලට කලින් පැවැති සහන අහෝසි කිරීම. සාමාන්‍ය බදු අනුපාත අදාළය. |
| 4 | වෘත්තිකයින්ට පැවැති සුදුසුකම් ලබන ගෙවීම මත බදු නිදහස (නිවාස ණය වසරකට ලක්ෂ 06 දක්වා) අහෝසි වීම |
| 5 | වේදිකා නාට්‍යකරුවන්, ලේඛකයින්, පොත් ප්‍රකාශකයින්ට පැවැති, ආදායමෙන් 50%ක ආදායම් බදු නිදහස අහෝසි වීම |
| 6 | සංගීත නිර්මාණකරුවන්ගේ ආදායම ලාභ මත බදු නිදහස අහෝසි වීම |
| 7 | පුද්ගලයකුට නවෝත්පාදන පර්යේෂණ හෝ නිෂ්පාදන මත ලැබෙන ත්‍යාග ආදායමට පැවති නිදහස අහෝසි වීම |
| 8 | විදේශ රටවලට සේවා සපයා එවන විදේශ විනිමයට පැවැති ආදායම් බදු සහන අහෝසි වීම |
| 9 | විදේශ රටකදී උපයන විදේශ විනිමය ලංකාවේ ආයෝජකයාට පැවැති ආදායම් බදු නිදහස් කිරීම අහෝසි වීම |
| 10 | විදේශ සේවා නියුක්තිකයකු වෙනුවෙන් රැකියා ඒජන්සි ලද ආදායම බදු නිදහස අවසන් වීම |
| 11 | විශ්වවිද්‍යාල සිසුන්ට ලැබෙන ශිෂ්‍යාධාර, පරිත්‍යාග, හා සමාන ආදායම් සඳහා පැවැති නිදහස අවසන් |
| 12 | කලින් ජනාධිපතිවරයාගේ ප්‍රදානයක්, ත්‍යාග මුදලක් ලබන්නෙකුට හිමි ආදායම් බදු නිදහස අවසන් වීම |
| 13 | ලලිත කලා, සාහිත්‍ය හා ක්‍රීඩා විශිෂ්ටයන්ට අදාළ ඇමතිවරයාගේ අනුමතිය මත ලැබෙන ප්‍රදානයකින් රු. ලක්ෂයක් දක්වා පැවැති බදු නිදහස ඉවත් කිරීම |
| 14 | කලින් මහා බැංකුවේ බලපත්‍ර මත විදේශ මුදලින් මැණික් හා ස්වර්ණාභරණ විකිණීමෙන් ලැබෙන ලාභ ආදායම් බද්දෙන් නිදහස වුවත් නව පනතින් 14%ක් බදු පැනවීම |
| 15 | පුණ්‍යායතනවලට පැවැති බදු නිදහස්කම් බොහෝමයක් නව පනතින් ඉවත් කිරීම |



"රජය පරිපාලනය කිරීම සහ සමාජවාදී සමාජයේ සංවිධානාත්මක වර්ධනය මෙහෙයවීම කළ හැක්කේ ඊනියා උසස් පංතිවල අයට පමණක්ය, ධනවතුන්ට පමණක්ය, ධනවාදයේ පාසලින් ඉගෙනගත් අයට පමණක්ය යන පැරණි, අමන, වනචාරී, තුච්ඡ, පිළිකුල දනවන දුර්මතය කෙසේ හෝ බිඳ දැමිය යුතුය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**07වැනි වෙළුම,**
**79වැනි පිටුව**

# සංවර්ධනයේ නාමයෙන් අනාථයින් බිහිකරන ක්‍රමය වෙනස් කරමු...

### උමාඔය බහුවිනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණේ කැඳවුම්කරු, ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික

## සමන්ත විද්‍යාරත්න සහෝදරයා

*'උමාඔය ව්‍යාපෘතිය හා අනාගත ඉරණම' යන මැයෙන් පසුගිය 24වැනි දින ජාතික විද්වත් සංවිධානය විසින් කොළඹ මහවැලි කේන්ද්‍රයේදී පවත්වන ලද සම්මන්ත්‍රණයේදී ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා විසින් දක්වන ලද අදහස් කාලීන වැදගත්කම සලකා මෙසේ උපුටා දක්වමු.*




මේ වන විට උමාඔය ව්‍යාපෘතිය නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතක ගම්මාන අවදානමකට ලක්වෙලා. නිවාස හත්දහස් පන්සියයකට ආසන්න ප්‍රමාණයක් විනාශයට පත්වෙලා. දිය උල්පත් සහ දිය කඳුරු හාරසිය පනහකට ආසන්න ප්‍රමාණයක් සිඳී ගිහිල්ලා. අක්කර දහස් ගණනක ගොවිබිම් පුරන්වෙලා. ආණ්ඩුවට බරක් නොවී කෘෂිකර්මාන්තයෙන් ජීවත්වූ ජනතාවගේ ආදායම් මාර්ග අහිමි වෙලා තිබෙනවා.

භූ විද්‍යාඥයන් පවසන්නේ, මධ්‍ය කඳුකරයේ භූ ගර්භය භූ කෞතුකාගාරයක් විදිහටයි. ඒ තරමටම භූ විෂමතාවයන් විශාල ප්‍රමාණයක් මධ්‍යම කඳුකරයේ භූ ගර්භයේ තිබෙනවා.

එනිසා එවැනි පරිසරයක භූ අභ්‍යන්තරයේ ඉදිකිරීම් කරන විට ඉතාම පරිස්සම් විය යුතුයි. නමුත් මේ රටේ පාලකයන් ඒවා මායිම් කළේ නැහැ. මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ ජනතාව ආණ්ඩුවට බරක් වුණේ නැහැ. කෘෂිකර්මාන්තයෙන් ජීවත් වුණු ඒ ජනතාව අද ජල හිඟන්නන් බවට පත්වෙලා.

සංවර්ධනයේ නාමයෙන් ආපු ව්‍යාපෘතියක් නිසා ජනතාව අනාථභාවයට පත්වෙලා.

බණ්ඩාරවෙල නගරය බරපතළ හානියකට පත්වෙලා. ඇතැම් ප්‍රදේශවල නිවාස හානියට පත්නොවුණාට ඔවුන්ගේ ඉඩමේ තිබුණු ළිඳ හිඳී ගිහිල්ලා. මේ වන විට පවුල් දහදාහකට ආසන්න ප්‍රමාණයක් ජල හිඟ යෙන් පෙළෙනවා. බවුසර් 40ක් පමණ වතුර අරගෙන පිස්සු බල්ලො වගේ දුවනවා. ආණ්ඩුව කියන විදිහට දිනකට ජල ලීටර් ලක්ෂ හතරහමාරයි දෙන්නේ. නමුත් ජල අවශ්‍යතාවය ලීටර් ලක්ෂ පනහක් පමණ වෙනවා. ඒ ජනතාවට දවස් දහයකට දොළහකට පමණ වතුර ලීටර් පන්සියයක් දෙනවා. නාගන්න විදිහක් නැහැ. අනෙකුත් එදිනෙදා කටයුතු කරගන්න බැරුව ජීවත්වෙන්නේ කොහොමද? මෛත්‍රීට මහින්දට එහෙම ජල හිඟයක් නැති නිසා ඔවුන්ට මේක තේරෙන්නේ නැහැ. මූලික අයිතියක් වෙච්ච ජලය නැතිව මිනිස්සු ජීවත්වෙන් කොහොමද? වැල්ලවායට, තණමල්විලට වතුර දෙන්න හදපු ව්‍යාපෘතියක් නිසා අද උමාඔය අවට ජනතාවට වතුර ගෙනත් දෙන්න වෙලා.

අද බණ්ඩාරවෙල ගොවිජනතාව පමණක් නොවෙයි කම්කරුවන්, මේසන් බාස්වරුන්, වඩුවන්, කුඩා තේවතු හිමියන් පමණක් නොවෙයි, මහා පරිමාණ වතුහිමියන් පවා ආදායමක් නැතිව අර්බුදයකට ගිහිල්ලා. විශාල වතු යායවල් අභාවයට යමින් තිබෙනවා. බණ්ඩාවෙල නගරය කියන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කේන්ද්‍රයයි. දරුවන් තිස්පන්දාහක් විතර ඉගෙන ගන්නවා. ප්‍රධාන පාසල්වල ගොඩනැගිලි පුපුරලා. විද්‍යාගාර දෙපලුවෙලා. අපේ රටට ගුරුවරුන් බිහිකරන බිඳුණුවැව විද්‍යා පීඨයේ ගුරු සිසුන්ගේ නේවාසිකාගාරවලට වතුර නැහැ. ගොවිපළවල් විනාශ වෙලා.

මානව ක්‍රියාකාරකම්ද? - රජයේ ක්‍රියාකාරකම්ද?

මධ්‍යම කඳුකරයට ප්‍රශ්නයක් නම් ඒක මුළු රටටම ප්‍රශ්නයක්. මොකද මුළු රටටම ජල විදුලිය ලැබුණේ මධ්‍යම කඳුකරයෙන් ලැබුණු ගංගා ජලය නිසයි. මධ්‍යම කඳුකරය කියන්නේ රටේ හදවත වගේ. අපිට තේරුම් ගන්න බැහැ භූ ගර්භය ඇතුළේ වෙන්නේ මොනවද කියලා. භූ ගර්භයට වෙන හානි කවුද මනින්නේ. අනාගතයේ මුහුණ දෙන්න වෙන ඉරණම ගැන කියන්න බැහැ. මේ ආණ්ඩුවට කිව්වට තේරුම් ගන්නේ නැහැ. උමාඔයට පාර කිව්වේ එක්සත් ජාතික පක්ෂයවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයවත් වෙනත් දේශපාලන පක්ෂයක්වත් නොවෙයි. උමාඔයට පාර කිව්වේ ස්වභාව ධර්මයයි. රාජපක්ෂ ආණ්ඩුව කිව්වා උමාඔයට දකුණට හැරෙන්න කියලා. දැන් ඒකෙන් සිදුවෙච්ච ව්‍යසනයේ දිග-පළල කියන්න බැහැ. නැගෙනහිර බෑවුම කැබලි වෙලා. පොළොව අභ්‍යන්තරය කැබලිවෙලා ගිහින්. මනුෂ්‍ය ශරීරයේ අවයව වෙන්වුණොත් එකතු කරන්න පුළුවන්. නමුත් මහපොළව කැබලි වුණාට පස්සේ නැවත සකස් කරන්න පුළුවන් ශල්‍යාගාරයක් තියෙනවාද? පහුගිය කාලයේ විමර්ශනයකින් හෙළිවුණා බදුල්ල දිස්ත්‍රික්කය 66.9%ක්ම නාය යෑමේ අවදානමක තියෙනවා. නාය යෑමට ස්වභාවික හේතු වගේම මානව ක්‍රියාකාරකම් බලපානවා. ස්වභාවික හේතු අපිට වළක්වන්න බැහැ. මානව ක්‍රියාකාරකම් වෙනුවට ඒකට රජයේ ක්‍රියාකාරකම් කියලා වෙනස් කරන්න ඕනෑ. අද නැගෙනහිර බෑවුමේ නාය යෑමේ අවදානම වැඩිවෙලා.

2015 මාර්තු 20 අපි මෛත්‍රීපාල ජනාධිපතිතුමා හමුවුණා. ඒ වෙලාවේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කිව්වා උමාඔය කියන්නේ දේශපාලන තක්කඩිකමක් කියලා. පරිසර වාර්තා වැරදියි කිව්වා. ඒ නිසා මේක තාවකාලික නවත්තලා විමර්ශනය කරනවා කියලා කිවුවා. නමුත් ඒ කියපු දේවල් වුණේ නැහැ. ව්‍යාපෘතිය දිගටම කරගෙන ගියා. මහින්ද රාජපක්ෂගේ කාලයේ ඉදිකිරීම් කරල තිබුණේ 16%යි. මුදල් වැයකරලා තිබුණා 42%ක්. නමුත් මෛත්‍රී-රනිල් යහපාලනය යටතේ තමයි ඉදිකිරීම් කටයුතු කළේ. එතකොට මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව මේ විනාශයට වගකිව යුතු නැද්ද? මේ රටේ පාලකයන් මේ විනාශයේ දිග-පළල දකින්නේ නැහැ. ඒ ගැන තැකීමක් නැහැ. ප්‍රශ්නය උග්‍ර වුණහම ජනතාවට ලොසින්ජර් බෙදනවා වගේ සහන දෙන්න හදනවා. බොන්න වතුර නැහැ කිවුවහම නළ ළිං ගහලා වතුර දෙන්න හදනවා. භූ ගර්භයේ තිබෙන ජලය ටික ඇද්දාම ඊට පස්සේ වෙන්නේ විශාල හානියක්.

දැන් අපේ රටේ ආපදා වේගවත් වෙලා. පරිසරය වැරදි විදිහට භාවිතා කරලා ආපදාවන්ට අත වනනවා. ගං වතුරෙන් වෙන විනාශයෙන්, නියඟ යෙන්, නාය යෑම්වලින්, මුහුදු ඛාදනයෙන්, ඩෙංගු විනාශයෙන්, වකුගඩු රෝග පැතිරීමෙන් මැන ගන්න පුළුවන් පරිසරය වැරදි විදිහට භාවිතා කිරීමේ ප්‍රතිඵල මොනවාද කියලා. අපි පරිසරයට අතවර කළා; අභියෝග කළා. ඒවායේ ප්‍රතිවිපාක දැන් අපිට විඳින්න වෙලා. අපේ රටට සංවර්ධනය අවශ්‍යයි. නමුත් එය කළ යුත්තේ පරිසරය විනාශ කරලා නොවෙයි. කියමනක් තිබෙනවා පරිසරයට එල්ල කරන එක කුළුගෙඩි පහරක් වෙනුවෙන් අපිට කුළුගෙඩි පාරවල් සීයකට මුහුණ දෙන්න වෙනවා කියලා. නමුත් දැන් අපි කුළුගෙඩි පහරවල් දහස් ගණනකට ලක්වෙලා ඉවරයි.

සංවර්ධන අනාථයින්

උමාඔය ව්‍යාපෘතියේ විනාශය බරපතළකම තිබෙන්නේ ඉදිරියටයි. අපි මේ විනාශය කරගත්තේ අධික වියදමක් දරලයි. ලෝකෙට ණයවෙලා ගත්ත සල්ලිවලින් අපේ රට විනාශකර ගත්තා. මීරියබැද්ද, සාමසර කන්ද, නායයෑම්වලින් අපේ රටේ ජනතාව සිය ගණනක් වැළලුණා. උමාඔය විනාශයක් ඒ වගෙයි. ඔබට අවශ්‍යනම් අපේ රටේ සංවර්ධනයේ අනාථයන් දැකගන්න උමාඔයට එන්න.

අපේ රටට ඉඩම් පරිහරණය කරන ජාතික සැලැස්මක් නැහැ. නිවාස තනන්න, කෘෂිකර්මාන්තයට යොදා ගන්න, මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘති කරන්න යොදා ගන්නේ කුමන ඉඩම්ද කියලා සැලැස්මක් අපේ රටේ පාලකයන්ට නැහැ. ඒ පිළිබඳව තීරණ ගන්න අපේ රටට ගැලපෙන පාලකයන් පත්කරන්න තවමත් අපේ රටේ ජනතාව තේරුම් අරගෙන නැහැ. නිවර්තන කලාපයේ ජීවත්වන අපේ රටට හිරු එළිය හොඳට ලැබෙනවා. වර්ෂාපතනයෙන් ජලය ලැබෙනවා. ඒ නිසා අපේ කලාපයේ ජනතාවට ජීවත්වෙන්න කෘෂිකර්මාන්තයක් තිබුණා. ඒක අපේ සංස්කෘතියක්. ඒ කෘෂිකර්මාන්තය ඇතුළේ අපේ ආර්ථිකය දියුණු වුණා. සංස්කෘතිය දියුණු වුණා. මනුෂ්‍යත්වය දියුණු වුණා. එම වටිනාකම් අපි ආරක්ෂා කරගත යුතුයි.

අපේ රටේ වැව් තිස්පන්දාහක් පමණ තිබෙනවා. නමුත් අතීතයේ රජවරු වැව් හදනකොට මධ්‍යම කඳුකරයට අත තිබ්බේ නැහැ. මධ්‍යම කඳුකරයට අතවර කළේ නැහැ. දැන් මධ්‍යම කඳුකරයේ සිදුවන සංවර්ධන ව්‍යාපෘති නිසා විශාල හානියක් සිදුවෙනවා. මධ්‍යම කඳුකරයේ සිදුකරන්නේ මිනිස් ඝාතනයට එහා ගිය පරිසර ඝාතනයක්. අපේ රටේ සිදුවන වංචා දූෂණ ගැන හොයන්න එෆ්.සී.අයි.ඩී.ය තියෙනවා. නමුත් මහාපරිමාණයෙන් සිදුවෙන පරිසර හානිය විමර්ශනයට ලක්කරන්න ආයතනයක් නැහැ. අපි ආණ්ඩුවට කියනවා පරිසරයට සිදුවන හානිය ගැන හොයන්න ආයතනයක් පිහිටුවන්න කියලා. එක දෙයක් ගැන අපිට සතුටක් තියෙනවා. අපේ රටේ පරිසර අමාත්‍යාංශයක් නැති කාලෙ, පරිසරවේදීන් හිටපු නැති කාලේ එක විද්වතෙක් මධ්‍යම කඳුකරය විනාශ කරන්න එපා කියලා අනතුරු ඇඟෙව්වා. ඒ, අපේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයායි. එක්දහස් නවසිය හැත්තෑ ගණන්වලදී ඔහු කිවුවා මධ්‍යම කඳුකරයේ ඉහළ ප්‍රදේශ විනාශ කිරීමෙන් ඉදිරි දශක තුන හතර ඇතුළත අපේ රටේ මහා ව්‍යසනයක් සිදුවෙනවා කියලා.

ගොරකා දඩමස් කළ වාර්තාව

උමාඔය වෙනුවෙන් හදපු පරිසර වාර්තාව කියන්නේ ඇත්ත 20%ට, බොරු 80%ක් කලවම් කරලා හදපු එකක්. උමාඔය ව්‍යාපෘතිය යෝජනා කළේ හම්බන්තොටට වතුර ගෙනියන්න. නමුත් උමාඔයට වැසි ලැබෙන කොට, හම්බන්තොටටත් වැසි ලැබෙනවා. උමාඔයට පායන කොට හම්බන්තොටටත් පායනවා. ජල හිඟයත් තිබෙන ප්‍රදේශයකින් තව ජල හිඟයක් තිබෙන තැනකට වතුර දෙන්නේ කොහොමද? මේ පාලකයෝ මේව ගැන හිතුවේ නැහැ. අධ්‍යයනය කළේ නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ මේ තරම් විනාශයක් කරගෙන උමාඔය ව්‍යාපෘතිය වැඩ අවසන් කළත් ඒක අසාර්ථක ව්‍යාපෘතියක් කියලා. මහවැලි ව්‍යාපාරය හදනකොට කිවුවා ඒකෙන් විශාල ප්‍රතිලාභයක් ලැබෙනවා කියලා. එම ව්‍යාපෘතියෙන් හදන ජල විදුලිය ලංකාවට විතරක් නොවෙයි, ඉන්දියාවටත් දෙනවා කිවුවා. දැන් ඉන්දියාවට දෙනවා තියා, අපේ රටේ පරිභෝජනයටවත් විදුලිය ලැබෙනවාද? උමාඔය ව්‍යාපෘතිය මහවැලි ව්‍යාපෘතිය විතරක් නොවෙයි, හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපොළ, ඔළුවිල් වරාය නොරොච්චෝලේ බලාගාරය මේ සියලු ව්‍යාපෘති අසාර්ථකයි. සිදුවුණු පරිසර විනාශයට වියදම් කරපු මුදලට සාපේක්ෂව ප්‍රතිලාභ නැහැ.

උමාඔය පරිසර වාර්තාව බාගෙට හදපු එකක්. නීති විරෝධී එකක්. සම්පූර්ණ ව්‍යාජ වාර්තාවක්. උමාඔය පරිසර වාර්තාව සකස් කළේ මහාචාර්ය ස්වර්ණා පියසීලි ඇතුළු ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 19දෙනෙකුගේ කමිටුවක්. කනගාටුවෙන් වුණත් කියන්න සිද්ධවෙනවා, මේ පිරිස තමන්ගේ උගත්කම ඩොලර්වලට, පවුම්වලට පාවා දුන්නා. ඔවුන් විතරක් නොවෙයි මේකට වගකියන්න ඕනෑ. අපේ රටේ පාලකයනුත් වගකිව යුතුයි. පරිසර වාර්තා තමන්ට ඕනෑ විදිහට හදාගන්න දේශපාලන බලපෑම් කළා. විද්වතුන්ගේ අදහස් නොසලකා, අතැම් වාර්තා හැදුවා. විශාල විරෝධයක් ආවා. අපි ඒවා එදා ඉඳලම හෙළිදරව් කළා. ස්වර්ණා පියසීලි මහාචාර්යතුමිය මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිවුවා, ඔවුන් ඉදිරිපත් කරපු පරිසර වාර්තාව සියයට සියයක් නිවැරදියි කියලා. ඊට පසුවදාම මධ්‍යම පරිසර අධිකාරිය කිව්වා මහාචාර්යතුමියගේ ප්‍රකාශ සාවද්‍යයයි කියලා. ඔවුන් ඉදිරිපත් කරපු පරිසර වාර්තාවේ ඇතැම් කරුණු ගැටලු සහගතයි කිව්වා. දැන් කවුද හරි, කවුද වැරදි? පරිසර වාර්තාව හදපු මහාචාර්යතුමිය පරිසර අධිකාරියට බෝලෙ පාස්කරනවා. මෛත්‍රී, මහින්දට බෝලේ පාස්කරනවා. දැන් ඔය හැමදෙනාම පාස්කරන බෝලේ මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ ජනතාවගේ ඔළුව මත පතිත වෙලා. අපි කියන්නේ මේ හැමදෙනාම වගකිව යුතුයි. පරිසර වාර්තා හදපු අයත් වැරදියි. මධ්‍යම පරිසර අධිකාරියත් වැරදියි. තාක්ෂණික කමිටුවත් වැරදියි. පාලකයිනුත් වැරදියි. ඒ නිසා අපි කියන්නේ මේ සියලු දෙනාට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා.

නව මඟකට හැරිය යුත්තේ ඇයි?

මධ්‍යම පරිසර අධිකාරිය කියන විදිහට උමාඔය පරිසර වාර්තාව වැරදි නම්, ඉතිරි කිලෝ මීටර් 05 උමග හාරන්නේ කොහොමද? ඒ නිසා අපි ජනාධිපතිතුමාට කියනවා දැන්වත් මේක නවත්වන්න කියලා. මෙම ව්‍යාපෘතිය නවත්තලා විනාශයට වන්දි ගෙවන්න කියලා අපි කියනවා. වන්දි ගෙවිය යුත්තේ, ජනතාවගේ බදු මුදල්වලින් නොවෙයි. ඒ වෙනුවෙන් වැරදි කරපු අයගෙන් මුදල් අයකර ගන්න කියලා අපි කියනවා. ඒ වගේම මධ්‍යම කඳුකරයට සිදුකරපු විනාශය පිළිබඳව පුළුල් පරීක්ෂණයක් කරන්න. පරීක්ෂණයක් කරලා මධ්‍යම කඳුකරය යථා තත්ත්වයට පත්කළ හැකි ක්‍රියාමාර්ග ගන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. මොකද ඒක කරන්න පුළුවන්. මීට වඩා මුදල් වැයකළ මහාපරිමාණ ව්‍යාපෘති නවත්වපු අවස්ථා ඕනෑ තරම් වෙනත් රටවලින් උදාහරණයට ගන්න පුළුවන්. ප්‍රංශයේ, කොරියාවේ වැනි රටවල මහාපාරිමාණ උමං ව්‍යාපෘති සිදුවන හානිය හඳුනාගත්තට පස්සේ නවත්වලා දැම්මා. ඒ නිසා වහාම මෙම උමාඔය ව්‍යාපෘතිය නවත්වලා ඒ පිළිබඳව නිසි ආකාරව පරීක්ෂණයක් පවත්වන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. හිතවතුනි, බුද්ධිමතුනි, සහෝදර සහෝදරයිනි, අපි මේ ප්‍රශ්නය නිවැරදිව තේරුම්ගත යුතුව තිබෙනවා. දැන් අපේ රටේ තිබන පාලන ක්‍රමය මොකක්ද? මේ ක්‍රමය

15 වැනි පිටුවට

## දැනුම, සමාජය හා චින්තනය 19

# ඔබ සිතන්නේ හදවතින්ද? මොළයෙන්ද?


"මුළු හදින් මම ඇයට පෙම් කොට අනාගත පෙම් සිහින මැව්වෙමි" යනුවෙන් අපේ ගීත සාහිත්‍යයේ ගීතයක් තිබේ. ලොව පුරාම මෙන්ම ලංකාවේද ගීත සාහිත්‍යය තුළ, කවිය තුළ, හදවත සැලකෙන්නේ ආදරය දැනෙන හා ආදරය කරන ඉන්ද්‍රිය ලෙසය. එක්තරා නවකථාවක නම 'ගොළු හදවත' වන්නේද ඒ අනුවය. සාහිත්‍යයට අනුව මල්සරා මල් හී විදින්නේද හදවතටය. එවිට එක්වන්නේ, 'දෙහදකි' එසේම දුක දැනෙන්නේද හදවතටය. අප සිතන විදිහට අප අවංක වන්නේද හදවතිනි. මේ අනුව මිනිසාගේ හැඟීම්වලට අදාළ (ආදරය, දුක, සතුට, කෝපය) ඉන්ද්‍රිය හදවත ලෙස සමාජය සලකයි. මෙයද අතාර්කික චින්තනයක් සමජගතවී තහවුරු වීමේ ප්‍රතිඵලයකි.

ඈත අතීතයේ විද්‍යාව නොදියුණු යුගයේ මොළයේ ක්‍රියාකාරිත්වය තේරුම් නොගත් යුගයේ මිනිස්සු, මිනිස් හැඟීම් උපදින්නේ හදවතින්යයි සිතුහ. ඒ අනුව අදහස් ප්‍රකාශ කළහ. එය සාහිත්‍ය කලාවන් තුළද තහවුරු විය. එහෙත් පසුව විද්‍යාව විසින් සොයාගනු ලැබුවේ අපගේ චින්තනයට, හැඟීම්වලට, තර්කනයට, භාවයන්ට බලපාන එකම ඉන්ද්‍රිය මොළය බවය. අපගේ සියලුම සිතුවිලි හා සංවේදනා උපදින්නේ මොළය තුළ සිදුවන රසායනික ක්‍රියාවලියක ප්‍රතිඵලය ලෙසටය. ඒවා සමග හදවතට කිසිදු සබඳතාවක් නැත. හදවත සිදුකරන්නේ මොළයේ සෛලවලට අවශ්‍ය පෝෂණය හා ඔක්සිජන් රුධිරය මගින් සැපයීමය.

### හදවතේ කාර්යය කුමක්ද?

සැබවින්ම හදවතේ කාර්ය වන්නේ, සිරුරේ රුධිර සංසරණය පවත්වාගෙන යාමය. සිරුර පුරා රුධිරය බෙදාහරින මධ්‍යස්ථානය හදවත වේ. එයට සිතිය නොහැක. එය විශ්මය ජනක ඉන්ද්‍රියක් බව සැබෑය. එයට සාමාන්‍යයෙන් මිනිසෙකුගේ සාමාන්‍ය ජීවිත කාලය අවු. 80ක් හෝ 90ක් නම් එම මුළුකාලය පුරාම නතරනොවී එකම රිද්මයකින් එකම වේගයකින් සංකෝචනය වෙමින් රුධිරය බෙදාහැරීමේ කාර්යය කළ හැක. එය විවේක ගන්නේ නැත. ලොව නතරනොවී එකදිගට වැඩකරන විශ්මිත යන්ත්‍රය හෙවත් ඉන්ද්‍රිය හදවත වේ. එහෙත් එයට සිතන්නට නොහැක. සත්‍යය එයයි.

අප මෙම සත්‍යය දැන සිටියද දැන් භාවිතයේදී එය නොසලකා කටයුතු කිරීමට අපට සිදුව ඇත. ඒ පුරුද්දේ බලය හා 'හදවත' සිතන ඉන්ද්‍රියයැයි අතීතයේ ඇතිකරගත් වැරදි වැටහීම සමාජගත සංකල්පයක්ව පවතින නිසාය. එම සංකල්පය නොමැතිව දැන් සාහිත්‍ය කලාවට පැවතිය නොහැකි මට්ටමට එය සමාජගතවී අපේ විඥානයේ අතාර්කිකවම තහවුරුවී ඇත. වර්තමානයේ පවා දැනුම එකතුකරන බුද්ධියට අයත් ඉන්ද්‍රිය මොළය ලෙස සලකන මිනිසා හැඟීම්වලට අදාළ ඉන්ද්‍රිය හදවතයැයි අවිඥානිකවම, අතාර්කිකවම සිතයි. අප මෙම කරුණ මෙතරම් මතුකළේ සමාජයක් තුළ අතාර්කික, වැරදි අදහසක් නිර්මාණය වී තහවුරු වූ පසු ඉන් මිදීමට මිනිසාට පහසු නැති බව පෙන්වීමටය. නොදැනුම විසින් බිහිකළ වැරදි සංකල්ප දැනුමට පවා වෙනස් කළ නොහැකි අවස්ථා තිබෙන බව ඉන් පැහැදිලි වේ.



### ධනවාදී වෙළඳපොළ තුළ

මිනිසා තුළ පවතින, මානව සමාජය තුළ පවතින මෙම ස්වභාවය මිනිසා රැවටීම සඳහා මුලාකිරීම සඳහා විවිධ කණ්ඩායම් හා පුද්ගලයන් විසින් යොදාගන්නේ කෙසේද යන්න අපි පසුගිය ලිපියේදීද සාකච්ඡා කළෙමු. නූතන ධනවාදී වෙළඳපොළ මුළුමනින්ම සකස්කර ඇත්තේ මිනිසාගේ මෙම දුර්වලතාවය පදනම්කර ගනිමිනි. ධනවාදී නිෂ්පාදකයා හා වෙළෙන්දා වෙළඳපොළ තුළදී තම නිෂ්පාදන විකුණා ගැනීම සඳහා එක් අතකින් මිනිසා බියට පත්කරති. 'ඔබගේ අස්ථි දිරා පත්වී ඒවා කැඩී යා හැකිය' යනුවෙන් අප බියට පත්කරවන වෙළඳපොළ බලවේග ඉන් මිදීම සඳහා ජනතාවට එක්තරා කිරිපිටි වර්ගයක් පානය කරන ලෙස පවසයි. ඒ සඳහා ඔවුහු නවීන තාක්ෂණික උපකරණ හා නළු නිළියන්ද උපයෝගිකර ගනිති. එවිට අස්ථි දුර්වලව කැඩී බිඳී යා හැකියයි බියට පත්වන අය අදාළ කිරිපිටි වර්ගය ගැනීමට පෙළඹෙති. ඔස්ටියෝ පොරොසිස් නම් එවැනි රෝග තත්වයක් සත්‍ය ලෙසට ඇතිවන අතර එයට ගතයුත්තේ වෛද්‍ය ප්‍රතිකාරය. එහෙත් අතාර්කික චින්තනය ඒ වෙනුවට කිරිපිටි වෙත ඇදේ. හිසකේයාම, හිසකෙස් කැඩීයාම, දත් දිරායාම, සම අවපැහැගැන්වීම ආදි කරුණු මගින්ද මේ බිය වැද්දීම කරන ධනේශ්වර නිෂ්පාදකයා ඉන් බියටපත් ජනතාවට විවිධ ෂැම්පු වර්ග, දත් බෙහෙත් වර්ග, දත් බුරුසු වර්ග, ක්‍රීම් වර්ග විකුණා ගනී.

> තමන්ට වාසනාව උදාකරගැනීමට අසමත් දිළින්දා අන් අයට වාසනාව විකිණීම තුළ වන ප්‍රතිවිරෝධය තේරුම් ගැනීමට මිනිසා උත්සාහ නොකරයි. ඔහු විකුණන ලොතරැයි පතේ වාසනාව තිබේ නම්, එය ඔහු ළඟ තබා නොගෙන විකුණන්නේ ඇයිද යන තර්කනය මිනිසාට අදාළ නැත. ඔහු දිගටම වාසනාව උරගා බැලීමට ගොස් හම්බකරගත් තුට්ටුදෙක නැතිකර ගනී.

මෙම අතාර්කික රැවටීම මෙසේද තේරුම් ගත හැක. සාමාන්‍යයෙන් උපතින්ම සම පැහැපත්, තරුණියක් මුහුණට මේකප් දමාගනිමින් රූපවාහිනිය ඉදිරියේ පෙනී සිට සම පැහැපත් කරන ආලේපන වර්ගයක් ගැන පවසයි. එම ආලේපන වර්ගය වෙළඳපොළට එන්නේද එම මොහොතේමය. එය හඳුන්වාදෙන වෙළඳ දැන්වීම එයයි. ඇය පවසන්නේ, ඇගේ සම පැහැපත්වූවේ එම ආලේපනය නිසා බවය. එය නරඹන අය ඊට රැවටෙති. එදිනම වෙළඳපොළට එන එම ආලේපනය පාවිච්චි නොකළ හෝ නැත්නම් වෙළඳපොළට පැමිණ මසකටත් වඩා අඩු ආලේපනයකින් අර නිරූපන ශිල්පිනියගේ මුහුණ හෝ සම පැහැපත් වීමට ඉඩක් නැතැයි පාරිභෝගිකයා තර්ක නොකරයි. වරලස දිගුව වැඩෙන තෙල් වර්ග හෝ ෂැම්පු වර්ග පිළිබඳ අතාර්කික චින්තනයද එසේය. මෙය මානව සමාජය තුළ රෝගයක් බවට පත්වූ විට එම සමාජය නිවැරදි මඟක ගෙනයාම ඉතාම අපහසු වන අතර මිනිසුන් තමා විසින් තමාටම හානි පමුණුවා ගනු ලබයි. ඒ අතර සමාජයටද හැනි සිදුකරයි. මෙහිදී මිනිසුන් වංචාවේ හා ස්වයං වංචාවේ අඥාන ගොදුරු බවට පත්ව ඇති බව පෙනේ.

### හානියේ තරම

පුද්ගලයෙකුගේ හෝ සමාජයක ජීවිතය අතාර්කික චින්තනය නිසා මිත්‍යා අදහස්වලින් හසුරුවන්නට පටන්ගත් විට එම පුද්ගලයාට හෝ එම සමාජයට සිදුවන හානිය ගණන් බැලිය නොහැක. දශලක්ෂයේ හෝ කෝටියේ වාසනාව උරගා බලන්නැයි මිනිසුන්ට ලොතරැයි විකුණන මිනිසා අන්ත දිළින්දෙකි. එවැනි අය මාර්ග සංඥා පුවරු ළඟ සිටිමින් වාහනවලින් යන අයට 'වාසනාව' විකුණති. ඒ, ජීවිකාව සඳහාය. තමන්ට වාසනාව උදාකරගැනීමට අසමත් දිළින්දා අන් අයට වාසනාව විකිණීම තුළ වන ප්‍රතිවිරෝධය තේරුම් ගැනීමට මිනිසා උත්සාහ නොකරයි. ඔහු විකුණන ලොතරැයි පතේ වාසනාව තිබේ නම්, එය ඔහු ළඟ තබා නොගෙන විකුණන්නේ ඇයිද යන තර්කනය මිනිසාට අදාළ නැත. ඔහු දිගටම වාසනාව උරගා බැලීමට ගොස් හම්බකරගත් තුට්ටුදෙක නැතිකර ගනී.

හමුදා සොල්දාදුවාගේ ආරක්ෂාවට අතේ නූලක් බඳින අතර දේවාලයේ හෝ පන්සලේ ආරක්ෂාවට හමුදාව යෙදවීම තුළ ඇති ප්‍රතිවිරෝධයද එලෙස අතාර්කිකව නොසලකා හරින එකකි. හමුදාවක් රැකීමට දෙවියන්ට හැකිනම් දේවාලය රැකීමට හමුදාවක් කුමකට දැයි මිනිසා නොසිතයි. අනෙක් අතට තමන්ගේ දේවාලය හෝ දේවාලයේ පිංපෙට්ටිය රැක ගැනීමට බැරි, එයට ඉබියතුරු දමන, පොලිස් ආරක්ෂාව යොදවන තත්වයක් තුළ එම දෙවියන් අනෙක් අයව රකින්නේ කෙසේදැයි නොසිතාම දෙවියන් සරණ යාමට මිනිසා පෙළඹෙයි. ඒ සඳහා මුදල් නාස්තිකර ගනී. ඒ අතාර්කික චින්තනය හා මිත්‍යාව තුළ යළියාමේ ප්‍රතිඵලය.

### අතීත සම්ප්‍රදායන්ගේ බලපෑම

කාල් මාක්ස් විසින් රචිත "ලුවී බොනපාට්ගේ බ්‍රෑමයර් දහඅටවැනිදා" නම් ලිපියේ මාක්ස් මෙසේ සඳහන් කරයි. **"මියගිය පරම්පරාවල සම්ප්‍රදායන් ජීවත්වන්නවුන්ගේ හිස් මොළය තුළ නපුරු සිහිනයක් සේ දිස්වෙයි"** යනුවෙනි. මාක්ස් ඉන් පැහැදිලි කරන්නේ මිනිස් චින්තනය තුළ අතීත සම්ප්‍රදායන් විශාල බලපෑමක් කරන බවය. අප තුළ අවිද්‍යාවේ, අද්භූත දේවල්, අතාර්කිකත්වයේ මූලයන් පළමුවෙන්ම ඇතිකරන්නේ ගෘහස්ත පරිසරයේදී වැඩිහිටියන් විසිනි. හොල්මන් කථා, දෙවියන්, යකුන්, ප්‍රේතයන් ගැන කථා, මිත්‍යාවන් පිරුණු සම්ප්‍රදායන් වර්තමානයට එකතුකරන්නේ අතීත පරම්පරාව විසිනි. වර්තමානය විචාරයෙන් තොරව ඒවා කරපින්නාගෙන යාම මගින් එකී මිත්‍යාවන් හා තර්කයෙන් තොර චින්තනය ඊළඟ පරපුරවෙතද ගලා එයි. පාසලේදී විද්‍යාව ඉගැන්වුවද ගෙදරදී ඊට පෙර පුංචි දරුවන්ගේ ඔළුගෙඩි මිත්‍යාවන්ගෙන් පුරවා අවසන් කළ පසු එහි විද්‍යාවට වඩා ප්‍රබල වන්නේ මිත්‍යාවය. එවිට විද්‍යාව විභාග සමත්කිරීමටය; මිත්‍යාව ජීවත්වීමටය. විද්‍යාවෙන් විභාග සමත්වන අය මිත්‍යාව සමග ජීවත්වීම සිදුකරයි.


කුමන අර්ථයෙන් බැලුවද මිනිසා චින්තනය තුළ අතාර්කික බවත්, මිත්‍යාවන් පැවත්මත් යනු ඉතා විශාල ගැටලුවකි. එය සමාජ සංවර්ධනයට බාධාවකි. මිනිස් චින්තනය තර්කානුකූල විය යුත්තේත් තර්කනය මත චින්තනය පදනම් විය යුත්තේත් මිත්‍යාව වෙනුවට විද්‍යාව ජයගත යුත්තේත් ඒ නිසාය.



ඔබට, ඔබ මුහුණ දෙන සියල්ල වෙනස් කළ නොහැක. එහෙත් මුහුණ දීමෙන් විනා ඔබට කිසිවක් වෙනස්කළ නොහැක.

**ජේම්ස් බෝල්ඩ්වින්**

# ඩෙංගු මරණය වෙනුවට ජීවිතය



මේ වන විට ඩෙංගු රෝගය අධිවසංගත තත්වයක් දක්වා වර්ධනය වෙමින් පවතී. මේ වන විට අප රට තුළ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම ආරම්භවී දශක 03ක් පමණ කාලයක් ගත වී පවතින අතර 1988 වසරේ සිට මේ දක්වා 4,44,837 දෙනෙකු රෝගී වූ බවට වාර්තා වී ඇත. ඉන් 2000 කට වඩා වැඩි පිරිසක් මිය ගොස් ඇත. වසංගත රෝග විද්‍යා අංශයේ (Epidemiology Unit) වෙබ් අඩවියේ දත්තවලට අනුව 2017 වසරේ පළමු මාස 07 තුළ වාර්තාව වූ ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව 97,125 ක් වේ.

| මාසය | ඩෙංගු රෝගීන් ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 10927 |
| පෙබරවාරි | 8722 |
| මාර්තු | 13539 |
| අප්‍රේල් | 12498 |
| මැයි | 15881 |
| ජූනි | 22778 |
| ජූලි | 12780 |
| එකතුව | 97125 |

රෝගයේ ස්වාභාවය හා වාර්තා කිරීමේ ගැටලු සලකා

| දිස්ත්‍රික්කය | ඩෙංගු රෝගීන් ප්‍රමාණය |
|---|---|
| කොළඹ | 21282 |
| ගම්පහ | 14386 |
| කළුතර | 5386 |
| නුවර | 5389 |
| ගාල්ල | 3448 |
| මාතර | 3340 |
| යාපනය | 3216 |
| මඩකලපුව | 4315 |
| කුරුණෑගල | 5909 |
| රත්නපුර | 5976 |
| කෑගල්ල | 4622 |

බලන විට සැබැවින්ම රෝගී පිරිස මීට වඩා කිහිප ගුණයකින් වැඩිවිය යුතු වේ. ඒ පෞද්ගලික අංශයේ ඩෙංගු රෝගීන් පිළිබඳව විධිමත්ව වාර්තා කිරීමේ ක්‍රමයක් අපගේ සෞඛ්‍ය පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවන හෙයිනි. මෙම ඩෙංගු රෝගීන්ගෙන් 43% ක් පමණ වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතින් වීම විශේෂත්වයකි.

ඩෙංගු රෝගය යනු වෛරසයක් මගින් බෝවන රෝගයක් වන අතර ආසාධිත මදුරවෙකු වාහකයෙක් ලෙස ක්‍රියා කරයි. මෙවැනි වෛරස් වර්ග 04 ක් හඳුනාගෙන ඇත. (DEN1, DEN2, DEN3, DEN4) ශ්‍රී ලංකාවේ දනට සිටින මදුරු වර්ග 140න් ඊඩිස් ඊජිප්ටයි හා ඊඩිස් ඇල්බොපික්ටස් යන මදුරු විශේෂ දෙක පමණක් ඩෙංගු රෝග කාරක වෛරසය සංසරණය කිරීමට දායක වේ.

ඩෙංගු යනු මිනිස් ප්‍රජාව, මිනිස් ප්‍රජාවේ චර්යාවන්, (විශේෂයෙන් කෘත්‍රිම) පරිසරය, ඊඩිස් මදුරුවන් සහ ඩෙංගු වෛරසයෙන් සමන්විත චක්‍රයකි.

ඩෙංගු රෝගය හා එයින් වැළැකීම පිළිබඳව මේ වන විට ලොව පුරාම රටවල් ගණනාවක පරීක්ෂණ රාශියක් සිදු කෙරී අතිමහත් දැනුම් සමාහාරයක් උකහා ගෙන ඇතිමුත් අප රටේ පාලකයන්ගේ නොහැකියාව නිසා දිනෙන් දින ඩෙංගු රෝගීන් මියයාම විශාල ඛේදවාචකයකි. මේ වන විට විවිධ රටවල් ගණනාවක් මගින් ඩෙංගු චක්‍රයේ විවිධ ස්ථාන තාක්ෂණික උපක්‍රම මගින් ඒවාට රැසක් එකවර අඛණ්ඩව හා දීපව්‍යාප්තව භාවිත කරමින් මර්දනය කළ හැකි බව සාර්ථකව ඔප්පු කර ඇත.

ඩෙංගු බියෙන් ත්‍රස්ත වීමට අවශ්‍ය නොවන මට්ටමකට ඩෙංගු රෝගය පාලනය කිරීමට හෝ කියුබාව වැනි මට්ටමකට ඩෙංගු මැඩ පැවත්වීමට අපට හැකියාවක් තිබුණද ඊට අවශ්‍ය දේශපාලනික නායකත්වය නොමැතිවීම තුළ රෝහල් පද්ධතියට දරාගත නොහැකි මට්ටමකට ඩෙංගු රෝගීන් ප්‍රමාණය ඉහළ යමින් පවතී.

දූපත් රාජ්‍යයන්හිදී මදුරුවන්, බල්ලන් වැනි වාහකයන්ගෙන් බෝවන ඩෙංගු මැලේරියා, ජලභීතිකා වැනි රෝග පාලනය කිරීම හෝ මුලිනුපුටා දැමීමට

> "වසරේ ඇතැම් කාලවලදී ස්වාභාවික හේතු මත ඩෙංගු රෝග ව්‍යාප්තිය අඩුවේ. ඉන්පසු එම කාලවලදී ඩෙංගු මර්දන වැඩසටහන් නවතා දමන ආණ්ඩුව, තම 'මර්දන ව්‍යාපාරයන්' නිසා ඩෙංගු මර්දනය වී ඇතැයි බොරු කියයි. නමුත් අලුයට ගිනි පුපුරු මෙන් මදුරු බිත්තරත් වෛරසයත් සැඟවී සිට නියමිත පාරිසරික තත්වයක් සම්පූර්ණ වූ වහාම හිස ඔසවා සිය ගණන් මිනිසුන් බිල්ලට ගැනීමට ආරම්භ කරයි."

හැකියාවක් ඇත. කියුබාව, හොංකොං, සිංගප්පූරුව, තායිලන්තය වැනි රටවල් උදාහරණ වන අතර මුහුදින් වටවූ රටවල් වීමේ වාසිය යොදාගත් රටවල් 27ක පමණ ජලභීතිකා රෝගය මේ වන විට තුරන් කරනු ලැබ ඇත.

මේ වන විට මෙම වසරේ පමණක් ඩෙංගු මරණ සංඛ්‍යාව 300ක් පමණ වන අතර සෞඛ්‍ය ඇමතිවරයා උදම් අනන්නේ ඩෙංගු රෝගීන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව ඩෙංගු මරණ සංඛ්‍යාව අවම බව කියමිනි. එමෙන්ම ඩෙංගු රෝගීන් වැඩිවීම යනු රටක සංවර්ධනයේ දියුණුව පෙන්වීමේ දර්ශකයක් වශයෙන්ද ඔහු පෙන්වා දී ඇත. මෙවැනි සෞඛ්‍ය ඇමතිවරයෙක් හා ආණ්ඩුවක් දේශපාලන නායකත්වය ලබා දෙන සෞඛ්‍ය අමාත්‍යාංශයක් මගින් ඩෙංගු රෝගීන් ප්‍රමාණය මෙපමණකට හෝ සීමා වීම පුදුමයකි. ඩෙංගු රෝගය අධිවසංගත තත්වයක් දක්වාම වර්ධනය වීමට හේතුව වන්නේ, මෙම රෝගය මැඩ පැවැත්වීමට අවශ්‍ය දේශපාලනික නායකත්වය හා මඟ පෙන්වීම වර්තමාන ආණ්ඩුව විසින් ලබා නොදීම හා හුදෙක් ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සෞඛ්‍ය අංශයට අයත් කාර්යයක් ලෙස පමණක් සලකමින් කටයුතු කිරීමයි. ඩෙංගු යනු දිවයින පුරා ව්‍යාප්ත වූ, මර්දනය සඳහා වසර ගණනාවක් ගතවෙන, රාජ්‍ය ආයතන, පුද්ගලික ආයතන හා මහජනතාව පුළුල් සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කළ යුතු ජාතික ව්‍යාපාරයකි. එවැනි කාර්යයක් සඳහා නායකත්වය හෝ මඟ පෙන්වීම කළ හැක්කේ ආණ්ඩුවකට පමණි. එය තනි තනි මිනිසුන්ගෙන් හෝ තනි තනි සංවිධානවලට පමණක් සිදු කළ නොහැකි වන අතර මනා සැලැස්මක් සහිතව, වගකීමක් ඇතිව සමස්ත ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ආණ්ඩුවක් විසින් සිදුකළ යුත්තකි. ඒ සමග ඩෙංගු මර්දනය කිරීමේ සෘජු වගකීම පැවරෙනුයේ ආණ්ඩුවටය.

1980 දශකයේ සිට බස්නාහිර පළාත්බදව බහුල වශයෙන් ආරම්භ වූ ඩෙංගු රෝගය දීර්ඝකාලීන පාලනය කිරීමට හෝ මර්දනය කිරීමට අප රට පාලනය කළ ආණ්ඩුවලට දක්මක් හෝ අවශ්‍යතාවයක් තිබුනේ නැත. අදටත් මේ පිළිබඳ සියලුම අංශ ආවරණය වන, සියලුම අංශවල සහභාගිත්වය ලබා ගන්නා ආකාරයේ විද්‍යාත්මක සැලැස්මක් මේ ආණ්ඩුවට නැත. ආණ්ඩුව සුපුරුදු පරිදි ඩෙංගු පාලනය කිරීමේ වගකීම ජනතාව මත පටවා ජනතාවට දඩ ගැසීම මගින් අධික මුදලක් උපයාගැනීමට යොමු වී ඇත.

වඳුරන් ගෙවල් සාදාන්නාක් මෙන් ඩෙංගු රෝගීන් බහුලව වාර්තවන කාලවලදී පමණක් මදුරු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. වසරේ ඇතැම් කාලවලදී ස්වාභාවික හේතු මත ඩෙංගු රෝග ව්‍යාප්තිය අඩුවේ. ඉන්පසු එම කාලවලදී ඩෙංගු මර්දන වැඩසටහන් නවතා දමන ආණ්ඩුව, තම 'මර්දන ව්‍යාපාරයන්' නිසා ඩෙංගු මර්දනය වී ඇතැයි බොරු කියයි. නමුත් අලුයට ගිනි පුපුරු මෙන් මදුරු බිත්තරත් වෛරසයත් සැඟවී සිට නියමිත පාරිසරික තත්වයක් සම්පූර්ණ වූ වහාම හිස ඔසවා සිය ගණන් මිනිසුන් බිල්ලට ගැනීමට ආරම්භ කරයි. මේ නිසා රට පුරාම ක්‍රියාත්මක වන දීපව්‍යාප්ත හා තිරසාර (sustainable) ඩෙංගු මර්දන ව්‍යාපෘතියක් නොමැතිකම නිසාත් පවතින විවිධ වැඩසටහන් දේශපාලකයන්ගේ රුචි අරුචිකම් මත වෙනස් වන නිසාත් සිය දහස් ගණන් ජනතාවට සිය ජීවිතවලින් වන්දි ගෙවීමට සිදුවී ඇත.

ඩෙංගු පාලනය කිරීමේ වගකීමෙන් මිදීම සඳහා ආණ්ඩුව බීටීඅයි බැක්ටීරියා ඩෙංගු එන්නත්, ඩෙංගු කීට භක්ෂක මදුරුවන් වැනි උපක්‍රම ගැන බොරු පොරොන්දු දෙමින් කාලය ගත කරයි. ඩෙංගු මර්දනය පිළිබඳ කියුබාවෙන් ඉගෙන ගත යුතු බව පැවසුවත් බලධාරීන්ට ඒ පිළිබඳ ගැඹුරු දැනීමක් නොමැති බව පෙනේ. කියුබාව යොදාගත් මූලික උපායමාර්ගය තුළ මහජන සහභාගිත්වය මහජන ක්‍රියාකාරිත්වය සමග මුසුවූ දේශපාලනික නායකත්වය හා මඟ පෙන්වීම විශේෂ වේ. අප රටේ සිදු නොවන්නේ එයය. ජනතාවට හා බලධාරීන්ට උපදෙස් දෙමින් හා නීතිය මගින් කියුබාවේ කළ දේ ලංකාවේ කළ නොහැකි බව දැන්වත් බලධාරීන්ට වැටහිය යුතුය. උදාහරණයක් ලෙස අද වන විට වැහි පීලි සහිත එක නිවසක් හෝ කියුබාවේ නැත. ඔවුන්ගේ දේශපාලන නායකත්වය එබඳුය.

වසර 70 ක් පමණ කාලයක් තිස්සේ ජනතාවගේ ජීවිත ගැන නොතකන පාලකයන් පත් කර ගත් ජනතාව, පාලනය කළ හැකි රෝගයක් නිසා මියයමින් පවතී. තම වැරදි නිවැරදි කිරීමට ජනතාව මෙන්ම බලධාරීන්ද කටයුතු නොකරන්නේ නම් එළඹෙන වසරේ ඩෙංගු වසංගත තත්වය තවත් දරුණු විය හැකි බවට කිසිම සැකයක් නොමැත.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 ජුලි 04

# කුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් නීති විරෝධීව කටයුතු කරන්නේ ආණ්ඩුවමයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා

(ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)



කුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් අද නීති විරෝධීව කටයුතු කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, ආණ්ඩුවයි. එහිදී අමු-අමුවේ නීතිය උල්ලංඝනය කරනවා. වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එදා පරිසර ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ නිකුත් කරපු ගැසට් නිවේදන තිබෙනවා. ඒ ගැසට් නිවේදන පවා අද උල්ලංඝනය කර තිබෙනවා. මේ දවස්වල තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, කොළඹ නගර සභාවෙන් කුණු ගෙන ගොස් මුතුරාජවෙල අභය භූමියට දමන එක. අභය භූමිය කියන්නේ, පරිසර අමාත්‍යාංශය විසින්ම, ඒ වාගේම වනජීවී අමාත්‍යාංශය විසින්ම විවිධ නියෝග, චක්‍රලේඛ, ගැසට් නිවේදන නිකුත් කරලා වෙන් කරපු භූමි ප්‍රදේශයක්ය කියලා කවුරුත් දන්නවා. 2006 ඔක්තෝබර් මාසයේ 13වන සිකුරාදා නිකුත් කරපු ගැසට් නිවේදනය මා ළඟ තිබෙනවා. මේ ගැසට් නිවේදනය නිකුත් කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන ජනාධිපති, එදා පරිසර ඇමති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. එතුමා නිකුත් කරපු ඒ ගැසට් නිවේදනයේ ඉතා පැහැදිලිව තිබෙනවා. "මෙහි 1වැනි උපලේඛනයේ විස්තර කර ඇති සීමාවන් තුළ පිහිටා ඇති ප්‍රදේශය ඉහත කී පනතේ කාර්යය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවත්, එම නියෝගය මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවත් ...." කියලා.

ඒ අභය භූමියට කවුරුන් හෝ බලහත්කාරයෙන් කුණු දමනවා නම් එය වළක්වන්න උසාවි නියෝගයක් ගන්න, පොලීසිය මැදිහත් කරවා ගන්න තිරසර සංවර්ධන හා වනජීවී ඇමතිවරයාට වගකීමක් තිබෙනවා; බලයක් තිබෙනවා. නමුත් අවාසනාවක තරම්! ප්‍රදේශයේ ජනතාව අවස්ථා කිහිපයකදීම කඳාන පොලීසියට, ජා-ඇල පොලීසියට පැමිණිලි කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. අභය භූමියට කුණු දමන එක නීති විරෝධීයි කියලා. නමුත් පොලීසියට ඉදිරිපත් කරපු පැමිණිලි සම්බන්ධයෙන් විභාග වන්නේ නැහැ; විභාග කරන්නේ නැහැ. මේ ගැසට් නිවේදනයට අනුව මේ අභය භූමියට කුණු බැහැර කරන්න කිසිදු කෙනෙකුට අයිතියක් නැහැ. ඒ ප්‍රදේශයට කුණු ගෙන ගිහින් දමන්න කොළඹ නගර සභාවට තිබෙන නීත්‍යානුකූල බලය; අයිතිය මොකක්ද?

ඇත්තටම ගත්තොත් මේ කුණු ගිහින් දමන්නේ, එතැන තිබෙන ජලයටයි. ජලයට කුණු බැහැර කරන්න කිසිසේත්ම අයිතියක් නැහැ. එය මූලික පාරිසරික නීතින් පවා උල්ලංඝනය කිරීමක්. මේ ජලය අපිරිසිදුවීම නිසා මීගමුව කලපුව විතරක් නොවෙයි, ඒ ප්‍රදේශයේ තිබෙන ඇළවල් සියල්ලම අපිරිසිදු වනවා. ඊට එහා පැත්තේ ජීවත්වන ජනතාවට පානීය ජලය ටිකවත් හරියාකාරව පිරිසිදුව ලබාගන්න බැරි තත්වයක් ඇති වනවා.

වර්තමාන ජනාධිපතිවරයා එදා පරිසර ඇමතිවරයා වශයෙන් නිකුත් කරපු ගැසට් නිවේදනය පමණක් නොවෙයි, වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත තිබෙනවා. ඒ ආඥා පනතට අනුවත් ඒ භූමිය අභයභූමියක් වශයෙන් ඉතා පැහැදිලිව නම් කරලා තිබෙනවා. ඒ භූමියට කැළි කසළ බැහැර කරන්න කිසි කෙනෙකුට නීත්‍යානුකූලව අයිතියක් නැහැයි කියන එක ඒ අඥා පනතේ තිබෙනවා.

කොළඹ මහ නගර සභාව මේ නීතිය කඩන කොට, ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? අඩුම ගණනේ මේ අභයභූමියේ තිබෙන ගහක අත්තක්වත් කපන්න බැහැ කියා සාමාන්‍ය ජනතාවට කියනවා. ගහක අත්තක්වත් කපා ඉවත් කළොත්, පොලීසියෙන් ගිහින් ඒ පුද්ගලයාව අත් අඩංගුවට අරගෙන හිරේ දමනවා; උසාවියට ඉදිරිපත් කරනවා. ඒක තමයි සාමාන්‍ය නීතිය. හැබැයි, ආණ්ඩුව දැනුවත්ව, කැබිනට් මණ්ඩලය අනුමත කරලා මේ කටයුත්ත කරන කොට එතැන නීතිය ක්‍රියාත්මක කරන්නේ කවුද? අධිකරණ ඇමතිවරයා, මේ පාර්ලිමේන්තුවේ මොන තරම් නීති, අණ පනත් සම්මත කළත් වැඩක් නැහැ. මොකද, මේ නීති අමු අමුවේ කඩන්නේ ආණ්ඩුව විසින්මයි. කිසිම කෙනෙක්, කිසිම විධියකට මේ පැමිණිලි විභාග කරන්න එපාය කියා පොලීසියට නියෝග දීලා තිබෙනවා. "එහෙම පැමිණිලි තිබෙනවා තමයි, හැබැයි, ඒවා විභාග කරන්න එපා. මේ වැඩේ නතර කරන්න එපා කියා අපට ඉහළින් කියනවා" කියලා පොලීසිය ඇවිත් අපට කියනවා. මේ කටයුත්ත නීති විරෝධීයි කියා දැන දැන පොලීසිය බලාගෙන ඉන්නවා. බලාගෙන ඉන්නවා විතරක් නොවෙයි. පරිසරය ආරක්ෂා කරන්න ඉදිරිපත් වන එම

15වැනි පිටුවට

2017 ජුලි 05

# හොරු අද 'කෝචොක්' කරන්නේ ලක්ෂ 62ක ජනතාවටයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

(අල්ලස් හෝ දූෂණ කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා පිළිබඳ විවාදය)

සාමාන්‍යයෙන් අල්ලස් හෝ දූෂණය පිළිබඳ කථා කරද්දී හැමදාම භූමිතෙල් ගෑවුණු ගැරඬි වාගේ දඟලන පිරිසක් ඉන්නවා. හොරුන්ට, වංචනිකයන්ට, දූෂිතයන්ට මේ මාතෘකාව කථා කිරීම තරම් අප්‍රිය දෙයක් තවත් නැහැ.

2015 ජනාධිපතිවරණයේ ජනවරම සුවිශේෂී එකක්. ඒ ජනවරම ලැබීමේ ප්‍රධාන කාරණාව තමයි සොරුන්ට, වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් පැමිණවීම. ඒ සඳහා තමයි ලක්ෂ හැට දෙකක ජනතාවක් එකතුවෙලා මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති පුටුවෙන් බස්සලා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව ඒ පුටුවේ වාඩි කරවූයේ.

අද ජනාධිපතිවරයා පත් වී අවුරුදු දෙකහමාරක් ගතවෙන කොට, මේ ආණ්ඩුව පත් වී අවුරුදු දෙකක් ගතවෙන කොට ඒ හොරුන්ට උඩ පැන පැන කෑ ගහන්න අවස්ථාවක් සලසා දී තිබෙන්නේත් මේ ආණ්ඩුවම තමයි. තිබුණු අල්ලස් කොමිසම අකර්මණ්‍ය කරලා. ඒ තිබුණු FCID එක අකර්මණ්‍ය කරලා. දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය ජුනි 30වෙනිදා ඉඳලා අහෝසි කරලා. ඒ තිබුණු files ටික පොලිස්පතිට භාර දෙන්න කියා නියෝග කරලා. ඒ හොරුන්ට නිදැල්លේ සැරිසරන්න ඉඩ දීලා තිබෙන්නේ මේ ආණ්ඩුවයි. පසුගිය වසර දෙකහමාරක කාලය තුළ දූෂණ මර්දන කමිටු කාර්යාලයට පැමිණිලි දහසකට වඩා ලැබී තිබුණා. ඔවුන් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණ කරලා, පැමිණිලි ගොනු කර, FCID එකට පැමිණිලි 288කට ආසන්න ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. එයින් පැමිණිලි 82ක් පූර්ණ විමර්ශනයට ලක් කර, නීතිපති දෙපාර්තමේන්තුවට භාර දුන්නා. නමුත් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ගත වුණු අවුරුදු දෙකහමාරක කාලය තුළ නඩු පවරා තිබෙන්නේ, පැමිණිලි 15ක් සම්බන්ධයෙන් විතරයි. එයින් නඩු ඇසීම ආරම්භ කර තිබෙන්නේ එක පැමිණිල්ලක් සම්බන්ධයෙන් විතරයි. අධිකරණ පද්ධතියේ තිබෙන අධිකරණ දෙකක් හෝ තුනක් වෙන් කරලා මේ හොරුන්ට දඬුවම් දීමේ ක්‍රියාවලිය ඉක්මන් කරන්න ඕනෑ. මොකද, මේ හොරු පිනුම් ගහන්න පටන්ගෙනයි තිබෙන්නේ.

අපි කියන්නේ, පසුගිය කළු දශකයේ රාජපක්ෂලා හොරකම් කරපු දේවල් මේ රටට හෙළිදරවු කළාට විතරක් මදි කියලායි. ඒ අයව අල්ලා නීතිය හමුවට ගෙනෙන්න ඕනෑ. නිකම්ම නිකම් Montessori teacher කෙනෙක් වෙලා සිටි ශිරන්ති නෝනා තමන්ගේ නැන්දාත් එක්ක පැරිසියේ මහා හෝටල්වලට ගිහිල්ලා, ලෝකයේ මිල අධිකම විස්කි පානය කළේ කොහොමද කියලා මේ රට දැන ගන්න ඕනෑ.



එහි බිල කොහොමද කියලා විදේශ අමාත්‍යතුමා කිව්වා. එතැනට යන්න පුළුවන් වුණේ කොහොමද කියලා මේ රට දැනගන්න ඕනෑ.

නිකම්ම නිකම් හොර පාරෙන් නාවික හමුදාවට ගිය යෝෂිත රාජපක්ෂ දෙහිවල ඉඩම් අක්කර ගණන් මිලදී ගත්තේ කොහොමද කියා රට දැනගන්න ඕනෑ විතරක් නොවෙයි. ඒවාට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙන්නත් ඕනෑ. ඒවා අහගෙන යන කොට ඔන්න කියනවා, "ඩේසි ආච්චිගෙන් සල්ලි හම්බ වුණා" කියලා. ඩේසි ආච්චිගෙන් ප්‍රශ්න කරන කොට කියනවා, ඩේසි ආච්චි නිදාගෙන ඉන්න කොට කවුදෝ ඇවිත් මැණික් මල්ලක් දුන්නාලු. මේගොල්ලෝ සල්ලි හම්බ කළ විධිය ගැන ඇහුවොත් කියන්න වන්නේ ඔය වාගේ උත්තර - ඩේසි ආච්චිගේ මැණික් මල්ල වාගේ කථා-තමයි.

> "හොරකම් කරපු සල්ලි වියදම් කරලා දැන් රාජ්‍ය අංශයේ සමහර අය මිලදීගෙන, හොරකම් යටපත් කරගෙන "කෝ, හොරු ඇල්ලුවාද?" කියලා අහනවා. කාටද මේ " කෝචොක්" කරන්නේ? මතක තියාගන්න, කෝචොක් කරන්නේ මේ කැබිනට් මණ්ඩලයට නොවෙයි. මේ ඇමති මණ්ඩලයට නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ මේ කණ්ඩායමට නොවෙයි. තමන්ගේ ජීවිතය අනතුරේ හෙළාගෙන,රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජය කරන්න ඡන්දය දීපු සහ ඡන්ද හදපු මේ රටේ ලක්ෂ 62ක් වන ජනතාවටයි."

රාජපක්ෂලාට කඩේ යන අය ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරන්න පටන්ගෙන තිබෙනවා. දැන් කියනවා, ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ අරමුදල ගැන. ඔව්, අප මැතිවරණ කොමසාරිස්වරයාට අපේ වත්කම් නිවැරදිව එළිදරවු කර තිබෙනවා. පසුගිය 2015 අවුරුද්දේ අපේ ගිණුමේ කෝටි 8ක් තිබෙන බව අප කිව්වා. අපේ සියලු මන්ත්‍රීවරුන්ගේ - පාර්ලිමේන්තුවේ සිට ප්‍රාදේශීය සභාව දක්වා - වැටුප් ඒ ගිණුමට බැර වෙනවා. අප පාවිච්චි කරන වාහන යම් කාලයක් පාවිච්චි කළාට පසුව විකුණුවාම ඒ මුදල අප ගිණුමට බැර කර තිබෙනවා. අප ඒ සියලු කටයුතු පාරදෘශ්‍යව කර තිබෙනවා. හැබැයි, ජනාධිපතිවරණයක්, මහ මැතිවරණයක් කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඔය කල්ලිය මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ වත්කම් ලේඛනය කීයද? ලක්ෂ 190යි - එක්කෝටි අනුලක්ෂයයි. අපටත් කියන්නකෝ, එච්චර මුදලකින් ඡන්ද දෙකක් කළේ කොහොමද කියලා. ඒ ගොල්ලන්ට තමන්ගේ ආදායම් පෙන්වන්න බැහැ. ඇයි? කළු සල්ලි. කළු සල්ලි කොහොමද පෙන්වන්නේ? කළු සල්ලිවලින් දේශපාලනය, ඡන්දය කළ අය; ඒ සල්ලිවලින් පාර්ලිමේන්තුවට ආපු අය දැන් ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරන්න පටන් ගෙන තිබෙනවා.

අප ඇඟිල්ල දිගු කරන්නේ, අපට ඇඟිල්ල දිගු කරන්න හයියක් ශක්තියක් තිබෙන නිසායි. අපි දූෂණ මර්දන කමිටු කාර්යාලය වෙනුවෙන් කථා කරන්නේ, FCID එක වෙනුවෙන් කථා කරන්නේ; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මැතිනිය වෙනුවෙන් කථා කරන්නේ අපට ඒ වෙනුවෙන් කථා කරන්න ශුද්ධ වූ අයිතියක් තිබෙන නිසායි; කාටවත් අපට ඇඟිල්ල දිගු කරන්න බැරි නිසායි; අප කෙළින් කථා කරන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල් ගැනයි. මේ හොරකම් ගැන හොයන්න ඕනෑ කියායි කියන්නේ.

හොරකම් කරපු සල්ලි වියදම් කරලා දැන් රාජ්‍ය අංශයේ සමහර අය මිලදීගෙන, හොරකම් යටපත් කරගෙන "කෝ, හොරු ඇල්ලුවාද?" කියලා අහනවා. කාටද මේ "කෝචොක්" කරන්නේ? මතක තියාගන්න, කෝචොක් කරන්නේ මේ කැබිනට් මණ්ඩලයට නොවෙයි. මේ ඇමති මණ්ඩලයට නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ මේ කණ්ඩායමට නොවෙයි. තමන්ගේ රැකියාව, තමන්ගේ දූ දරුවන්, තමන්ගේ ජීවිතය අනතුරේ හෙළාගෙන, ඒ පිළිබඳව තකන්නේ නැතුව රාජපක්ෂ ජනාධිපතිවරයා පරාජය කරන්න ඡන්දය දීපු සහ ඡන්ද හදපු මේ රටේ ලක්ෂ 62ක් වන ජනතාවටයි මේ "කෝචොක්" කරන්නේ. අපේ වගකීම තමයි ඒ අය ආරක්ෂා කරන එක. ඒ ජනවරම ආරක්ෂා කරන එක.

## කවුළුව හැර තබමි

## "මාස 3කට මට දීල ගේම කොහොමද කියල බලනව..."

සමහර පොඩි දරුවන්ගෙන් සහ සමහර ලොකු බොරු චණ්ඩින්ගෙන් ඉහත වැනි වදන් අපි කොතෙකුත් අසා ඇත. පොඩි එවුන් ඒවා කියන්නේ එක්කෝ හුරතලේටය. නැතිනම් නොදැනුවත්කමටය. එහෙත් රටක නායකයාම එවැනි දේ කියයි නම්..!

පසුගියදා රටේ ජනාධිපතිවරයා වන මෛත්‍රීපාල සිරිසේන මහතා හොරුන් අල්ලන ආයතනවල බලතල මාස 3කට තමාට දී හොරුන් අල්ලන අපූරුව බලන්නයයි "පොර ටෝක්" එකක් දී තිබුණි. ඔහු රටේ 'විධායක' ජනාධිපතිවරයාය. කවුරුවත් එය දිය යුතු නැත. ඔහුට තිබෙන බලතල අනුව ඕනෑම මොහොතක ඒවා තම අතට ගත හැකිය. ඒ, විහිළුවේ එක පැත්තකි. ඔහුගේ ප්‍රකාශයට අනුව දැන් එම කොමිසන්වල සිටින සහ ඊට අදාළ බලධාරීන් කරන්නේ හොරගල් ඇහිඳීමය. සමහර ආයතන ඔහුගේ උපදෙස් පිටම, පිහිටවූ ඒවාය. ඒ, එම විහිළුවේ තවත් පැත්තකි.



ඔහුගේ කටින් කියන තරම් ඔහු 'පොරක්' නම් මුලින්ම කළ යුත්තේ ඔහුගේ විධායක බලතල පාවිච්චි කර හෝ හිටපු සහ දැන් ඉන්න මහා හොරුන් ටික නීතිය හමුවට ගෙන දඬුවම් කිරීමට වහා වහා කටයුතු කිරීමය. එවැනි දෙයකට විධායක බලතල පාවිච්චි කළේනම් රටේ කිසිදු පුරවැසියෙකු ඔහුට දොස් නොකියනු ඇත. ඒ වෙනුවට ප්‍රසංසාම කරනු ඇත. ඔය කියන තරම් ඔහු සුජාත පුත්‍රයෙකු නම් එය ඔප්පුකිරීමට මේ ගත වූ කාලය හොඳටම ප්‍රමාණවත්ය. මිනිසෙකු නමින් කපුරුහාමි වුවාට වැඩක් නැත. එම සුවඳ පැතිරවීමේ ගුණයද තිබිය යුතුය.

## ඔටුනු පළන් චෞරයන්



යම් රටක් පාලනය කරන්නේ, ඔටුනු පළන් චෞරයන් පිරිසක් විසින් නම් ඒ රටට යන කලදසාව ගැන අමුතුවෙන් කිවයුතු නැත. මහා පරිමාණ වංචා හා දූෂණ චෝදනා ගණනාවක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම සඳහා පසුගියදා බැඳුම්කර කොමිසම විසින් හිටපු මුදල් ඇමති රවි කරුණානායකව කැඳවා තිබුණි. එහෙත් ඔහු විවිධ හේතු කියමින් මේ වන විට දෙවතාවක්ම එය මඟහැර තිබේ.

අපේ රටේ බෙදාගෙන සහ බදාගෙන ජනතා සම්පත් බුදින දේශපාලුවන් සිටින අතර ඉහගෙන කන ඇමතියෝද සිටිති. රවි කරුණානායකට තිබෙන චෝදනා අනුව ඔහු කර තිබෙන්නේ, පුදනකොටම කාපි යකා වගේ වැඩකි. සති ගණනක් බඩගින්නේ සිටි සතෙකු කෑමක් අහුවූවිට කාගෙන කාගෙන යනවා වැනි වැඩකි. ටයිකෝට් දමාගෙන පසුගිය ආණ්ඩුවල දූෂණ - වංචා, හොරවැඩ ගැන මහත්මයකු ලෙස වෙස්වළාගෙන චෝදනා කළ රවීගේ සියලු ඇඳුම් දැන් ගැලවී ගොස් හමාරය. ඔහු කියන විදියට ඔහු ඔයතරම්ම සුපිරිසිදු නම් කැඳවූ විගසම බැඳුම්කර කොමිසමට ගොස් මුහුණදිය යුතුව තිබුණි. දැන් ඔහු විදේශ ඇමතිය. රටක විදේශ ඇමතියා නීතියෙන් කට්ටි පනින හොරෙක් නම් විදේශ රටවල් අපි ගැන මොනවා හිතනවා ඇත්ද? ලංකාවට ආ එක් විදේශිකයෙකු අපේ මිතුරෙකුගෙන් මේ ළඟදී අසා ඇත්තේ, උඹලගේ රටේ මිනිස්සු හොරුන්ට මෙච්චර ආදරේ ඇයි කියාය. උන්ටම ඡන්දෙ දෙන්නේ ඇයි කියාය. එකක් නම් පැහැදිලිය. රට යන ක්‍රමය මෙයම නම් රවිලා තව තවත් ඔටුනු පළඳිනු ඇත.

## 'බහුජන හිතාය - බහුජන සුඛාය'

තෙල් සේවකයින්ට පොලීසිය සහ මැරයන් පහර දෙන විට කුජීත ඇමති රාජිත කියන්නේ, එය ජනතාවගේ පැත්තෙන් හිතා ආණ්ඩුව ගත් 'බහුජන හිතාය - බහුජන සුඛාය' වැඩක් කියාය. ආණ්ඩුවට කොන්දක් තියෙන බව පෙන්වීමට ගත් පියවරක් බවය. මෙවැනි කුජීතයන් කරන ප්‍රකාශ ගැන අප පුදුම නොවන මුත් බරපතළ ප්‍රශ්නයක් නම් මේ හමුවේ මතුවේ. කොන්දක් තිබෙන ආණ්ඩුවක් නම් කළ යුත්තේ විදෙස් බලපෑම්වලට යටවී රටේ සම්පත් විකුණා දැමීම නොව ඒවාට එරෙහිව නැගීසිට ඒවා වහාම නතර කර දැමීමය. තෙල් සේවකයන්ට දේශපාලන බලවතෙකුගේ මැරයන් පහර දුන්නේ පොලීසියේද රැකවරණ සහිතව බව රූපවාහිනී දර්ශනවලින් මුළු රටම දුටුවේය. කොන්දක් තිබෙන ආණ්ඩුවක් නම්





කළ යුත්තේ, එම මැරයන් සහ ඔවුන්ට ආරක්ෂාව දුන් පොලිස් නිලධාරීන් සහ ඊට අනුබලය දුන් දේශපාලුවන් අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කිරීමය. ශිෂ්‍යයන් පැහැර ගන්නා විට ආණ්ඩුව කරන්නේ, එම පැහැර ගැනීමට දායක වූ මැරයන් අත්අඩංගුවට ගැනීම නොව ඔවුන්ව රකිමින් ශිෂ්‍යයා පැහැර ගැනීමට නොදී මැරයන්ගෙන් බේරාගත් වෘත්තීය සමිති සහ දේශපාලන නායකයින් දඩයම් කිරීමය. ආණ්ඩුවේ කුජීත ඇමතියාට අනුව 'බහුජන හිතාය - බහුජන සුඛාය' කියන්නේ ඉණබැඳි පටිවලින් සහ දෙකේ හතරේ පොලුවලින් මැරයන් විසින් තෙල් සේවකයින්ට පහරදීමය. තෙල් සංස්ථාව සතු සම්පත් ජනතාව වෙනුවෙන් රකිනවා වෙනුවට ඒවා විදෙස් ජාවාරමුන්ට විකුණාගෙන කෑමය. කොටින්ම දේශපාලුවන්ගේ 'සුඛාය' පිණිස මුළු රටම කා වනසා දැමීමටය.

## පොලිටිකල් පංතිය

"වැටුණා... වැටුණා... දැන් ඉතින්නම් ඉවරයි..." පොලිටික්ක කෑගහගෙන ඇහැරුණේ ඉන්ටවල් එකේ බෙල් එකට. පොලිටික්ක හිටියෙ කැරෙකෙනව වගේ කියලා මේසෙට ඔළුව ගහගෙන.

"ඇයි සර්... මොකද මොකද?" ළමයි ඔක්කොම මේසෙ වටේට පිරුණෙ පොලිටික්කට අමාරුයි කියල හිතාගෙන.

"ඇයි ළමයිනේ... මේ මොකද වටවෙලා" පොලිටික්ක ලැජ්ජාවෙ මොකුත් නොවුණු ගාණට සිද්ධිය වහන්න හදනව. "මට මොකුත් වුණේ නැහැ."

"ඇයි සර් මොකද්ද වැටුණෙ?" ඉස්සෙල්ලම හාරන්න ගත්තෙ මංජුව.

"මං හිතන්නෙ සර් 'බලපු' මැච් එකේ කැච් එකක් අතෑරුණා. පහුගිය මැච්ස්වලදිත් හුඟක් අතෑරුණානෙ." කනිය විශ්ලේෂණේ.

"මං කියන්නෙ සර් ගහට යවපු මිනිහ වැටුණ", "නැහැ... කවුරුහරි පුට්බෝඩ් එකෙන් වැටුණා", "නැහැ... පහුගිය දවස්වල සර්ලගෙ කවුද ආච්චි කෙනෙක් වැටිලා එකතැන් වුණා නේද?" කියවෙන්න ඕනෙ කටින් ඇර හැම කටකින්ම උත්තර පෝලිමේ එනවා.

"හරි හරි ළමයිනේ හේතුව මේකයි..." පොලිටික්ක දැනගත්ත මඟ අරින්න බැරි කඩඉම් ප්‍රශ්නයක් කියල. "මම...

"සර් හිතුවා ආණ්ඩුව වැටුණා කියල... ඇයි මහින්ද මහත්තය කියලා තිබුණනෙ දාහතක් ගලවනවා කියලා." සමන කියද්දි පොලිටික්ක සමනගෙ මූණ දිහා බලාගෙන හිටියෙ පුදුමෙන්.

"අෑ සමන්, මම ඔයාට කලින් කියල තිබුණ නේද?" පොලිටික්ක ඇහුවෙ කිසිම ගාණක් නැතුව.

"නෑ සර්. මට කවුරුවත් කිවුවෙ නෑ. ඒත් මහින්ද මහත්තයලා මේ දවස්වල විකුණන හීනෙ මම දන්නව." සමන කිවුවෙ වහලෙ ලියල තියෙන දෙයක් කියවනව වගේ.

"විහිළු නෙමෙයි ළමයිනේ. ෂුවර් එකටම ගැලවෙනව. ඉතින් ආණ්ඩුව හබක්..." පොලික්ක ටක්කෙටම කියනව.

"ඇත්ත වෙන්න පුළුවන් සර්..." මංජුව කතාකරන්නෙ සපෝට් එකට කියලා පොලිටික්ක හිතුව. "...මහින්ද මහත්තයට කෑලි ගලවල පුරුදුයිනෙ..."

"ඔව් ඔව්... පහුගිය කාලෙ කොච්චරනම් පාර්ලිමේන්තුවෙ පතුරු ගලෝගෙන අලෝගත්තද? එත් අන්තිමට මිනිස්සු ගැලවිලා යනවා එයා දැනන් හිටියෙ නෑ." සමන ඒකටම එකතු කළා.

"හොරු හොරු එකතු වෙනව. නවත්තන්න බෑ." මංජුව සිද්ධාන්තයක් හැදුව.

"ඇයි මේ ආණ්ඩුවෙ හොරු නැද්ද?" පොලිටික්ක ගේම ඉල්ලුව.

"ඇයි නැත්තෙ. හැමදාම කලින් ආණ්ඩුවෙ හොරකම් වහන්නෙ ඔය ප්‍රශ්නෙන් තමයි. ඕක තමයි හොරු බේරන මන්තරේ!" සමන කියන්න ගත්ත. "හොරුත් ඒ බව දන්නව. ඒකනෙ බය නැතුව මේ ආණ්ඩුවට එකතු වුණේ. දෙගොල්ලම අන්‍යෝන්‍ය අවබෝධෙන් වැඩේ දෙනව. අන්තිමට හොරු අල්ලන්න කියල හදපු දූෂණ මර්දන කමිටු කාර්යාලෙත් වහල දැම්ම. දැන් නින්ද යනව ඇතිනෙ." සමන කිවුවෙ පොලිටික්කගෙ ඇස් දෙක දිහා බලාගෙන.

"මං නිකං හොරකන් කරල ඉන්නව වගේනෙ සමන් කිවුවෙ."පොලිටික්කට ලැජ්ජයි.

"නෑ... සර් නිකං හොරු බේරන්න හදනව වගේ දැනුණා. ඒකයි කිවුවෙ." සමනට පොලිටික්ක ගැන දුක හිතුණ. "සර්ලට ඒෑණු බිකක දෙයක්වත් හොරකම් කරන්න බැසිල්ල ඉඩ තිබ්බෙ නෑ කියල අපි දන්නව. දැන් වුණත් ගමේදි ආණ්ඩුව බේරන්න හදන යූඑන්පීකාරයට බැඳුම්කර වංචාවෙන් සත පහක්වත් ලැබුණෙ නෑනෙ. සර්ල කරන්නෙ හැමදාම හොරුන්ට ඡන්දෙ දීල ඊළඟ ඡන්දෙ වෙනකම් උන්ගෙ හොරකම් බේරන්න හදන එක. සර්ලට අපිට පේන්න රණ්ඩු වුණාට හොරු ඔක්කොම එකයි"

"දැන් සර් කැන්ටිමට ගිහින් උණුවෙන් තේ එකක් බොන්න. එතකොට විකාර කැරකිල්ල නතර වෙයි" පොලිටික්ක උත්තරේකට වචන ඇහිඳින අතරෙ මංජුව හීනියට කින්ඩියක් දැම්ම.

## කුණු ප්‍රශ්නය සම්බන්ධයෙන්...

13 පිටුවෙන්



ප්‍රදේශයේ ජනතාවට එරෙහිව ක්‍රියා කරන්නත් පොලීසිය බලහත්කාර විධියට මැදිහත් කරගෙන තිබෙනවා.

ඇත්තටම මේ කුණු ප්‍රශ්නයට ආණ්ඩුව විසඳුමක් හොයාගන්න ඕනෑ. කෙටිකාලීන, දිගුකාලීන විසඳුම් තිබෙනවා කිව්වා. හැබැයි, මේ කොයි එකකවත් ජනාකීර්ණ තැන්වලට කුණු දමන්නය කියා නැහැ. එම නිසා ජනශූන්‍ය ප්‍රදේශයකට මේ කුණු අරගෙන ගිහින් කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. එහෙම කරනවා නම් ජනතාව විරුද්ධ වන්නේ නැහැ: උද්ඝෝෂණ ඇති වන්නේ නැහැ. නිකම්ම ගිහින් කුණු ගොඩවල් බැහැර කරන නිසා තමයි මිනිසුන් ඒකට විරුද්ධ වන්නේ. අද වත්තල දැලතුර ප්‍රදේශයේ මතු වෙලා තිබෙන ප්‍රශ්නය ඒකයි.

මේක ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. ජාතික ප්‍රශ්නයක්. මේ ජාතික ප්‍රශ්නයට පිළිතුරු හොයන්න අද ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. එතැන නීතිය අමු අමුවේ උල්ලංඝනය කරද්දී, එම නීතිය ක්‍රියාත්මක කරන්න අධිකරණ අමාත්‍යාංශයට, නැත්නම් නීතිය පිළිබඳ කටයුතු කරන අයට හැකියාවක් නැතිවෙලා තිබෙනවා. එහෙම නම් අප මේ සභාවේදී කොයි තරම් නීති සම්මත කළත් වැඩක් නැහැ. මෙතැන නීති සම්මත කරලා අප නියෝග පනවනවා. හැබැයි, ඒවා උල්ලංඝනය කරන්නේ, ඒවා කඩන්නේ පැහැදිලිවම ආණ්ඩුවයි. ආණ්ඩුව විසින් නීතිය කඩන කොට ජනතාවට යන්න තිබෙන තැන මොකක්ද? පොලීසියට ගිහින් පැමිණිලි කළාම, එතැන තිබෙන නීතියෙන් වැඩක් වන්නේ නැත්නම්, පාර්ලිමේන්තුවේ කථා කරලා එතැනිනුත් උත්තරයක් ලැබෙන්නේ නැත්නම්, ඊට පස්සේ කොතැනටද යන්නේ? මෙහි පැහැදිලිවම නීති විරෝධී කටයුත්තක් සිද්ධ වෙනවා.

## ආර්ථිකය උඩුයටිකුරු කරන...

09 පිටුවෙන්



වශයෙන් පැවැති අතර නව පනත අනුව 24%ක බදු අනුපාතයක්ද හඳුන්වා දී ඇත. එසේම, මීට කලින් බදු නිදහස ලබාදී තිබූ වෘත්තීය ආයතන හා සංවිධානයන් රැසක් නව පනතින් බදු අයකිරීමට අදාළ කර ඇත. උදා. වරලත් ඉංජිනේරුවරුන්ගේ සංගමය, වරලත් ගණකාධිකාරී ආයතනය, විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය වැනි ආයතන

### කොමසාරිස්ට ඒකාධිපති බලය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමන්විත වන්නේ, ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හා ඔහුගේ යටතේ ඇති බදු කොමසාරිස්වරුන් හා තක්සේරුකරුවන් ආදී වශයෙන් පහළට බලතල විහිදී යන ආකාරයකින්ය. ඒ අනුව සෙසු නිලධාරීන්ට බදු ගණනය කිරීමේදී ස්වාධීනව කටයුතු කිරීමේ බලතල ප්‍රමාණයක් පැවැතිණි. නමුත් නව පනත මගින් සෙසු නිලධාරීන්ට පැවැරෙන බලය මුළුමනින්ම අක්‍රිය කරන හා අසීමිත අධිකාරී බලයක් ආදායම් කොමසාරිස් ජනරාල්ට පැවරෙන වගන්ති ඇතුළත් කරනු ලැබ ඇත. වෙනකක් තබා, ආයතන ව්‍යුහයට අදාළ නොවන පුද්ගලයින් පවා බදු එකතු කිරීමේ ක්‍රියාවලියට පත් කිරීමට බලය නව පනතින් කොමසාරිස්වරයාට පවරා ඇත. ඒ අනුව, බදු එකතු කිරීම පෞද්ගලික අංශයට පැවරීමට කලක් තිස්සේ ආණ්ඩුවට තිබූ අවශ්‍යතාවය මෙමගින් ඉටු කර ගැනීමට මඟ පාදාගෙන ඇත. එසේම බදු වංචාවලට (උදා. සුප්‍රකට වැට් වංචාව වැනි) ලක්වන නිලධාරින්ට සමාවක් දීමේ විශේෂ වරප්‍රසාද බලයක්ද කොමසාරිස් ජනරාල්වරයා වෙත මෙම නව පනතින් ලබාදී තිබේ. එසේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යම් තැනත්තෙකු ඉදිරියේ කරන තමන්ගේ ආදායම් පිළිබඳව බදු වාර්තාවක් ඉතා රහසිගත වන අතර එය පිටස්තර පාර්ශවයන් වෙත ලබා නොදීමේ වගකීම ආරක්ෂා කිරීමේ බදු මූලධර්මයකි. නමුත් ඊට පටහැණි ලෙස ඕනෑම සමාගමක බදු ලේඛන ඇමතිවරයාගේ නිර්දේශ මත විදේශ සමාගම් වෙත පවා ලබා දිය හැකි වගන්ති නව පනතට හඳුන්වා දී ඇත.

ඉහත කරුණු සමස්තය නව දේශීය ආදායම් පනතේ අඩංගු හරයෙන් උපුටා ගත් කොටස් කිහිපයක් වන අතර, මෙම පනත මේ ආකාරයෙන් නීතිගත කිරීමේ දේශපාලන පරමාර්ථය ජනතාව මුලින්ම හඳුනා ගත යුතුව ඇත. ජනතාවට මෙතෙක් ලබාදී තිබූ යම් හෝ සහන කප්පාදු කර තමන්ද ආදායම් හොයා ගැනීමට ක්‍රම හදා ගෙන ඇති බව ඔප්පු කළහොත් පමණක් මූල්‍ය අරමුදල ඔවුන්ගේ ණය වාරිකය ලංකාවට මුදාහරිනු ඇත. ඒ කොන්දේසියට අනුව සකස් කළ මෙම පනත ලාංකේය බදු ගෙවන ජනතාවට පමණක් නොව මුළු මහත් සමස්ත ජනතාවටම පීඩාකාරී කොන්දේසි සහිතය. පනත පමණක් නොව ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී කොන්දේසි පටවන ආර්ථික ක්‍රමයද පරාජය කිරීමේ අභියෝගය මෙම පනතින් රට හමුවේ තබනු ලැබ ඇත.

## ආණ්ඩුව, ආණ්ඩු විරෝධී...

05 පිටුවෙන්




එ.ජා.ප. මන්ත්‍රීවරුන් දැරූ ප්‍රයත්නය කාහටත් දැකගැනීමට හැකි වූ අතර ජනතා විරෝධය නිසා එම ප්‍රයත්නයන් හකුළා ගැනීමට ඔවුන්ට සිදුවිය.

මහින්ද රාජපක්ෂගේ ඒකාබද්ධ කණ්ඩායමද මෙම සටන් තුළට රිංගා ගැනීමට කටයුතු කරමින් සිටී. ඒ සටන දිනා දීමට නොව තමන්ගේ බලය ගැනීමේ සිහිනය වෙනුවෙන් සටන යොදාගැනීමටය. සයිටම් සටන තුළදී මෙන්ම ඌව වෙල්ලස්ස ඉඩම් විකිණීමට එරෙහි සටන තුළත් වරාය හා තෙල් ටැංකි විකිණීමට එරෙහි සටන තුළත් මෙය දැකිය හැක. සටන් කරන බලවේගත්, ජනතාවත් එය හඳුනාගත යුතුය. එසේම සටන ජයග්‍රහණය කිරීමට මෙහෙයවන්නේ නැතිව සටන තම පැවැත්ම වෙනුවෙන් යොදා ගැනීම සඳහා සටන් පටු කිරීමට කැමති සමහර කුඩා කණ්ඩායම්ද සිටිති. සයිටම් සටන තුළද විටින් විට මෙම තත්වය දැකිය හැකිවේ. එම පටු කට්ටිවාදී හැසිරීම් සටනේ ජයග්‍රහණයට බාධාකරන නිසා ජනතා බලවේග ඔවුන් සටන තුළට ඒමද පැරදවිය යුතුය.

පොදුවේ ගත්විට වත්මන් සටන් රැල්ල ආණ්ඩුවට බරපතළ අනතුරු ඇඟවීමක් වන අතර ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට හා ක්‍රියාමාර්ගවලට එරෙහිව එල්ලවූ ප්‍රබල අභියෝගයකි. එසේම මෙම සටන් රැල්ල සටන තුළින්ම නායකයින් බිහිකරන තම සැබෑ නායකත්වය හඳුනාගැනීමට ජනතාවට පහසු කරවන්නක් වී තිබේ. මේවා ජයග්‍රහණය දක්වා ගෙනයා යුතුය. මෙම සටන්වලින් මතුවන සැබෑ ජනතා නායකත්වය හෙට දවසේ ධනවාදය පරදවන සටනේ නායකත්වයද වන නිසා ජනතාව විසින් එය හඳුනා ගැනීම හා එය සමග එක්වීම සාධනීයය. ජනතාව සටන් කරන බලවේග සටනේ අත්දැකීම් තුළින් තම සැබෑ නායකත්වය හඳුනා ගන්නා අතරම සටන තුළ වෙස්වලාගෙන සිටින සතුරු හා සටනට හානිකරන බලවේග හඳුනගෙන ඔවුන්ට නොරැවටීමටද පරෙස්සම් විය යුතුය.

එසේම මෙම සටන් ධනපති ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා බැඳී ඇති නිසා මෙම සටන්වල අවසාන ජයග්‍රහණය ලබාගත හැක්කේ ධනපති ආණ්ඩුවත් ධනපති ක්‍රමයත් පරාජය කිරීමේ පොදු සටනට මේ සියලු සටන් එක් කිරීමෙන්ය යන සත්‍යයද ජනතාව විසින් අවබෝධ කර ගත යුතුව තිබේ.

## සමාජවාදය තුළ...

07 පිටුවෙන්



සමානාත්මතා පදනම මත සියලු අයිතිවාසිකම් ලබාදී ඇත. ජාතිකත්ව පීඩනය අහෝසි කොට ඇත.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 23වැනි වගන්තියේ මෙසේ සඳහන් වේ. "තම රැකියාව නිදහසේ තෝරා ගැනීමටත්, සමාන වැඩට සමාන වැටුප් ලබා ගැනීමටත්, වෘත්තීය සමිති සදහා බැඳීමටත් අයිතිය ඇත". එසේ වුවද මානව හිමිකම් පිළිබඳව ලොවටම උපදෙස් දෙන එක්සත් ජනපදය තුළ සමාන වැඩට සමාන වැටුප් නොලැබේ. කළු ජාතිකයන්ට, සංක්‍රමණිකයන්ට බොහෝ විට ලැබෙන්නේ අඩු වැටුප්ය. එපමණක් නොවේ. එක්සත් ජනපදය තුළ තවමත් කාන්තාවන්ට ලැබෙන්නේ පිරිමින්ට වඩා අඩු වැටුප්ය.

කරන ලද වැඩ ප්‍රමාණය අනුව බෙදා හැරීම සමාජ ඓතිහාසික ක්‍රියාවලියේ දැවැන්ත ඉදිරි පියවරකි. එය අත්පත් කර ගත හැකි වූයේ සමාජවාදය තුළදීය. සමාජවාදය තුළදී නීතිය වන්නේ කරන ලද වැඩ ප්‍රමාණය අනුව බෙදා හැරීමයි. මේ නිසා සමාජවාදය තුළදී පුද්ගලයාගේ ලිංගය, වයස, ජාතිකත්වය, ජනවර්ගය නොසලකා සමාන වැඩට සමාන වැටුප් ලැබීම සහතික කෙරේ.

## සංවර්ධනයේ නාමයෙන්...

10 පිටුවෙන්



පරිසරයට සතුරුයි. කෘෂිකර්මාන්තයට සතුරුයි. අධ්‍යාපනයට සතුරුයි. ජාතික සමගියට සතුරුයි. මේ පාලන ක්‍රමය මිතුරු කාටද? හොරකමට, දුරාචාරයට, රට වැනසීමට මිතුරුයි. මේ සමාජ සැකැස්ම වැඩකරන්නේ එහෙමයි. ඒ නිසා මේ සමාජයේ සැකැස්ම වෙනස් නොකොට මේ සිදුවෙන හානිය වළක්වා ගන්න බැහැ. කාලයක් තිස්සේ පරිසරවේදීන් පරිසර විනාශයට එරෙහිව කෑ ගැහුවා. නිදහස් අධ්‍යාපනය රැකගන්න උද්ඝෝෂණ කළා. කෘෂිකර්මාන්තය රැකගන්න ගොවියෝ උද්ඝෝෂණය කළා. මේ විනාශයන් එකක්වත් වළක්වා ගන්න පුළුවන් වුණාද? අද මේ සමාජය අතරමං වෙලා තිබෙන්නේ. නිදහස් අධ්‍යාපනය රැකගන්න ශිෂ්‍යයො, දෙමව්පියො අරගල කරනවා. කෘෂිකර්මාන්තය රැකගන්න ගොවියො අරගල කරනවා. ධීවර කර්මාන්තය රැකගන්න කියලා ධීවරයෝ අරගල කරනවා. රාජ්‍ය සේවය රැකගන්න රාජ්‍ය සේවකයෝ අරගල කරනවා. දැන් කළ යුතුව තිබෙන්නේ සියලු දෙනාම එකතුවෙලා මේ විනාශය සිදුකරන සමාජ සැකැස්ම වෙනස් කිරීමට අරගල කරන එකයි. පාරිසරික මිතුරු සැකැස්මක්, ජනතාවාදී සැකැස්මක්, ඇතිකර ගත්තොත් මේ ප්‍රශ්නවලට විසඳුමක් තිබෙනවා. හුදෙකලා සටන්වලින් හුදෙකලාවෙමින් තව තවත් විනාශයන් වෙනුවෙන් පාවඩ එළීමක් පමණයි සිදුවෙන්නේ.

## දූෂිතයන්ට දඬුවම් ලබාදිය...

03 පිටුවෙන්



*කළා. එහෙත් ඔවුන් ජනතාවගේ චෝදනාවට ලක්වූ සයිටම් ආයතනය අහෝසි කිරීම ප්‍රතික්ෂේප කරනවා. මෙම තීරණ ද්විත්වය ජ.වි.පෙ. තේරුම් ගන්නේ කොහොමද?*

*අනුර දිසානායක සහෝදරයා:-* විශේෂයෙන්ම මේ වංචා, දූෂණ ක්‍රියාවලිය තනි පුද්ගලයෙකුගේ හිතවක්කාර ක්‍රියාදාමයකට වඩා මේ සමස්ත ජාලයක්. මෙයට දේශපාලකයන් සම්බන්ධවී තිබෙනවා. රජයේ ඉහළ නිලධාරීන් සම්බන්ධවී සිටිනවා. හමුදාවේ පොලිසියේ නිලධාරීන් සම්බන්ධවී සිටිනවා. අධිකරණය සම්බන්ධවී සිටිනවා. යම් කූට ව්‍යාපාරිකයන් සම්බන්ධවී සිටිනවා. පාතාලයේ අපරාධකරුවන් සම්බන්ධවී සිටිනවා. ඒනිසා අපේ රටේ තිබෙන්නේ දූෂණ ජාලයක්. ඒ ජාලය පුපුරුවා හැර වංචනිකයන්ට දූෂිතයන්ට දඬුවම් ලබාදිය හැකි වන්නේ වීර්යසම්පන්න, අරමුණුසහගත පාලනයකට හා දේශපාලනයකට පමණයි.

වර්තමාන පාලනයත් ඉතා පැහැදිලි ලෙසම එම දූෂණ වළල්ලේ කොටස්කරුවන් බවට පත්වෙනවා. ඒ නිසා තමයි වංචා දූෂණය පිළිබඳ දඬුවම් ලබාදෙන්න හෝ වංචා දූෂණ පිළිබඳව විමර්ශනය කරන්න හෝ අපරාධකරුවන් එම වංචනිකයන් එළිදරව් කරන්න හෝ ඔවුන්ට දඬුවම් ලබාදීමට කටයුතු කරනවා වෙනුවට එම ආයතන අඩපණ කරමින් තිබෙන්නේ. විශේෂයෙන්ම දූෂණ මර්දන ලේකම් කාර්යාලය වෙත පසුගිය කාලය පුරාවට ලැබුණේ විශේෂයෙන්ම හිටපු පාලකයන් සහ ඒ පාලනයට හවුල් වූ කණ්ඩායම්වලට අදාළ චෝදනාවන් සහා පැමිණිලි. නමුත් ක්‍රමානුකූලව වර්තමාන අමාත්‍යවරුන්ගේ, වර්තමාන පාලකයන්ගේ සහ ඔවුන්ගේ සමීපතමයන්ගේ තොරතුරු විශාල ප්‍රමාණයක් පැමිණිලි ලෙස දූෂණ මර්දන ලේකම් කාර්යාලය වෙත ලැබෙමින් තිබුණා. ඒ නිසා ඔවුන් ඉතාමත් වේගයෙන් එය අඩපණ කිරීමට කටයුතු කළා. අන්න ඒ අඩපණ කිරීමෙන් තමයි, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය වසාදමා තිබෙන්නේ. 2015 ජනවාරි මාසේ 08වැනිදා ජනතාවගේ අපේක්ෂාවන් හා අරමුණුවලට මුළුමනින්ම පිටුපස හරවා ඊට ප්‍රතිපක්ෂ ලෙස හිටගනිමින් ආණ්ඩුව වංචනිකයන් සහ දූෂිතයන් ආරක්ෂා කිරීමේ කඳවුරට රැකවරණය දී තිබෙනවා.

***නියමුවා:-* බලාපොරොත්තු කඩවීම් තුළ ආණ්ඩුව වේගයෙන් ජනතාව අතරින් ප්‍රතික්ෂේප වෙමින් තිබෙනවා. එසේම නැවත බලයට ඒමට හිටපු පාලනයට සම්බන්ධ කොටස් කැසකවමින් සිටිනවා. එහෙත් සමාජය තවමත් පවතින්නේ සංක්‍රාන්ති සමයක. මේ මොහොත පිළිබඳ ජ.වි.පෙ. දේශපාලන කියවීම කවරාකාරද?***

*අනුර දිසානායක සහෝදරයා:-* ඔව්. ඉතා වේගයෙන් මේ ආණ්ඩුව බලයට පත්කරන ලද බලවේගයන් සියල්ල ආණ්ඩුවෙන් ඈත්කර ගනිමින් තිබෙනවා. ගොවිජනතාව ඇතුළු වැඩකරන ජනතාව අපේ රටේ ශිෂ්‍ය පරම්පරාව, තරුණයින්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේක්ෂාවන් තිබුණ අය, ජාතික සමගිය පිළිබඳ අපේක්ෂාවන් තිබුණ අය, යහපාලනය පිළිබඳ අපේක්ෂා තිබුණ අය, මේ සියලු සමාජ කණ්ඩායම් අද වෙනකොට මේ ආණ්ඩුවෙන් ගිලිහෙමින් තිබෙනවා. ගිලිහෙමින් යනවා.

මේ තත්වය තුළ නව දේශපාලන හිදසක් නිර්මාණය වෙමින් තිබෙනවා. රාජපක්ෂ කල්ලිය මේ දේශපාලන හිදස පිරවීමට උත්සාහ කරන්නේ, සාධනීය දේශපාලන මතයකින් නොවේ. ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදය හෝ යහපාලනය හෝ යහපත් විදේශ ප්‍රතිපත්තියක් හෝ ජාතික සමගිය හෝ යහපත් ආර්ථික ක්‍රමවේදයක් හෝ පිළිබඳ සටන්පාඨයක් හෝ අතට ගැනීමට නොහැකිවී තිබෙනවා. ඒ නිසා මේ ඇතිවෙමින් තිබෙන දේශපාලන රික්තකය පිරවීම සඳහා ජාතිවාදී කඳවුරක් නිර්මාණය කරන්න ඔවුන් උත්සාහ කරමින් සිටිනවා. එය අතිශය බිහිසුණු සහ අපරාධකාරී කඳවුරක්. ඒ නිසා මේ ඇතිවී තිබෙන දේශපාලන හිදස, කිසිසේත්ම ජාතිවාදී කඳවුරකට පිරවීමට ඉඩනොදී යහපත් දේශපාලනයක් සඳහා වූ කඳවුරකින් පිරවිය යුතුව තිබෙනවා.

ඒ වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ මේ වනවිටත් පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමට කටයුතු කරමින් සිටිනවා. මම හිතනවා ඉතිහාසයේ පුළුල් ජාතික කඳවුරක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන ඉතාමත් යහපත් හා හිතකර තත්වයක් දැන් නිර්මාණය වෙමින් තිබෙනවා. ඒ සඳහා අපි රාජ්‍ය සේවකයින්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, පරිසරවේදීන්, වෛද්‍යවරුන්, කලාකරුවන් සහ සාහිත්‍යධරයින්, ගොවි ජනතාව, කම්කරු ජනතාව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් මේ ආදී විවිධ සමාජ බලවේගයන් ඒකාබද්ධ කරමින් පුළුල් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීමේ ක්‍රියාමාර්ගයකට දැන් අපි අවතීර්ණ වී සිටිනවා. මෙම ජනතා විරෝධී පාලනයට එරෙහිව ගොඩනැගෙමින් තිබෙන ජනතා කඳවුරට නායකත්වය සැපයිය හැකි වන්නේ එවැනි යහපත් දේශපාලන කඳවුරකින් පමණක් යැයි අපි විශ්වාස කරනවා. ජනතා විමුක්ති පෙරමුණ මෙම කඳවුරට සක්‍රියව නායකත්වය සැපයීම සඳහා බලවේගයන් සංවිධානය කරමින්, කේන්ද්‍රගත කරන්නට කටයුතු කරමින් සිටිනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




රාජ්‍ය දේපළ රැකගැනීමට විදි බැස...




දිරිය පුරවැසියන් බලමුළු ගන්වා...







සහෝදරත්වයේ දිනය සමරා...



හොංකොං ශ්‍රී ලාංකිකයින් බලමුළු ගන්වා...

## නව දේශීය ආදායම් පනත අයි.එම්.එෆ්. කොල්ලකාරී අරමුණු වෙනුවෙනුයි

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



නව දේශීය ආදායම් පනත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, බදු ගෙවන්නන් සහ බදු ගැන උනන්දුවක් දක්වන අයගේ වුවමනාවන් සලකා බලා සකස් කරන ලද්දක් නොවන බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සකස් කොට කොල්ලකාරී ආර්ථිකයට ගැලපෙන නීතිමය සංශෝධන ඇති කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දක් බව ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 20වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදීය. ආණ්ඩුවේ නව දේශීය ආදායම් පනත් කෙටුම්පත පිළිබඳව වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ පනත මගින් රටටත් ජනතාවටත් අහිතකර බදු සංශෝධන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරනවා. සේවක අර්ථසාධක අරමුදල, ආයෝජනය කිරීමේදී මීට පෙර පනවා තිබූ 10% බදු අනුපාතය 14% දක්වා වැඩිකොට තිබෙනවා. සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය දරන ලක්ෂ 25කට අධික සේවකයින්ට ලැබිය යුතු අරමුදල් මෙම බදු වැඩිවීම හරහා කප්පාදු වෙනවා. ඒ වගේම මීට පෙර නාට්‍යවේදීන්, කලාකරුවන්, සංගීතඥයින් ආදී විවිධ ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය සඳහා ලබාදී තිබූ බදු සහන සම්පූර්ණයෙන් ඉවත්කොට තිබෙනවා. විශ්වවිද්‍යාල සිසුන්ට ලැබෙන ආධාර, ජනාධිපතිවරයා විසින් ලබාදෙන ත්‍යාග, ජීවිත රක්ෂණයක් කල් පිරුණු පසු අවුරුදු 60කට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලැබෙන ප්‍රතිලාභ මීට පෙර බද්දෙන් නිදහස් කොට තිබුණද නව පනත මගින් ඒ සියල්ල බද්දට යටත්කොට තිබෙනවා.

රනිල්-මෛත්‍රී හවුල් ආණ්ඩුව වගකියන්න ඕනෑ, අයි.එම්.එෆ්. එකට නෙවෙයි. **02 පිටුවට**

## රතු තරුවෙන් ඩෙංගු මඩින මෙහෙයුමක්

## ඩෙංගු මඩින්න ආණ්ඩුවට වැඩපිළිවෙළක් නැහැ

**ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා**




ඩෙංගු රෝගය ජුනි වනවිට අධි වසංගත තත්වය දක්වා වර්ධනය වී තිබෙන නමුත් ආණ්ඩුව ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමට අසමත් වී ඇතැයි චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා, මිනිස් වාසස්ථාන අවට ඩෙංගු බෝවීම වළක්වා ගැනීම සඳහා ජාතික යාන්ත්‍රණයක් සකස් කළ යුතුව ඇතැයි පෙන්වා දුන්නේය.

ඔහු මෙම අදහස් ප්‍රකාශ කළේ ජ.වි.පෙ. ඩෙංගු මර්දන වැඩපිළිවෙළ පැහැදිලි කිරීම සඳහා පසුගිය 05වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. බිමල් රත්නායක සහෝදරයා මෙහිදී වැඩිදුරටත් මෙසේද පැවසීය.

"ඩෙංගු වසංගත රෝග වැළැක්වීම සඳහා අපේ රටේ ජාතික ආයතනයක් නැහැ. ඩෙංගු වැළැක්වීමට ජාතික වැඩපිළිවෙළක් නැහැ. දැන් සෞඛ්‍ය අමාත්‍යාංශය කරන්නෙ ඩෙංගු සම්බන්ධයෙන් කරන වැඩමුළුවලට කෑම සපයන එක විතරයි.

ඩෙංගු මර්දනය කිරීම සඳහා අංගසම්පූර්ණ විසඳුමක් නොවුණත් ජනතා විමුක්ති පෙරමුණ රතු තරුව සහන කණ්ඩායම ලබන 8 සහ 9 දිනවලදී ඩෙංගු මර්දනය කිරීමේ වැඩසටහනේ පළමු අදියර ආරම්භ කරනවා. එහිදී විශේෂයෙන් පාසැල් දරුවන්ගේ ආරක්ෂාව සැලසීම මූලික කොටගෙන කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල හම්බන්තොට, යාපනය, කිලිනොච්චිය, ප්‍රදේශවල තෝරාගත් පාසැල් 350කට අධික ප්‍රමාණයකට පිරිසිදු කිරීම් කටයුතු සිදුකරනවා. ඒ සඳහා ඒ වගේම ජනතාව දැනුවත් කිරීම සඳහා පත්‍රිකා බෙදීමේ ව්‍යාපාරයක් සිදුකරනවා. මොකද, ජනතාව මේ සම්බන්ධයෙන් සත්‍ය තත්වය තේරුම් ගත යුතුව තිබෙනවා.

අපේ රටේ ජනාධිපතිවරයා කියුබාව හමුදාව දාලා, ඩෙංගු බෝවන ගෙවල් කඩලා දාලා, ජනතාව හිරේ දාලා තමයි ඩෙංගු මර්දනය කළේ කියලා කිවුවා. ඩෙංගු වැළැක්වීම සාමූහික ක්‍රියාවලියක්. ඒක ඉතාම හොඳින් කරපු රටක් තමයි කියුබාව. ලෝක සෞඛ්‍ය සංවිධානයත් ඒක පිළිගත්තා. රාජිතලා, මෛත්‍රීලා, කියුබාව ගැන කියන මේ කතා පට්ටපල් බොරු. අපි ඉල්ලා සිටිනවා, කියුබාවේ ඩෙංගු බ්‍රිගේඩ් එක ගැන අන්තර් ජාලයේ හොයලා බලන්න කියලා. මහජනතාව, සෞඛ්‍ය සේවකයින්, ගෙන් ගෙට ගිහින් අවුරුදු ගාණක් මහන්සි වෙලා තමයි කියුබාව ඩෙංගු තුරන් කළේ."

## දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය වසාදමා මේ ආණ්ඩුව හොරු රකිනවා

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**



දූෂිත රාජපක්ෂ පාලනය පරාජය කර යහපාලනය යටතේ දූෂිතයින්ට දඬුවම් දෙනු ඇතැයි ජනතාව බලාපොරොත්තු වූ නමුදු වසර දෙක හමාරක් ගත වීමෙන් පසු දකින්නට තිබෙන්නේ, ඒවා හිස් වාක්‍ය පමණක් වී ඇති බවත් ඊනියා යහපාලන ආණ්ඩුවද වංචාව-දූෂණය නාස්තිය අඛණ්ඩව කරගෙන යන බවත් යැයි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ප්‍රකාශ කළේය.

විජිත හේරත් සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. වැඩිදුරටත් ඔහු මෙසේද පැවසීය.

"ආණ්ඩුවේ ඇමතිවරු සම්බන්ධ චෝදනා පිළිබඳව මූලික විමර්ශන සිදුවෙන නිසා කැබිනට් එක තීරණය කරලා දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය වසා දමනවා. එය වසා දැමූ පසු පැමිණිලි කරන්න කාර්යාලයක් නැතිවෙනවා. එවිට එෆ්.සී.අයි.ඩී.යෙන් එලක් වෙන්නේ නැහැ. මොකද පැමිණිලි බාරගන්න එෆ්.සී.අයි.ඩී.යට බලයක් නැහැ. එෆ්.සී.අයි.ඩී.යට පරීක්ෂණ සඳහා පැමිණිලි යොමුකළේ දූෂණ මර්දන ලේකම් කාර්යාලයයි. එම කාර්යාලය වසා දැමීම මගින් එෆ්.සී.අයි.ඩීය අහෝසි කර දැමීමට ආණ්ඩුව උත්සාහ කරනවා. එදා පවුල හොරකම් කළා. අද හවුල හොරකම් කරනවා. මේ ආණ්ඩුව දූෂණ වංචා හොයන යාන්ත්‍රණය අක්‍රිය කරලා. වංචාව-දූෂණය-නාස්තිය ඉහවහා යනවා. මේවට එරෙහිව කටයුතු කරන්න ජනතා විමුක්ති පෙරමුණ හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වෙනුවෙන් එකතු වෙන ලෙස ජනතාවගෙන් ඉල්ලනවා."

## රටේ නැවත ජාතිවාදී ගැටුමක් ඇති වෙන්න ඉඩ දෙන්නේ නැහැ

**සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා**



ජාතිකව පමණක් නොව ජාත්‍යන්තරවද රටට කළු පැල්ලමක් එක් කළ 1983 ජූලි 23 දිනය පසුවී වසර 34ක් ගතවී පැවතියද එය අත්දැකීමක් කර ගනිමින් රටේ ජාතික සමගිය ඇති කිරීමට රටේ පාලකයින් සමත්වී නොමැති බව කියා සිටි සමාජවාදී තරුණ සංගමයේ එරංග ගුණසේකර සහෝදරයා, සමාජවාදී තරුණ සංගමයත් ජනතා විමුක්ති පෙරමුණත් ප්‍රගතිශීලී බලවේගත් සිටිනතුරු නැවත වරක් රටේ ජාතිවාදී ගැටුමක් ඇති වීමට ඉඩ නොදෙන බවට සපථ කර සිටියේය.

මෙම අදහස් පළ වූයේ 'සහෝදරත්වයේ දින වැඩසටහන' පැහැදිලි කිරීම සඳහා පසුගිය 19වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය.





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



# රළ

ද්විමාසික කලා සංස්කෘතික
සඟරාමය අතිරේකය
සමාජවාදී කලා සංගමයේ ප්‍රකාශනයකි.
නව සංස්කරණය 2017 අගෝස්තු
09 වන කලාපය


# ජාතිවාදයට එරෙහි කලාව



**"ලේ ගලන රෝගියකු සිටී නම් රුධිරය අවැසි වහා කැඳවන්න කවියකු කවියකුගේ රුධිරය ගැලපේ එහෙයිනි"**

ශ්‍රේෂ්ඨ රුසියානු කවියකු වූ රසොල් දම්සකොව් වරෙක එසේ ලීවේ ය. සමාජවාදී රුසියාව තුළ කලාවේ සමාජ කාර්යභාරය පිළිබඳව උදාහරණ ඕනෑ තරම් සොයා ගැනීමට තිබේ. අසුන් පිට නැගී බැටලුවන් බලා ගන්නා දේශයක් ලෙස රුසියන් විප්ලවයට පෙර ප්‍රචලිතව පැවැති කිර්ගීසියාවට සමාජවාදී විප්ලවයෙන් පසු හෝඩියක් ලැබුණේ ය. අද ද 'චිංගීස් අයිත්මාතොව්' නම් ශ්‍රේෂ්ඨ නවකතාකරුවාගේ දේශය නමින් කිර්ගීසියාව මහත් අභිමානයට පත් වන්නේ එවැනි පසුබිමක ය. සෑම රුසියානුවකුට ම මානව බැඳීමේ කතාව අවුළුවන, යුද්ධයට, වර්ගවාදයට, ජාතිවාදයට එරෙහිව වීරත්වය පිළිබඳව ලියැවුණු කවි මතකයෙන් මුමුණන්නට තරම් ඒවා ඔවුන්ගේ ජීවිතවලට කා වැදී තිබිණ. "මිනිසාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමේ සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේ යැ"යි මිහායිල් ෂොලහොව්ට ලිවීමට උදාහරණ සපයන්නේ ද මේ පසුබිම තුළ ය.

එක් පැත්තකින් සමාජවාදී රටවල් තුළ මානව බැඳීම් පිළිබඳව කතාව ජාති, ආගම්, කුල භේදයන්ගෙන් තොර උසස් මනුෂ්‍යත්වය වෙනුවෙන් වූ ප්‍රයත්නයක් බවට පත් වෙද්දී ඇඩොල්ෆ් හිට්ලර්ගේ නාසිවාදය මිලියන හයක මහා යුදෙව් ජනතාවක් අමු අමුවේ ගෑස් කුටිවල දමා පුච්චමින් මහා ම්ලේච්ඡ සංහාරයක යෙදෙන්නට අවැසි මානසිකත්වය ගොඩනැගුණේ ගෝත්‍රවාදය තුළිනි; ජාතිවාදය තුළිනි; නාසිවාදය තුළිනි. ලොව පුරා බොහෝ රටවල මෙම ජාතිවාදී ප්‍රවණතාවයන් විවිධ ස්වරූපයෙන් පැනනැගී ජීවිත දහස් ගණනින් බිලිගෙන ඇත.




Pyramid of hate

මෙම ජාතිවාදී ප්‍රවණතාවයන් මතු වී අන්තිමේ දී මහා සංහාරයකින් කෙළවර වීමේ බේදවාචකය මෙසේ වෛරයේ පිරමීඩයකට (Pyramid of hate) පෙළගස්වා තිබේ.

ලොව කොතැනක හෝ සිදු වන ජාතිවාදයන්, වර්ගවාදයන් හෝ සියලු වර්ගයේ බෙදීම් ධනවාදය විසින් උපක්‍රමිකව සිය පැවැත්ම වෙනුවෙන් භාවිත කිරීම පන්ති සමාජය බිහි වීමේ සිට සවිඥානකව සිදු කරන ලද්දකි. ශ්‍රී ලාංකේය භූමිය තුළ ද ජාතිවාදයේ අඳුරු සෙවණැලි වරින්වර මතු වී සමාජ සංවර්ධනයේ ඓතිහාසික ගමන් මඟට බාධා පමුණුවයි. ඈත අතීතයේ සිට වර්තමාන මොහොත දක්වා ම වරින්වර මතු වූ ජාතිවාදයේ කළු පැල්ලම් අවසන මහා බේදවාචකයන්ගෙන් කෙළවර වී ඇත. ඒ පිළිබඳව බොහෝ පාඩම් ඉතිහාසය විසින් අපට කියා දී තිබේ. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ - ශ්‍රී ලාංකේය ජාතියක් හැටියට සහෝදරත්වය හා සමානාත්මතාවය මත සලකන සමාජ ක්‍රමයකින් තොරව ජාතිවාදී ප්‍රවණතාවයන්ට උත්තර සෙවිය නොහැක. කාල් මාක්ස් හා එංගල්ස් කොමියුනිස්ට් ප්‍රකාශනයේ විග්‍රහ කරන පරිදි "එක් මිනිසකු විසින් තවත් මිනිසකු සූරාකෑම කෙළවර කිරීමේ අනුපාතය අනුව ම එක් ජාතියක් විසින් තවත් ජාතියක් සූරාකෑමද අහෝසි වනු ඇත. ජාතියක් තුළ ඇති පන්තීන්ගේ සතුරු ප්‍රතිවිරෝධය අහෝසි වන අනුපාතය අනුවම එක් ජාතියක් විසින් තවත් ජාතියක් කෙරෙහි දක්වන සතුරු ආකල්පයද ද කෙළවර වන්නේ ය." 1917 රුසියානු සමාජවාදී විප්ලවය විසින් ජාතික පීඩනයේ යදම් බිඳ දැමී ය. ජනතාව අතර තිබූ පැරැණි සතුරුකම් අහෝසි කොට ජනතාව අතර අංගසම්පූර්ණ සහයෝගීතාවයකට හා සමීප වීමකට මඟ හෙළි කළේ ය. ලාංකේය සමාජය තුළද මෙවැනි යහපත් සමාජ පරිවර්තනයක් සඳහා මිනිසුන් අවදි කිරීමේ සමත් කාර්යභාරයක් කලාව සහ කලාකරුවා සතු අත්‍යවශ්‍ය වගකීමක් ලෙස පවතී. සාහිත්‍ය කලාව, සිනමාව, වේදිකාව ඇතුළු සියලු කලා මාධ්‍යයන්ගේ දෘෂ්ටිවාදී සවිඥානක මෙන් ම ප්‍රායෝගික මැදිහත් වීමක් මේ මොහොතේ ලාංකේය සමාජයට ඕනෑ කර තිබේ. ජාතිවාදයට එරෙහි මනුෂ්‍යත්වය අවදි කර ගත හැක්කේ ජාතිවාදයට එරෙහිව තම කලා කෘති මගින් කලාකරුවා ජාතික සංවාදයකට ප්‍රවේශ වීමෙන් පමණී, සැබෑ කලාකරුවා යනු, තමා ජීවත් වන යුගයේ ඓතිහාසික අවශ්‍යතාවය හඳුනාගෙන ඒ වෙුනවෙන් සිය කලා භාවිතය හසුරුවන තැනැත්තාය.

## මෑත ඉතිහාසය තුළ ආණ්ඩුවල ප්‍රතිපත්ති මත ජාතිවාදී මං සලකුණු

1947 වර්ෂයෙන් පසුව දේශීය ධනපති පන්තිය විසින් ආණ්ඩු කිරීම අරඹන ලදී. ඒ අනුව වසර 70ක කාලයක පැවැති ආණ්ඩු විසින් ජාතිවාදී තීන්දු තීරණ හා ප්‍රතිපත්ති මෙන් ම විවිධ ජාතිවාදී කණ්ඩායම් සඳහා වරදාන සහ වරප්‍රසාද දීමේ කටයුතු සිදු කළේය.

1947 මැතිවරණයෙන් පසුව බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුව 1949 වර්ෂයේදී පුරවැසි පනත ගෙන එමින් ඉන්දියානු වතු කම්කරුවන්ගේ ඡන්ද අයිතිය උදුරා ගත්තේය. එමෙන්ම, ඉන්දියානු හා පාකිස්තානු ව්‍යාපාරිකයන් ලෙස පැමිණි බෝර ජාතිකයන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කළේය. එකම පනතක් මඟින් පිරිසකගේ වරප්‍රසාද හා අයිතීන් උදුරා ගත් අතර, තමන්ට හිතවත් ධනේශ්වර කොටස් සඳහා ජාතිවාදී පදනමෙන් වරදාන ලබා දුන්නේ ය.

1956 වසරේ දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම මඟින් දෙමළ භාෂාව සිය මව් භාෂාව වශයෙන් භාවිත කරන ශ්‍රී ලාංකේය දෙමළ හා මුස්ලිම් ප්‍රජාව වෙත යම් බලපෑමක් එමඟින් සිදු විය. මෙම සිදුවීම මඟින් එක් අන්තයක සිංහල ජාතිකවාදීන් පෝෂණය කිරීමත්, එම ආණ්ඩු විසින් ගනු ලැබූ එම වැරැදි තීරණ මඟින් දෙමළ ජාතිවාදී කොටස් හට සිය පැවැත්ම .තහවුරු කර ගැනීමට සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව කිරීමෙන් හැකි විය. පසුව එම ආණ්ඩුව විසින් බලය විමධ්‍යගත කිරීමේ එසේ නැතහොත්, ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක් ඇති කිරීම සඳහා රට සභා පනතක් ගෙන එන ලදී. (බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම අනුව) ඒ තුළින් දෙමළ ජාතිවාදී කොටස් වෙත යම් වරදානයක් දීමට උත්සාහ කළද, සැබෑ ලෙස සිංහල, දෙමළ, මුස්ලිම් නිර්ධන පන්තිය බෙදා වෙන් කිරීම සඳහා එම ක්‍රියාමාර්ගය ඉවහල් විය. කෙසේ වෙතත්, රට සභා පනත ක්‍රියාත්මක කර ගැනීමට එම ආණ්ඩුවට නොහැකි විය.

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව හරහා කලින් පැවැති සෝල්බරි ව්‍යවස්ථාව තුළින් සුළු ජාතිකත්වයන්ගේ හා අනෙකුත් ජාතිකත්වයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි සකසා තිබූ අතර, එම තත්වය යම් සමතුලිතතාවය බිඳලමින්, බුද්ධාගමට වැඩි ගෞරව හා ආරක්ෂාව හිමි වන ලෙස පළමු ජනරජ ව්‍යවස්ථාව සකසන ලදී. මේ තුළින් නැති ගැටලුවක් මතු විය. අනෙකුත් ආගම් අදහන ලබ්ධිකයන් හා බෞද්ධාගම

>>ඉතිරිය 03

# සියල්ලට පළමුව ජාතික සමගිය ඇතිකළ හැකි පාලනයක් පත්කරගත යුතුයි

ප්‍රවීණ සාහිත්‍යවේදී **ගුණසේන විතාන**



ජාතිවාදී ප්‍රවණතා අහෝසි කිරීමට ජාතික සමඟිය ඇති කළ හැකි පාලකයන් පත් කර ගත යුතුයි. මෙරට මෙතෙක් පැවැති ප්‍රධාන දේශපාලන ප්‍රවාහයන් දෙකට ම එය කළ නොහැකි බව ඔප්පු කර තිබෙනවා. මෙවර රළ සම්මුඛ සාකච්ඡාව සඳහා සහභාගී වන්නේ ප්‍රවීණ සාහිත්‍යවේදී ගුණසේන විතාන මහතායි.

රළ: **ජාතිවාදය හා එහි ප්‍රවණතා පිළිබඳව ජාත්‍යන්තරව හා ජාතිකව පැවැති ඓතිහාසික පසුබිම පිළිබඳව පැහැදිලි කිරීමක් කළොත්...**

ගුණසේන විතාන: ජාත්‍යන්තරව ජාතිවාදී බලපෑම්, ප්‍රවණතා මතුව ඇත්තේ දේශපාලනික බලපෑම් මුල්කොටගෙනයි. ඉන්දියාව උදාහරණයක් ලෙස ගන්න පුළුවන්. නිදහසින් පසු ඉන්දියාවේ ඇති විය යුතුව තිබුණේ ඉන්දියානු සංකල්පයයි. නමුත්, ඇති වූයේ බෙදීමේ සංකල්පයයි. මෙය කුල, ගෝත්‍ර වශයෙන් බෙදා වෙන් වුණු රටක් බවට පත් වුණා. ඒ අනුව පකිස්ථානයත්, බංගලිදේශයත් බිහි වුණා. යුරෝපය තුළත් විශේෂයෙන් ජර්මනිය තුළ හිට්ලර්ගේ පාලන අවධියේ යම් ගෝත්‍රවාදයක් දැඩිව ක්‍රියාත්මක වුණා. යුදෙව් ජාතිකයන් විශාල ලෙස ඝාතනයට ලක් වුණා. එම සමාජය තුළ ආර්යය ජනයා ලෙස ජර්මානුවන් සංකල්පීය ලෙස ස්ථාපිත කරන්න ගත්ත ප්‍රතිගාමී වියරුවක් විදියට එම තත්වය පෙන්වන්න පුළුවන්. මෙවැනි අවස්ථා දුර්වලත්වයට පත් වූයේ ඔක්තෝබර් විප්ලවයෙන් සෝවියට් දේශය බිහි වීම සමඟයි. එහි ආශ්වාදය යුරෝපයටත් විශේෂයෙන් නැගෙනහිර යුරෝපයටත් ආසියාවටත් අප්‍රිකානු රටවල්වලටත් දැඩිව බලපෑවා. ජාතිවාදය පරාජය වූ මොහොතක් ලෙස එය ඉතිහාසගත වෙනවා. මේ නිසා හුදකලා වූ රාජ්‍යයන් යෝධයන් සේ නැඟිටින්නට වුණා.

ජාතික වශයෙන් ගත්තහම මෙරට ජාතිකවාදයට එරෙහිව ආගම්වාදයේ බලපෑම ජාතිවාදය හිස එසවීමට හේතු වුණා. පුද්ගලභාවය වෙනස් වුණත්, රූපාන්තරණය වී අඩුවැඩි වශයෙන් ජාතිවාදී සෙවණැලි මතු වෙනවා. මෙයට මූලික හේතුව ආගම ප්‍රතිගාමී අවියක් ලෙස සමාජගත කරවීමයි. එය මෙහෙයවන බලවේග සේවය කරනු ලැබුවේ, මේ රටේ ධනපති ක්‍රමයේ රූකඩ නඩත්තු කරන්නයි. බුදුදහම දාර්ශනිකව ගතහොත්, ප්‍රතිගාමීත්වයක් දකින්න නැහැ. සාධාරණ සමාජයක් උදෙසා පදනමක් බුදුදහමේ තියෙනවා. එය දාර්ශනිකව පමණක් සීමා වීම කණගාටුවක්. විද්‍යාලංකාර හා විද්‍යෝදය පිරිවෙන්හි පැහැදිලිව පාර්ශ්ව දෙකක් ඒ කාලයේ හිටියා, විද්‍යාලංකාරය ප්‍රගතිශීලීත්වයට නැඹුරු වුව ද, විද්‍යෝදය ගමන් කළේ ඊට ප්‍රතිවිරුද්ධ දිශාවට. ඒ තුළිනුත්, සංඝ සමාජය සංකල්පීයව බෙදා වෙන් වුණා. මෙම තත්වයන්ගේම බලපෑමක් ලෙස වසර ගණනක් පැවැති යුද්ධය දැක්විය හැකිව තිබෙනවා. එය ආකස්මිකව සිදු වූ දෙයක් නොවේ. මානසික දරිද්‍රතාවය වර්ගවාදී අරගලයකට පාර කැපුවා. ඒ වගේම උතුරු - දකුණු සම්බන්ධතාවය, පැවැති පාලනයන් විසින් දෙකඩ කරනු ලැබුවා. මෙම තත්වය භාෂා භාවිතය තුළින් වඩා හොඳින් දැකිය හැකිව තිබෙනවා.

**ජාතිවාදී තත්ත්වයන් ඉතා සියුම් ලෙස ගෙන එනු ලබනවා. මෙම තත්ත්වය ජනතාවගේ හැඟීම් හා බද්ධ කොට ජාතිවාදී ප්‍රවණතා ලෙස මනෝමූලිකව ගෙන එන්නට උත්සුක වී තිබෙනවා. 1980 යාපනය පුස්තකාලය ගිනි තියනවා. ඊට පසු දින මා යාපනයට යනවා. ඒ දෙමළ ලේඛක ඩොමිනික් ජීවා සමඟ. ගිහින් දෙමළ ලේඛකයන් හමු වුණා. ඒ තත්ත්වයන් විසින් ඇති කරන ලද්දේ විශාල බලපෑමක් බව මට තේරුණා,**

රළ: **රටවල් බෙදා වෙන් කොට සූරාකෑම අධිරාජ්‍යවාදී පාලන උපක්‍රමයක් ලෙස ගෙන ගියා. මේ තත්වය දේශීයව ධනවාදී භාවිතාවක් ලෙස දිගින්දිගටම මතුව ආවා. මේ තත්වය ගැන යම් අදහසක් දැක්වුවහොත්...**

ගුණසේන විතාන: කෘෂිකර්මය පදනම් වූ ආර්ථිකයක් තුළ ගොවියා සමාජයේ මූලික තැනක් ගෙන සිටියා. අපේ රටේ කම්කරු පන්තියක් හිටියේ නැහැ. ගොවිජන ශ්‍රමයක් බිහි වී තිබුණා. මෙය කාල් මාක්ස් දැක් වූයේ 'ප්‍රොලිටේරියන්' යන වචනයයි. එනම් කම්කරුවෝ යන්නයි. මොවුන් නිරන්තරයෙන් ඉඩම් හිමියකුගේ සූරාකෑමට ලක් වුණා. මෙහෙම පැවැති ජන සමාජය පන්තිමය සැකැස්ම අවබෝධය ඇති කළේ වමේ ව්‍යාපාරයයි. ඒ තුළින් කම්කරු පන්තිය යන හැඟීම මතුව ආවා. එහි සටන් රැල්ල ප්‍රගතිශීලීව පැරැණි වම නොතිබුණද, අද දක්වාම පැවත එනවා. සූරාකෑම අධිරාජ්‍යවාදීන් මෙරට තුළ ගෙන ගිය දැවැන්ත සංහාරයක්. එය කර මත පටවා ගත් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක මේ වන විටත් එහි කාර්යභාරය ඉටු කරනවා. වතු වගාව මෙරට ඇති වූ පසු වතුකරයේ විවිධ අයුරින් සූරාකෑම සිදු වුණා. මෙහි දී 'කූලී' කියන වචනය සමාජගත වුණා. අධිරාජ්‍යවාදීන් විසින් වතුකරයේ දෙමළ ජනයා සමඟ කතා කළ යුතු ආකාරය දක්වන්නට 'කූලී ටැමිල්' කියලා පොතක් මුද්‍රණය කළා. මේ හා සමානව අවස්ථාවක් මහත්මා ගාන්ධිට දකුණු අප්‍රිකාවේ දී සිදු වුණා. ඔහුව හැඳින් වූයේ 'කූලී බැරිස්ටර්' කියලා.

කල්යත්ම, මාක්ස්වාදී කියවීමත් එක්ක දේශපාලන නායකයන්ගේ මැදිහත් වීම්ද මත මේ පිරිස දැනුමින්ද සන්නද්ධ වුණා. එය කම්කරු පන්තියට ශක්තියක් වුණා. ජාතිවාදී ලෙස මෙම තත්වයට එරෙහි වූ තත්වයක් එදත් අදත් පාර්ලිමේන්තුව තුළ දකින්න පුළුවන්. එකල ඉන්දියානු වතු කම්කරුවන් ලෙස දැක් වූ මෙම දෙමළ ජනයාගේ පුරවැසිභාවය පිළිබඳව ප්‍රශ්න මතු කළා. මෙය වර්තමානය වන විට ලාංකේය වතු කම්කරුවන් ලෙස දක්වන්න පෙළඹිලා තියෙනවා. මේ හා සමාන තත්වයක් උතුරේත් මතු වුණා. මෙම තත්වයත් වාමාංශික ප්‍රගතිශීලී තත්වයක් තුළින් ජය ගත යුතුව තිබෙනවා. මෙම ජනතාවට සැබෑ සමාජ සාධාරණයක් ලැබිය හැක්කේ මාක්ස්වාදී දර්ශනයත්, ඒ තුළින් ජනතා සේවයත් සපයන සැබෑ දේශපාලන ව්‍යාපාරයකට පමණයි. මේ තත්වය සාහිත්‍යය තුළද ශේෂ වී පවතිනවා. වතුකරයේ සාහිත්‍යය යන්න කඳුකරයේ සාහිත්‍යය ලෙස වෙනස් විය යුතුයි. මා එකල එලෙසින් හැඳින්වූවා. මෙහි දි සිදු වූ තවත් අර්බුදයක් වන්නේ මහා ජාතිය හා සුළු ජාතිය ලෙස වර්ග කිරීමයි. ජාතියක් සුළු වෙන්න විදියක් නැහැ විය හැක්කේ කුඩා ජාතියක් වීමයි. අර්ථකථනයන්ගේ භාවිතයද විශාල ලෙස ජාතිවාදයට උත්තේජනයක් සපයා තිබෙන බව මේ තුළින් පෙනී යනවා. සුළු තත්ත්වයකින් පටන්ගෙන වුණත්, ජාතිවාදය පරාජය කිරීමේ හැකියාව, ජනතාවට ළං වීමේ හැකියාව, අවස්ථාව තියෙනවා.

රළ: **ලොව බෙහෝ රටවල් ධනවාදය විසින් ගෙන යන ජාතිවාදී උපක්‍රමයන්ගෙන් දැඩිව පීඩාවට පත් වී සහ පත් වෙමින් තිබෙනවා. මෙම තත්වය විසඳීමට ගත යුතු ක්‍රියාමාර්ගය කුමක්ද?**

ගුණසේන විතාන: මීට හොඳ නිදසුනක් තමයි, දකුණු අප්‍රිකාවේ 'අපාතයිඩ්' ව්‍යාපාරය. එහි දී විජාතිකයන්, ස්වදේශිකයන්, කුඩා ජාතීන්

විශාල ලෙස අරගලයක් කළා. එයින් පැහැදිලිව පෙනුණේ රට සූරාකනු ලබන්නේ ධනපති සංවර්ධනය බවයි. මෙහිදී ඇලෙක්ස් ලැගූමා වැනි ලේඛකයන් විශාල සේවාවක් ඉටු කළා, ධනවාදයෙන් මිදෙන්නට එහි අවසානයේ ඔහුව පිටුවහල් කරනු ලැබුවා. නමුත් හිටපු කියුබානු නායක ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා කියුබානු පුරවැසිභාවය ලබා දීලා මියෙන මොහොත තෙක් රැකබලා ගත්තා. ජාතිවාදී තත්වයන් ඉතා සියුම් ලෙස ගෙන එනු ලබනවා. මෙම තත්වය ජනතාවගේ හැඟීම් හා බද්ධ කොට ජාතිවාදී ප්‍රවණතා ලෙස මනෝමූලිකව ගෙන එන්නට උත්සුක වී තිබෙනවා. 1980 යාපනය පුස්තකාලය ගිනි තියනවා. ඊට පසු දින මා යාපනයට යනවා. ඒ දෙමළ ලේඛක ඩොමිනික් ජීවා සමඟ. ගිහින් දෙමළ ලේඛකයන් හමු වුණා. ඒ තත්වයන් විසින් ඇති කරන ලද්දේ විශාල බලපෑමක් බව මට තේරුණා,

මේ තත්වයට මේ රට ගෙන ගිය පාලකයන් වගකිව යුතුවා සේම එය වෙනස් කිරීමට විකල්පයක් බලයට පත් කළ යුතු බවක් පෙනී යනවා. අනෙක් පැත්තෙන් මේ රටේ ලේඛකයන් කිහිප දෙනෙකු ඇරෙන්න බහුතරය පටු අරමුණු තුළ තම සේවය ලබා දෙනු ලබන්නේ පුද්ගලවාදී අවශ්‍යතාවයන් හරහා ධනවාදය ශක්තිමත් කිරීමටයි. මෙම තත්වය වහා නිවැරදි විය යුතුයි. විශේෂයෙන් ඩොමිනික් ජීවා, අගස්තියන්ලා හිටියේ රට එක් කිරීමේ සංකල්පයත් සමඟයි. මේ සඳහා දෙමළ ලේඛකයන් විශාල අරගලයක් ගෙන ගියා. සිංහල ලේඛකයන් බොහොමයක් ජාතිවාදය ව්‍යාප්ත කළා. සංවිධානයක් ලෙස 'ජනතා ලේඛක පෙරමුණ' මෙයට සෘජුව දායකත්වය සැපයුවා. මේ තත්වය වටහාගෙන රටේ බුද්ධිමතුන්, වියතුන් දැඩිව මේ සඳහා ඉදිරිපත් විය යුතුව තිබෙනවා. මේ රටේ පාලනයේ සිට අධ්‍යාපනය හා විවිධ පැතිකඩයන්ගේ ඇති ජාතිවාදය පලවා හැර නව මාවතකට ගෙන යා හැකි දේශපාලන නායකත්වයකට රට භාර කළ යුතුව තිබෙනවා. එය හොඳින් වටහාගෙන පොදු සතුරා එකෙකු බව තෝරා ගනිමින්, සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව තම පීඩිත තත්වයෙන් මිදීමට සමගි සම්පන්නව පෙරට පැමිණීම වර්තමානයේ දී වැදගත් කාර්යයක් බවට පත් වෙනවා.

**රළ: ජාතිවාදී ප්‍රවණතා, උපායමාර්ග, මැදිහත් වීම් සාතිශය බහුතර ජනයා දැඩි පීඩාවකට පත් කර තිබෙනවා. මෙම තත්වයන් තුළ පීඩිත ජනයාට තිබෙන පිළිතුර ඔබ දකින ලෙස කුමක් විය යුතු ද?**

ගුණසේන විතාන: ජාතිවාදී ප්‍රවණතා අහෝසි කිරීමට පළමුව ජාතික සමඟිය ඇති කළ හැකි පාලනයක් පත් කර ගත යුතුයි. මෙරට මෙතෙක් පැවැති ප්‍රධාන දේශපාලන ප්‍රවාහයන් දෙකම එය කළ නොහැකි බව ඔප්පු කර තිබෙනවා. ඒ නිසා විශ්වාසයෙන් යුක්තව නව සමාජ ක්‍රමයක් අපේක්ෂා කිරීම මෙම තත්වයෙන් මිදෙන්නට තිබෙන පිළිතුරයි. එය ලෙහෙසි පහසු කටයුත්තක් නොවන්නේ අධිරාජ්‍යවාදී මැදිහත් වීම් හා එහි බලපෑම් විවිධ මුහුණුවරින් විටින් විට පැනනැඟීමත්, ධනවාදයට සේවය කරන්නා වූ පිරිස් විවිධ නිලතල දැරීමත්, සමාජයීය වශයෙන් බලපෑම් කණ්ඩායම් ලෙස හුදු ජාතිවාදී නැඹුරුවකින් පැමිණීම මතයි. මේ පීඩනය තවදුරටත් ඉදිරියට ගෙන යා යුතු ද යන්න ජනතාව බුද්ධිමත්ව සිතා බලා සහජීවනය හා ජාතිකත්වය උදෙසා ගරා වැටෙමින් තිබෙන ධනවාදයට මීට වඩා දෙයක් කළ නොහැකි බව වටහාගෙන නිවැරැදි දේශපාලන තීන්දුවක් ගත යුතුව තිබෙනවා.

**රළ: මේ ගමනේ දි කලාකරුවා සතු කාර්යය කෙබඳු විය යුතු ද?**

ගුණසේන විතාන: ජර්මානු නාසිවාදය තුළ බිහි වූ සුවිශේෂී නාට්‍යකරුවෙකු ලෙස බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් දැක්විය හැකියි. මුළු මහත් ජනතාවකට ඔහුගේ නිර්මාණාත්මක අගයන්ගේ බලපෑම ලබා දෙනු ලැබුවා. එය දැඩි දුෂ්කරතා මැද තම වගකීමක් ලෙස ගෙන ආවා. අපේ රටට සාපේක්ෂව එවැනි නිර්මාණකරුවන් මතුව ආවේ නෑ. නිර්මාණ කිහිපයක් ඇරෙන්න බහුතරය සේවය කළේ ජාතිවාදී, ප්‍රතිගාමී අදහස් දරන දේශපාලන ප්‍රවාහයන්ට. වරදාන, වරප්‍රසාද තුළ අදත් එදත් කලාකරුවන් තම ප්‍රගතිශීලී ගමන් මඟ පාවා දීම සිදු කරමින් සිටිනවා. පටු දේශපාලන අරමුණින් බැහැරව නිවැරැදි සමාජයීය තත්වයක් සඳහා 1958 හදිසි තත්වයේ සිට හැත්තෑව දශකය පුරා ද, අසූතුනේ කළු ජූලිය පුරා ද, ඊළාම් සංග්‍රාමය පුරා ද අවැසි අමුද්‍රව්‍ය ඕනෑ ම නිර්මාණකරුවකුට ඇති තරම් තිබෙන රටක් තුළ යථාර්ථය පසෙකලා පවිත්‍ර මාක්ස්වාදී ශික්ෂණයෙන් බැහැරව කටයුතු කිරීම තව දුරටත් බුද්ධිමත් නොවේ.

ජාතිවාදයට විරුද්ධව සහෝදරාත්මක සහයෝගයකින් සූරාකෑම අහෝසි කොට සෑම ජාතිකත්වයකටම තම සංස්කෘතිය තුළ ශීඝ්‍ර වර්ධනයක් සඳහා විශේෂිත පරිසරයක් ගොඩනඟන සමාජවාදී ප්‍රවණතාවයකින් යුත් පුනරුදයක් උදෙසා කලාකරුවන් පමණක් නොව සමස්ත ජනයා ද එක් විය යුතු කාලය මේ වන විට එළැඹ තිබෙනවා.

■

# මෑත ඉතිහාසය තුළ

>>01 පිටුවෙන්

අදහන ලබ්ධිකයන් අතර යම් අසමාන ලෙස අයිතීන් බෙදී යාමක් දක්නට විය. තව ද, 1972දී ඇති කරන ලද විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කිරීමේ දී ප්‍රමිතිකරණය මඟින් උතුරු පළාතෙන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගනු ලබන ශිෂ්‍යයන් ප්‍රමාණයක් අඩු විය. මේ තුළින් උතුරේ තරුණයන් පැවැති ආණ්ඩු කෙරෙහි වෛරයක් ගොඩනැඟුණේය. එය දෙමළ ජාතිවාදී නායකයන් විසින් සිය පටු අරමුණු ඉටු කර ගැනීමට එම තරුණ කොටස් උපයෝගී කර ගත් බවට සාධක පිළිබිඹු විය.

1977න් පසුව බලයට පත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මඟින් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය ඉතාමත් සංකීර්ණ අඩියක් දක්වා වර්ධනය කළේය. ඒ යටතේ 1981 පැවැති දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයේ දී යාපනය ජනතාවගේ ඡන්ද අයිතිය අමු අමුවේ කොල්ලකෑම, යාපනය පුස්තකාලය ගිනි තැබීම, 1983 ජූලි ජාතිවාදී කෝලාහල ඇති කිරීම දැක්විය හැකි ය. පසුව උතුරේ ඇති වූ සන්නද්ධ නැඟිටීම සිය පටු දේශපාලන අරමුණු සඳහා එවකට පැවැති ආණ්ඩුව උපයෝගී කර ගත්තේ ය. 1977 බලයට පත් ආණ්ඩුවේ වැරැදි විදේශ ප්‍රතිපත්තිය මත විශේෂයෙන් ම 1987 ඉන්දු ලංකා ගිවිසුම මගින් රටේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය විනාශකරමින්, ඉන්දියානු මැදිහත් වීම මත බලය බෙදාහැරීමේ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ විය. කෙසේ වෙතත්, එම ක්‍රියාමාර්ග තුළින් ජාතික ගැටලුව විසඳනවා වෙනුවට ඒවා උග්‍ර වන තත්වයක් නිර්මාණය විය. ඉන් පසුව පැවැති රජයන් විසින් සිංහල හා දෙමළ ජාතිවාදී කොටස්වල වුවමනා-එපාකම් මත විවිධ දේශපාලන ක්‍රියාමාර්ග ගෙන එන ලදී. 'පැකේජය', 'සුනාමි සහන මණ්ඩලය', 'සටන් විරාම ගිවිසුම' ආදිය දැක්විය හැක. එමෙන් ම, ජාතිවාදී ධනපති කණ්ඩායම්වල අවශ්‍යතාවයන් ඉටු කිරීමට යාම තුළින් ජාතික සමඟිය මෙන්ම සහජීවනය ද බිඳවැටිණි.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ උතුරේ සන්නද්ධ අරගලය නිමාවට පත් වුව ද, සැබෑ ලෙස ජාතික සහජීවනයක් ගොඩනැඟුණේ නැත. ඒ වෙනුවට දෙමළ හා සිංහල ජාතිවාදී කොටස් සඳහා වෙන වෙන ම වරදාන සහ වරප්‍රසාද ලබා දෙන ලදී. උදාහරණ ලෙස ඩග්ලස් දේවානන්ද ප්‍රමුඛ ඊ.පී.ඩී.පී. කණ්ඩායමටත්. රිෂාඩ් බදියුදීන් ප්‍රමුඛ මුස්ලිම් කොන්ග්‍රසයෙන් ඉවත් වූ කණ්ඩායම්වලටත්, එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් ඉවත් වූ කරුණා අම්මාන් හා පිල්ලෙයාන් වැනි කණ්ඩායම් සඳහා වරප්‍රසාද, වරදාන ලබා දුන්නේ ය. එමෙන් ම, සිංහල ජාතිවාදී කණ්ඩායම් රැසක් වෙත ද විවිධ වරප්‍රසාද, වරදාන ආණ්ඩුවේ අනුග්‍රහයෙන් ලබා දුන්නේ ය. ඒ අනුව 'බොදු බල සේනා', 'සිංහල රාවය', 'රාවණා බලය', 'ජාතික හෙළ උරුමය' වැනි සංවිධාන දැක්විය හැක. මහින්ද රාජපක්ෂ පාලනය තුළ විශේෂයෙන් ම මුස්ලිම් ජනතාව හට අලුත්ගම, ධර්ගා නගරයේ ඇති වූ සිදුවීමත් රට පුරා මුස්ලිම් ප්‍රජාවගේ විවිධ ආගමික මධ්‍යස්ථාන වෙත සිදු කරන ලද රාජ්‍ය මැදිහත් වීම සහිත ප්‍රහාර මඟින් ඔවුන් මුස්ලිම් අන්තවාදී දේශපාලනය වෙත තල්ලු කිරීමට උත්සාහ කළේ ය. විශේෂයෙන් ම රට තුළ මෙවැනි ජාතිවාදී ප්‍රවණතාවයන් සඳහා දේශපාලන අනුග්‍රහය හිමි වීම තුළින් සැබෑ ජාතික සමඟිය, සහජීවනය උදා කර ගත නොහැකි වී තිබේ.

වර්තමාන යහපාලන ආණ්ඩුවේ දේශපාලන උපක්‍රම සහ උපායමාර්ග දෙස බැලීමේ දී රට තුළ නැවත වරක් ජාතිවාදී ප්‍රවණතාවයන් ඉස්මතු වී තිබේ. විශේෂයෙන්ම උතුරේ දෙමළ දේශපාලන නායකයන් මෙන් ම දකුණේ සිංහල සහ මුස්ලිම් දේශපාලන නායකයන් විසින් සිදු කරනු ලබන ජාතිවාදී උසි ගැන්වීම් පාලනය කිරීමට හා ඒවා නැවැත්වීමට මෙම ආණ්ඩුවට ශක්තියක් නොමැති බව පෙනේ. එමෙන් ම, මෑතක දී සිංහල ජාතිවාදී කණ්ඩායම් වෙත අධිකරණ ක්‍රියාවලිවල දී යම් සහනදායී තීන්දු තීරණ ප්‍රකාශ වීමත් තුළින් රටේ ජනතාවට තේරුම් ගැනෙන්නේ නීතිය ක්‍රියාත්මක වීම හා එම අධිකරණ ක්‍රියාවලි සඳහා මෙම ජාතිවාදී කණ්ඩායම් වෙත යම් සහනශීලී ක්‍රියාමාර්ගයක් නීතිපති දෙපාර්තමේන්තුව මෙන් ම පොලිස් දෙපාර්තමේන්තුව ද ක්‍රියාත්මක කරන බවයි. එමෙන් ම, යහපාලන ආණ්ඩුව තුළ පවා සිටින විවිධ පාර්ශ්ව කිසිදු ඒකමතිකයකින් තොරව සිදු කරනු ලබන ජාතිවාදී ප්‍රකාශ (සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්වයන් තුනට අදාළ) තුළින් රට තුළ බරපතළ ජාතික අසමඟියක් ගොඩනැඟෙමින් පවතී.

කෙසේ වෙතත්, වසර 70ක කාලයක් දෙස ආපසු හැරී බැලීමේ දී ලංකාවේ දේශීය ධනපති පන්තිය විසින් සැබෑ ලෙස ජාතික ගැටලුව විසඳනවා වෙනුවට එය දිනෙන් දින උග්‍ර කරමින් හා එම ජාතිවාදී ප්‍රවණතාවයන් සිය පැවැත්ම සඳහා උපකාරී කර ගනිමින් සිටින බවට මනාව දක්නට ලැබේ. සැබෑ ලෙස රට තුළ ජාතික ප්‍රශ්නය විසඳීමට නම්, එක් ජාතියක් තවත් ජාතියක් සූරාකෑම නතර කිරීමට නම්, එක් මිනිසෙක් තව මිනිසෙකු සූරාකෑම නතර කළ යුතු වෙයි. පවතින ධනපති ක්‍රමවේදය තුළ මෙම සූරාකෑම මෙන් ම අසමානතාවය දිනෙන් දින වර්ධනය වනවා හැරෙන්නට එය අවසන් වන දිශාවකට ගමන් නොකරනු ලැබේ. මේ නිසා මෙම ජාතිවාදී ප්‍රවණතාවයන් පරාජය කිරීමත්, සැබෑ ලෙස ජාතික ප්‍රශ්නය විසඳීමටත් සැබෑ සමාජ වෙනසකට ඉක්මනින් යා යුතු වේ.

## රතුපැහැති කබායක්...

>>04 පිටුවෙන්



දියත් කළා. විශේෂයෙන් නාසීන් තම මතවාදය ජනතාව තුළ කා වැද්දීමට අධ්‍යාපනය භාවිතා කළා. අධ්‍යාපන පද්ධතිය මගින් තරුණයිගේ මොළ සෝදා ඔවුන්ව තම අරමුණ ඉටු කරගැනීමට මෙහෙයවනු ලැබුවා. විශේෂයෙන් 1933 සිට ගුරු වෘත්තියේ සිටින සියලු දෙනා නාසි ගුරු සංගමයේ සාමාජිකයින් වීම අනිවාර්යය කළා. 1936 වන විට නාසි ගුරු සංගමයේ සාමාජිකයින්ගෙන් 36% නාසි පක්ෂයේ සාමාජිකයින්ගෙන් සමන්විත වුණා. යුදෙව් ගුරුවරුන් ආර්යයන් නම් ශුද්ධවන්ත දරුවන්ට ඉගැන්වීමට නුසුදුසු ලෙස සලකා ඔවුන් ඉවත්වන ආකාරයට හිංසා කිරීමට කටයුතු යෙදුවා. 1942 වන විට සියලු යුදෙව් පාසල් ද තහනම් කරනු ලැබුවා. මෙහි අවසාන පියවර වුණේ යුදෙව්වන් සමූලඝාතනයයි.

දෙවන ලෝක යුද්ධ සමයේ දී නාසීන් විසින් යුදෙව්වන්ට අමතරව සෝවියට් දේශයේ වැසියන් මිලියන 2-3 පෝලන්ත වාර්ගිකයින් මිලියන 1.8 - 2, රොමානි වැසියන් 220,000 - මිලියන 1.5, ආබාධිතයින් 200,000 - 250,000, සමලිංගිකයින් 5,000 - 15,000 ත් අතර ප්‍රමාණයක් ඝාතනය කර තිබෙනවා.

මෙයාකාරයේ සමූල ඝාතන දෙවන ලෝක යුද්ධයෙන් පසුව විවිධ රටවල්වල සිදු වෙලා තිබෙනවා. දෙවන ලෝක යුද්ධයේ ම්ලේච්ඡත්වය ලෝක ජනතාවට උගන්නපු පාඩම වැඩක් වූණේ නැහැ. යුගොස්ලෝවියාව මෑතක රාජ්‍යයන් කිහිපයකට වෙන් වෙන අවස්ථාවේ සමූලඝාතන සිද්ධ කළා. රුවන්ඩාව, සුඩානය යන රටවලත් මෙහෙම සිද්ධ වුණා. ලෝකයේ බොහෝ රටවල්වල සිද්ධ වුණා සහ දැනටත් සිදු වෙමින් තියෙනවා. දෙවන ලෝක යුද්ධයේ දී ජාතිවාදයෙන් ආගම්වාදයෙන් ඇති තරම් බැට කාපු යුදෙව්වෝ විසින් බලහත්කාරයෙන් අත්කරගත් ඊශ්‍රාලයේ දී පලස්තීන ජාතිකයින්ට සලකන්නේ අන්ත අමානුශික ආකාරයට.

### රතු පැහැති කබායක් ඇඳි දියණිය

ජාතිය සහ ආගම වෙනුවෙන් අනිකාව විනාශ කරන්න අවශ්‍ය යැයි කියන ඒ වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාත්මක වන පුද්ගලයන් වෙන රටවල්වල වගේම අපේ රටේත් ඉන්නවා. තමන් නොවන අනෙක් ජාතීකත්වයන් ගැන අගතීන්ගෙන් යුක්ත ප්‍රකාශවල අවසාන ඉලක්කය අනෙකාව තුරන් කර දැමීමයි. පාලකයන් ජාතිය සහ ආගම තම පාලනයේ අවශ්‍යතාව වෙනුවෙන් භාවිතා කරද්දි ජාතිවාදියා හෝ ආගම්වාදියා සිතන්නේ තමන්ට ශුද්ධ වූ පියුමක් ලෙස විකසිත වීමට ඉඩ නොදෙන්නේ අනෙක් ජාතිය හෝ ආගමිකයන් බවයි. ෂින්ඩ්ලර්ස් ලිස්ට් චිත්‍රපටයේ කමාන්ඩර් ගොතේගෙන් නරූපණය වන නාසින් තමන්ට සතුටු වීමට ඇති අවස්ථාව අහිමි කර ඇති මේ යුදෙව්වා තමන්ගේ සතුට පැහැරගෙන වෙනම සතුටක් විඳින බව සිතා සිටිනවා. එ නිසා මේ නාසි ජාතිකයා උත්සාහ දරන්නේ යුදෙව්වාගෙන් ඒ සතුට ලබා ගැනීමටයි. ඒ සඳහා යුදෙව්වන් පීඩාවට පත්කර නාසින් ලබන්නේ විපරිත සතුටක්. ඔහු තම මෙහෙකාරකමට බඳවාගත් යුදෙව් ගැහැනිය තමාට ඇත්තටම ආදරය නොකරන්නෙ ඇයිද යන ගැටලුවේ වෙළී සිටීනවා. එය යුදෙව්වාගෙන් ලබාගත යුත්තක් නොව තමා තුළ වගා කරගත යුත්තක් නිසා එය තේරුම් නොගත් නාසි ජාතිකයාට කිසි දිනෙක පීඩිතයාගේ බුහුමන ආදරය ලබාගැනීමට හැකිවන්නේ නැහැ. යුදෙව්වන්ගේ ගෞරවය ලබාගෙන සිටින ෂින්ඩ්ලර්ට ඒ බුහුමන හිමිවූයේ රතු පැහැති කබායක් ඇඳි දියණිය නෙත ගැටීමෙන් පසු ජාතිවාදී ආගම්වාදී අමානුෂිකත්වය දැක ඊට එරෙහිව අති දුෂ්කර අවස්ථාවේ දී පවා මනුෂ්‍යත්වය වෙනුවෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය ජවය තමා තුළ ඇති කරගත් බැවිනි.

ඇතිපදම් ජාතිවාදී ආගම්වාදී අමානුෂිකත්වයක් මෙරටදී සැබෑවටම අත්දකින ඔබට රතු පැහැති කබායක් ඇඳි දියණිය මෙතෙක් ඇස නොගැටුණිද?

සිනමා විචාරක **කැළුම් ජයවීර**

රළ 2017 අගෝස්තු

කලාව

## මාක්ස්වාදී ඇසින්

# කලාව, කලාව සඳහාමද?

ධනවාදයේ බිහිවීමත් සමග කාලව අතු ඉතිලා වැඩෙන වෘක්ෂයක් බවට පත්වූ සැටි අපි කථා කළෙමු. ඒ සමගම කලාව පිළිබඳ, එහි කාර්යභාරය පිළිබඳ, එහි අයිතිය පිළිබඳ එකිනෙකට පරස්පර මතවාදයන්ද බිහිවිය. විවිධ වාදයන් හා ගුරුකුලයන්ද බිහිවිය. ධනවාදය යනු පංති ප්‍රතිවිරෝධතාවයන් එළිමහනට ගෙන ආ සමාජක්‍රමයකි. ඒ නිසාම ධනවාදය තුළදී විවිධ පංතීන්ට අයත් මතවාද කලාව තුළින්ද ප්‍රකාශ වන්නට විය. එහිදී මතුවූ එක් මතවාදයක් වුයේ කලාව, කලාව සඳහාය යන මතවාදයයි.

ධනවාදය බිහිවීමත් සමග පුනරුද සමයේ ආරම්භයත් සමග කලාකරුවා ඊට පෙර තිබූ වැඩවසම් ආධිපත්‍යයේ හා පල්ලියේ ආධිපත්‍යයෙන් නිදහස් විය. ඔහු 'නිදහසේ' නිර්මාණ කරන්නට විය. අඳුරු යුගය තුළ තහනම් කර තිබූ ප්‍රේමය ගැන, ස්ත්‍රී සිරුර ගැන, නිරුවත සහිත නිර්මාණ බිහිවිය. එහෙත් ඒ සමගම නව පාලක පංතිය වූ ධනපති පංතිය කලාව තම ආධිපත්‍යයට ගැනීමටද වෑයම් කළේය. කලාව ධනපති පංතියෙ ඍජු ආධිපත්‍යයට යට කිරීමට අකමැති වු කවීහු හා කලාකරුවෝ ඊට එරෙහි මතයක් නිර්මාණය කළහ. එය 'කලාව, කලාව සඳහාය' යනුවෙන් හඳුන්වන ලදී. ආරම්භක රොමැන්ටික්වාදී කලාකරුවෝ රැසක් මෙම මතය මත පිහිටා නිර්මාණකරණයේ හා අදහස් පළකිරීමේ යෙදුන අය වූහ. මෙම මතයේ ආරම්භකයින්සේ සැලකෙන්නේ ප්‍රංශයේ ජින් ජැක්විස් රූසෝ හා ජර්මනියේ ජොහෑන් ගොතේය. ඊට අමතරව ප්‍රංශයේ වික්ටර් හියුගෝ, ඇලෙක්සැන්ඩර් ඩූමා, ජර්මනියේ ෂිලර්, ඉතාලියේ ෂෙලි, රුසියාවේ පුෂ්කින්, එංගලන්තයේ ෂෙක්ශ්පියර් මෙම මතය දැරූ අය ලෙස සලකනු ලැබීය. මේ පිළිබඳව එක්සත් ජනපදයේ කවියෙකු වු එඩ්ගා ඇලන්පෝ මෙසේ පවසා තිබේ. "කාව්‍ය තරම් අති උත්කෘෂ්ටවූත්, අතිශය උදාරවුත් අන්‍යතර වස්තුවක් මේ මිහිපිට නොමැති බව අපට නොපමාව ඒත්තු යනු ඇත. මෙ කාව්‍ය, කාව්‍යයක් මිස අන් කිසිවක් නොවේ. මේ කාව්‍ය ලියා ඇත්තේ කාව්‍යය උදෙසාමය." කලාරුවා සමාජයෙන් වියුක්තව කලාකරුවන් සඳහා කලාව සඳහා කල නිර්මාණ කරන කෙනෙක් ලෙස ඉන් ප්‍රකාශයට පත්විය.

කලාව, කලාව සඳහාය යන මතය ආරම්භයේදී ධනපති පාලනයේ ආධිපත්‍යයට එරෙහිව ආරම්භ වූවක් වුවත් එය දිගට පැවතෙද්දී ප්‍රතිගාමී මතයක් බවට පත්විය. මන්ද කලාව ජනතාවගෙන් ඉවත් කිරීමට එය හේතුවු බැවිනි. "කලාවට දේශපාලනය එපා" යන වර්තමානයේ පවා පවතින මතයට ආරම්භක පදනම සකස් වුයේද කලාව, කලාව සඳහාය යන මතයෙනි. එහෙත් ඉතාම පැහැදිලිව කලාවට දේශපාලනයෙන් වියුක්තව සිටිය නොහැකිය. කලාව හා ජනතාව අතර විශාල සම්බන්ධයක් පවතින අතර එය නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ප්‍රතිගාමී වුවමනා ඉටුකරන්නක්ද විය.

කෙසේවෙතත් ඉක්මනින්ම ධනවාදය තුළ මෙයට අභියෝග එල්ල විය. යථාර්ථවාදී කලාවක් පිළිබඳ, කලාව තුළින් යථාර්ථවාදය පිළිබිඹු විය යුතුය යන්න පිළිබඳ මත පළවිය. ඒ අනුව යථාර්ථවාදය නම් ප්‍රවණතාවය 19වැනි සියවසේ මැද භාගය වනවිට මතුවිය. මෙය වැඩිපුර මතුවූයේ සාහිත්‍ය ක්ෂේත්‍රය පදනම්කර ගෙනය. යථාර්ථවාදය ගරුකළ කලාකරුවන් ලෙස රුසියාවේ ලියෝ ටෝල්ස්ටෝයි, ඇන්ටන් චෙකොෆ්, නිකොලොයි ගොගොල්, ප්‍රංශයේ බල්සාක්, ගීදමෝපසං, ස්ටැන්දාල්, එක්සත් ජනපදයේ මාක් ට්වේන් එංගලන්තයේ ජෝර්ජ් එලියට්, චාල්ස් ඩිකන්ස් ප්‍රමුඛ හා ප්‍රසිද්ධ අය වූහ.

රුසියාව තුළ පැන නැගුන යථාර්ථවාදය අන් රටවලට ද බලපෑමක් ඇතිකළ එකක් විය. විශේෂයෙන්ම 19වැනි සියවසේ මුල් භාගයේ ජීවත්වූ රුසියානු කලා විචාරකයින් වු බෙලින්ස්කි, චර්නිෂෙව්න්කි හා දොබ්රල්යුබොව් වැන්නන්ගේ බලපෑම සාහිත්‍ය කලාව තුළ යථාර්ථවාදය තහවුරුවීමට හේතුවිය. හංගේරියානු ජාතික ප්‍රවීන මාක්ස්වාදී විචාරකයෙකු ලෙස සැලකෙන ජෝර්ජ් ලුකාෂ් ඉහත රුසියානු චින්තකයන් පිළිබඳ පළකළ සඳහනක මෙසේ විය. "දැනුවත්ව හෝ නොදැනුවත්ව 'කලාව, කලාව සඳහාය' යන සංකල්පය අගේකොට සැලකුවාවූ සමකාලීන සෞන්දර්යවාදී විචාරකයින් සමග බෙලින්ස්කි, චෙර්නිෂෙව්න්කි, දොබ්රල්යුබෝව් යන තිදෙනා දැඩි සටනක නියැළුනෝය. එකී සෞන්දර්යවාදීහු කලාත්මක පරිසමාප්තිය පිළිබඳ චින්තනය සමාජ තත්වයේ යථාර්ථ නිරූපනයෙන් වෙන් කොට සැලකීමටත්, සාහිත්‍යකලා, සමාජ අරගලයෙන් පරිබාහිර, එයින් නොකෙළසුව මනා වස්තූන් ලෙස සැලකීමටත් යත්න දැරූහ. මේ මතවලට පටහැණිව යමින්, මොවුන් තිදෙනා සාහිත්‍යයත්, සමාජයත් අතර පවත්නා සම්බන්ධය කෙරෙහි විශේෂ අවධානය යොමු කළෝය. කලාත්මක සුන්දරත්වයේ නිර්නායකය ජීවිතය මිස අනෙකක් නොවන බව මොව්හු සැලකූහ. මොවුන් සිතුවේ කලාව, ජීවිතය පදනම් කරගෙන, ජීවිතයම නිර්මාණාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙන් පහළ වන්නක් බවයි. කලාත්මක පරිසමාප්තියේ නියම මාපකය වනාහී මෙම ප්‍රතිනිර්මාණය අතින් පෙනෙන ගැඹුර සහ සත්‍යතාවය බව ඔවුන්ගේ මතය විය."

මේ අතර 1848 මාක්ස්-එංගල්ස් විසින් රචිත කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය එළිදැකීමත් සමග එය කලා විචාර ක්ෂේත්‍රයට විශාල බලපෑමක් කළේය. යථාර්ථවාදයට, විවේචනාත්මක යථාර්ථවාදයට ඉන් විශාල මගපෙන්වීමක් ලැබුණි. පසුකලෙක සෝවියට් දේශය තුළ සමාජ සත්තා යථාර්ථවාදයට මග පෙන්වනු ලැබුවේද මාක්ස්වාදී අදහස්ය.

කෙසේ වෙතත් කලාව හා දේශපාලනය අතර සම්බන්ධය මෙන්ම කලාවට දේශපාලනය එපා යන අදහසද සමාජයේ තවමත් පවතී. එබැවින් කලාව අදේශපාලනිකද, කලාවට දේශපාලනය එපාද, කලාවේ කාර්ය කුමක්ද වැනි ගැටලු කීපයකට විසඳුම් සොයා ගැනීමට අපට සිදුවී තිබේ. ලෝකය තුළ දේශපාලනය කිරීමේ ඍජු මාධ්‍ය වන්නේ කලාව නොවේ. දේශපාලනය කිරීමේ ඍජු මාධ්‍ය දේශපාලන පක්ෂ හා දේශපාලන ව්‍යාපාර වේ. එහෙත් කලාවද එයට සම්බන්ධය. කලාව හා දේශපාලනය අතර ඇති සම්බන්ධය පිළිබඳ මීළඟට කථාකරමු.

# රතුපැහැති කබායක් ඇඳි දියණිය දුටු ඔස්කාර් ෂින්ඩ්ලර්ස්



ඔස්කාර් ෂින්ඩ්ලර් (Oskar Schindler) විසින් යුදෙව්වන් 1200 ක් නාසින්ගේ ඝාතනයට ලක්වීමෙන් බේරාගැනීම පදනම් කරගෙන ඕස්ට්‍රේලියානු ජාතික නවකතාකරුවකු වන තෝමස් කෙනලි (Thomas Keneally) විසින් ලියන ලද ෂින්ඩ්ලර් ආර්ක් 1982 (Schindler's Ark published in the United States as Schindlers List) නමැති නවකථාව පාදක කරගෙන ෂින්ඩ්ලර්ස් ලිස්ට් චිත්‍රපටය අධ්‍යක්ෂණය කර තිබෙන්නේ ස්ටීවන් ස්පිල්බර්ග් (Steven Spielberg) විසින්. 1993 වර්ෂයේ තිරගත වීම ආරම්භ කළ ෂින්ඩ්ලර්ස් ලිස්ට් චිත්‍රපටය ඔස්කාර් සම්මාන 7ක් සහ තවත් සම්මාන රැසක් හිමිකරගෙන අලෙවි ආදායම් වාර්තා තැබීමටද සමත් වි තිබෙනවා.

## කතා සාරාංශය

ඔස්කාර් ෂින්ඩ්ලර් දෙවන ලෝක යුද්ධ සමයේ දී තමන්ගේ ව්‍යාපාරික වාසනාව උරගා බැලීමට එවකට ජර්මන් නාසි පාලනය යටතේ යුදෙව්වන් ගාල් කර තැබූ පෝලන්තයේ ක්‍රකෝව් (Cracow) නගරයට පැමිණෙන නාසි පක්ෂයේ සාමාජිකයෙක්. එහිදී එස් එස් නිලධාරීන්ට අල්ලස් ලබා දී තම ව්‍යාපාරය කරගෙන යන ෂින්ඩ්ලර් යුද අනාථයන් බවට පත් වී සිටින යුදෙව්වන්ට අඩු වැටුපක් ලබා දී තම කම්හලේ සේවයට යොදවා ගන්නවා. මේ අතර ප්ලාසොව් කම්කරු කඳවුර (Plaszow labor camp in Poland) ඉදිකිරීමට එස් එස් හමුදාවේ කමාන්ඩර්වරයකු වන අමොන් ගෝත් (mon Goeth) ක්‍රකෝව් නගරයට පැමිණෙනවා. කඳවුර ඉදිකිරීම අවසානයේ පිටතින් යුදෙව්වන් ගෙන ඒම සඳහා යුදෙව් කඳවුරු හිස් කිරීම ආරම්භ කරන්නේ කඳවුර සිටින දුර්වල යුදෙව්වන් මරා දැමීමෙන්. මෙම සිදුවීම දකින ෂින්ඩ්ලර් මෙතෙක් සිටි ස්ථාවරය වෙනස් වන්නේ රතු පැහැති කබායක් ඇඳ පාරේ දුවන කුඩා දැරියක් දකීමෙන්.

ඒ අතරම ෂින්ඩ්ලර් දකිනවා කමාන්ඩර් අමොන් ගෝත්ගේ මෙහෙයවීමෙන් නාසීන් විසින් යුදෙව්වන්ව ඔවුන්ගේ කඳවුරුවලින් ගෙවල් දොරවල්වලින් එළියට ඇද දානවා. ඔවුන්ට තියෙන්නේ ඇඳගෙන ඉන්න ඇඳුම් විතරයි. ඔවුන් සතු සියල්ල ම පැහැර ගන්නවා. දරුවන් දෙමාපියන්ගෙන් වෙන් කරනවා. පිරිමින් ගැහැණුන්ගෙන් වෙන් කරනවා. යුදෙව්වන්ට ඇඳුම් ගලවපියව් කිව්වම ගලවන්න ඕනි. පෝලිමේ පලයව් කිව්වම යන්න ඕනි. කෝච්චියට නැගපියව් කිව්වම නගින්න ඕනි. බැහැපියව් කිව්වම බහින්න ඕනි. නාසි එස්.එස්. භටයන් කියන දේ හරියට නොකළොත් ඒ වෙලාවෙම වෙඩි තියලා මරනවා. කියන විදිහටම කළත් මරණවා. මරන්නේ නැත්තේ කොහොම හිටියමද කියලා යුදෙව්වා දන්නේ නැහැ.

එතැන් පටන් තමන් යටතේ සේවයේ නිරතවන යුදෙව්වන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටින ෂින්ඩ්ලර් ඒ සඳහා ගොත් ඇතුළු එස් එස් නිලධාරීන්ට හා භටයන්ට අල්ලස් ලබා දෙනවා. මේ අතර ජර්මනිය යුද්ධයෙන් පරාජය වන ලකුණු පෙණෙන විට නාසි පාලනය විසින් පසෝව් නගරයේ සිටින යුදෙව්වන් අවුශ්විට්ස් (Auschwitz) වධකාගාරය වෙත රැගෙන යාමට තීරණය කරනවා. මෙහිදී එස් එස් නිලධාරී ගොතේ හමුවන ෂින්ඩ්ලර් තමන් උපන් නගරයේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා තමන්ගේ සේවකයින් ගෙන යාමට අවසර ඉල්ලනවා. ඒ සඳහා ෂින්ඩ්ලර් එක් යුදෙව්වෙක් වෙනුවෙන් යම් මුදලක් වන පරිදි තමන් සතු මුදල් අල්ලස් ලෙස ලබා දී යුදෙව්වන් ලැයිස්තුවක් සකස් කර ගන්නවා. එසේ බේරා ගත් පිරිස තම නගරයට ගෙන යන අතර කාන්තාවන් සහ ළමයින් රැගත් දුම්රිය වැරදීමකින් අවුශ්විට්ස් කඳවුර වෙත යැවෙනවා. ඔවුන් අවසාන මොහොතේ ගෑස් නෑම මගින් මරණයට පත්වීමෙන් ගළවාගත හැකි වන්නේ ෂින්ඩ්ලර් විසින් තමන් සතු දියමන්ති එම කඳවුර භාර නිලධාරීයාට ලබා දීමෙන්.

යුද්ධයෙන් ජර්මනිය පරාජය වී රුසියානු රතු හමුදාව පැමිණෙන බැවින් පලායාමට ප්‍රථම මෙම යුදෙව්වන් පිරිස මරා දමා යන ලෙස එස් එස් භටයින්ට නියෝගයක් ලැබෙනවා. මේ අවස්ථාවේ ෂින්ඩ්ලර් විසින් එස් එස් භටයන් අමතා තමන්ගේ දරු පවුල් බලන්න යන්නේ මිනීමරුවන් විදිහට ද නැත්නම් නියම මිනිසුන් ලෙසද ලෙස තීරණය කරන ලෙස පවසනවා. ඔවුන් මිනිසුන් ලෙස තම දරු පවුල් බලා ගම් බිම් වෙත පිටත් වෙනවා. අවසානයේ රතු හමුදාව පැමිණීමට පෙර පිටත්ව යන ෂින්ඩ්ලර්ට යුදෙව්වන් විසින් තමන් සතුව පැවති අවසන් රන් ස්වල්පය එකතු කර සැදූ මුද්දක් තිළිණ කරනවා. එහි සඳහන් වන්නේ, යමෙක් එක් ජීවිතයක් මරණයෙන් බේරා ගත්තා යනු මුළු ලෝකයම බේරා ගත්තා හා සමාන වේ යනුවෙන්.

## සමූල ඝාතන

ජාතිය හෝ ආගම පදනම් කරගෙන මිනිසුන් සමූලඝාතනය කළ අවස්ථා රාශියක් ලෝක ඉතිහාසයේ සිදු වෙලා තියෙනවා. ඒ අතරින් දෙවන ලෝක යුද සමයේ නාසි ජර්මනිය විසින් සිදු කළ සමූල ඝාතන සංඛ්‍යාත්මකව අති විශාලයි. දෙවන ලෝක යුද්ධ සමයේ මේ විදිහට යුදෙව්වෝ මිලියන 4.2 ත් 6 ත් අතර ප්‍රමාණයක් සමූල ඝාතනය කර තිබෙනවා. මේ යුදෙව්වන් ඉවත්කිරීමේ ක්‍රියාවලිය තුළ යුරෝපය තුළ ජීවත්ව සිටි මිලියන 1.6 ක් වු යුදෙව් ළදරුවන් සහ ළමයින්ගෙන් දෙවන ලෝක යුද්ධය අවසානයේ දිවි ගළවාගන තිබුණේ 11% ක් ප්‍රමාණයක් පමණයි. හිට්ලර් විසින් ආර්ය ජාතිය උසස් බවත් එහි ශුද්ධභාවය රැකගැනීම සඳහා අනෙකුත් ආර්ය නොවන සියලූ ජාතීන් පහත් ජාතීන් ලෙස නම් කොට එම ජාතීන් ශුද්ධ කර දැමිය යුතු බවත් විශ්වාස කර ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වුණා. ඒ සඳහා නාසින් විසින් දිගු කාලයක සිට යුදෙව්වන්ට එරෙහිව යුදෙව්වන් හෙලා දකින ආකාරයේ ප්‍රචාරක යාන්ත්‍රණයක්

03 පිටුවට>>>